කලාපය 01, දෙසැම්බර් 2019
Issue No. 01, December 2019

# ළමා ආරක්ෂණය පිළිබඳ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

# Child Protection Journal

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළමා ආරක්ෂණය පිළිබඳ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය

# Child Protection Journal

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**National Child Protection Authority**

ළමා ආරක්ෂණය පිළිබඳ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය
Child Protection Journal

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
National Child Protection Authority

ප්‍රථම මුද්‍රණය First Print : 2019

National Library and Documentation Services Board

| | | |
|---|---|---|
| Title | - | Child Protection Journal |
| ISSN | - | ISSN 2714-1748 |
| ISBN | - | 9 772714174001 |


## මාර්ගෝපදේශකත්වය

නීතිඥ එච්.එම්. අබයරත්න, සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
නීතිඥ සුජාතා කුලතුංග, නියෝජ්‍ය සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
අනෝමා සිරිවර්ධන, අධ්‍යක්ෂ ජනරාල්, , ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## අනුශාසකත්වය

ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## සම්පාදක මණ්ඩලය

දිමුතු ගලප්පත්ති, සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
රසික හැගොඩ, පර්යේෂණ හා සුබසාධන නිලධාරී, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
නිල්මිණී විජේරත්න, සැලසුම් හා නියාමන නිලධාරී, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## සම්බන්ධීකරණය

සචිනි අසංකා කටුවාවල, පුස්තකාලයාධිපති, තොරතුරු හා මාධ්‍ය ඒකකය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## පිටු සැකැස්ම හා ආකෘතිය

සචිනි ගයනිකා වීරමන්, කළමනාකරණ සහකාර, තොරතුරු හා මාධ්‍ය ඒකකය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## මුද්‍රණය

ඉමාෂි ප්‍රකාශන

## ප්‍රකාශනය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

★ මෙම ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයෙහි ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ලිපිවල කර්තෘවරුන් සතුය.

# සම්පාදක සටහන

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනතේ ප්‍රතිපාදන පරිදි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවූ විය. ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජන හේතු කොට වින්දිත භාවයට පත් වන්නා වූ ළමයින්ගේ ආරක්ෂාව හා ප්‍රතිකාර කිරීම මෙන්ම සියලු ළමයින් සඳහා ළමා අපයෝජනයන් වැළැක්වීම සඳහා අවශ්‍ය කාර්ය භාරයන් ඉටු කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අභිමතාර්ථය වේ. මෙහිදී වින්දිත ළමයින් ප්‍රධාන වර්ගීකරණයන් හතරක් යටතේ හඳුනා ගැනීම සිදු කරයි. එනම් අනාරක්ෂිත (Vulnerable), අවදානම් (At-risk), ආන්තික (Marginalize) හා ඇස නොගැටෙන (Invisible) ළමයින් ලෙස වේ.

ළමා ආරක්ෂණයේ දී වැදගත් ම වන්නේ සාක්ෂි මත පදනම් වූ ළමා හිතකාමී ඒකාබද්ධ ප්‍රවේශයන් ඔස්සේ සියලුම පාර්ශවකරුවන් විසින් තම කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය උචිත පියවර ගැනීමයි. ළමයාගේ උපරිම යහපත තහවුරු කිරීම සඳහා කරනු ලබන කාර්යයන් පිළිබඳ සමාජයේ පවතින්නා වූ ගැටලු කවරාකාරදැයි හඳුනා ගැනීම වැදගත් වේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය පළ කිරීමෙන් අපේක්ෂා කරනුයේ ළමා ආරක්ෂාව සඳහා යොදා ගත හැකි පර්යේෂණ සමාජ ගත කිරීමයි. විවිධ විෂයන් ඔස්සේ ළමා ආරක්ෂාව පිළිබඳ කෙරුණු පර්යේෂණයන් හා අධ්‍යයනයන් පිළිබඳ සංක්ෂිප්ත සටහන් ඉදිරිපත් කිරීමෙන් මේ වන විට අවශ්‍ය වන්නාවූ ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් පවතින්නා වූ දැනුම පද්ධතිය විධිමත් හා සංවිධානාත්මක අරමුණක් කරා මෙහෙය වීම සිදු කළ හැක.

මෙම පර්යේෂණ ග්‍රන්ථය සකස් කිරීමේදී, තම පර්යේෂණයන්ගේ හා අධ්‍යනයන්ගේ සංක්ෂිප්ත ලිපි ලබා දුන් සියලු පර්යේෂකයන්ට සම්පාදක මණ්ඩලය ලෙස අපි කෘතඥ පූර්වක වෙමු. තම දැනුම අන්‍යයන් සමඟ නිර්ලෝභීව බෙදා ගැනීමෙන් ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාව වෙනුවෙන් ඔවුන් සිදු කළ මෙහෙය අගය කරමු.

සම්පාදක මණ්ඩලය

# Editorial Note

The National Child Protection Authority was established in terms of the provisions of the National Child Protection Authority Act No. 50 of 1998. The purpose of the National Child Protection Authority is to protect and treat children who are victims of child abuse in Sri Lanka and to prevent child abuse for all children.

The victims are identified under four main categories. They are vulnerable, At-risk, marginalize and invisible children in society.

What is most important in child protection is that all stakeholders take appropriate steps to fulfil their roles through evidence-based integrated child-friendly approaches. In order to ensure the best interests of the child, it is important to identify the social issues that are involved in their lives.

The National Child Protection Authority expects to publish research articles on child protection with this child protection journal. Presentations on child protection research and studies on a variety of subjects can be used to guide the present system of child protection, which is needed, to a critical and organizational purpose.

As the Compilation Committee, we are grateful to all the researchers who provided abstract articles of their research and studies for the preparation of this research book. We appreciate their contribution to child protection in Sri Lanka by sharing their knowledge with others.

Compilation Committee

# පටුන - Contents


පිටුව Page

සම්පාදක සටහන - Editorial Note — I – II

පටුන - Contents — III – IV

**මුද්‍රිත මාධ්‍ය මගින් ළමා අපයෝජන වාර්තාකරණයේදී ඡායාරූප භාවිතයේ ස්වභාවය** — 01 - 10

**ධනුෂ්ක නුවන් සේනාරත්න**
ශාස්ත්‍රවේදී (ගෞරව) ප්‍රතිබිම්බ කලා (දෙවන පෙළ ඉහළ), කැලණිය විශ්වවිද්‍යාලය.
ශාස්ත්‍රපති (ජනසන්නිවේදනය), කැලණිය විශ්වවිද්‍යාලය.
සැලසුම් සහකාර, සැලසුම් හා නියාමන ඒකකය,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**Research on children subjected to harassments in Schools (Based on the complaints reported to the National Child Protection Authority 1929 Child Help in 2017)** — 11 - 17

**Senaka Sudusinghe**
B.A (Hons) in Psychology (1st Class), University of Peradeniya.
Assistant Counselor, Psychosocial Unit,
National Child Protection Authority

**මානව ප්‍රතිශක්තිකරණ ඌණතා වෛරසය (HIV) ආසාදිත, දෙමාපියන්ගේ පවුල් වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන සමාජීය හේතු පිළිබඳ විග්‍රහයක්** — 18 - 26

**එම්.කාංචනා සුබසිංහ**
ශාස්ත්‍රවේදී (ගෞරව) සමාජ විද්‍යාව (දෙවන පෙළ ඉහළ), කැලණිය විශ්ව විද්‍යාලය.
ශාස්ත්‍රපති (සමාජ විද්‍යාව), කැලණිය විශ්වවිද්‍යාලය.
ළමා ආරක්ෂාව සහ අයිතීන් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, කොළඹ විශ්ව විද්‍යාලය.
උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව, ජාතික සමාජ සංවර්ධන ආයතනය.
දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී, කුරුණෑගල දිස්ත්‍රික්කය,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වීඩියෝ සාක්ෂි ක්‍රියාවලිය තුළ මානව හා භෞතික සම්පත් භාවිතා වන ආකාරය පිළිබඳ අධ්‍යයනය** — 27 - 30

**කුමුදුමාලි මද්දුමගේ**
ශාස්ත්‍රවේදී (විශේෂ) ජනසන්නිවේදනය, කැලණිය විශ්වවිද්‍යාලය.
සාක්ෂි පටිගත කිරීමේ සහකාර, නීති අංශය,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**A comprehensive study on awareness of the public on laws in Sri Lanka of social media news reporting on child related cases.** 31 - 37

**Sachini Gayanika Weeraman**
B.A in Social Sciences (Communication Studies)
English Medium, The Open University of Sri Lanka.
Management Assistant, Information and Media Unit,
National Child Protection Authority.

**ශ්‍රී ලංකාවේ ළමා අපයොජන වාර්තාකරණය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්**

පර්යේෂණ අධිකාරිය : ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 38 - 44

පර්යේෂණ ආයතනය : Businesscontact (PVT) LTD

ඉදිරිපත් කිරීම : **තෙරන්ද නුවන් චන්ද්‍රසේකර**
ශාස්ත්‍රවේදී, කැලණිය විශ්ව විද්‍යාලය.
ශාස්ත්‍රපති (ජනසන්නිවේදනය), කැලණිය විශ්වවිද්‍යාලය.
ලේඛකත්ව හා සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව, කොළඹ විශ්වවිද්‍යාලය.
මාධ්‍ය සහකාර, තොරතුරු හා මාධ්‍ය ඒකකය,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

**Study on child disciplinary methods practiced in schools in Sri Lanka**

This research study for National Child Protection Authority was carried out by the following research group. (01) Vidya Jyothi Prof. Harendra de Silva *(MBBS, DCH, MSc, MRCP), Professor and Consultant Pediatrician* (02) Prof. Upul Senarath *(MBBS, MSc, MD - Com Med), Professor and Consultant Community Physician* (03) Prof. Piyanjali de Zoysa *(PhD, MA - Applied Psychology, BA - Psychology- Hons), Professor and Clinical Psychologist* (04) Dr. Manuj C. Weerasinghe, *(MBBS, MSc, MD - Com Med), Expert in Qualitative Research and Consultant Community Physician.* 45 - 54

Compiled By:
**Rasika Hegoda Arachchi**
B.A (Hons) Geography, University of Colombo.
M.A, University of Kelaniya, Sri Lanka.
Research and Welfare Officer, Programme Unit,
National Child Protection Authority.

# මුද්‍රිත මාධ්‍ය මගින් ළමා අපයෝජන වාර්තාකරණයේදී ඡායාරූප භාවිතයේ ස්වභාවය

ධනුෂ්ක සේනාරත්න

dhanushka.senarathna37@gmail.com

**සංක්ෂිප්තය**

මුද්‍රිත මාධ්‍ය මගින් ළමා අපයෝජන වාර්තාකරණයේ දී ඡායාරූප භාවිතයේ ස්වභාවය නැමති මෙම පර්යේෂණය පුරා අධ්‍යනයට ලක්වී ඇත්තේ වර්තමානය වන විට ළමා අපයෝජන වාර්තාකරනය පිළිබඳව මුද්‍රිත මාධ්‍යයන් මගින් සිදු කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳව අධ්‍යනයන් සිදු කිරීම සහ ඒ සමග ඡායාරූප යොදාගැනීම මගින් අපයෝජන වාර්තාකරණයේදී සිදුවන සමාජීය බලපෑම යහපත් අයහපත් ලක්ෂණ මොනවාද යන්න පිළිබඳ සොයා බැලීමයි වර්තමානය වන විට සිදුව ඇති තාක්ෂණික පෙරලියත් සමග ඡායාරූප කලාව ඉතා ඉක්මනින් දියුණු වෙමින් පවතින අතර 1827 වර්ෂයේදී ආරම්භ කරන ලද ඡායාරූප කලාව වර්තමානය වන විට ජන ජීවිතයේ නැතුවම බැරි අංගයක් බවට පත්ව ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ දී මුද්‍රිත මාධ්‍ය හරහා වාර්තාකරණයේ දී එම විස්තරය වඩාත් විශ්වාසනීය පුවතක් බවට පත් කිරීම සඳහා බොහෝ දුරට ඡායාරූප යොදාගැනීම සිදු කරනු ලබයි.

විශේෂයෙන් මෙම පර්යේෂණය තුළ ළමා අපයෝජන වාර්තාකරණය තුළ දී මුද්‍රිත මාධ්‍යයෙන් ළමා අපයෝජන වාර්තාකරණයේ දී ඡායරූප යොදාගන්න ආකාරය සහ එසේ යොදාගැනීම තුළින් අදාළ වින්දිත දරුවන්ට සිදුවන්නේ යහපතක්ද අයහපතක්ද යන්න විමසා බැලීමට මෙම පර්යේෂණය මගින් ඉඩ කඩ විවර වේ. 2009 වර්ෂයෙන් පසුව 30 වසරක් යුද්ධය නිමා වීමෙන් පසුව විශේෂයෙන් මාධ්‍යවේදීන්ට පළ කිරීම සඳහා පුවෘත්ති හිඟයක් ඇති විය. ඔවුන්ගේ ඊළඟ උපක්‍රමය වූයේ ළමා අපයෝජන වාර්තාකරණය මගින් තම පුවත්පතට ජනප්‍රියතාවය ලබා ගැනීමයි . එසේ ලබා ගැනීම තුළින් තමන්ගේ පුවත්පත මහජනතාව අතරට යැවීම සහ ඒ තුළින් අනෙකුත් පුවත්පත්වලට වඩා ආදායමක් ලබා ගැනීමටයි. එසේම ඒ සඳහා ඡායාරූප යොදාගනිමින් වඩාත් ආකර්ෂණීය ලෙස ඉදිරිපත් කරමින් තවත් ජනප්‍රියතාවය වර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් සිටි.

මෙම පර්යේෂණය තුළ ළමා අපයෝජනය යන්න කුමක්ද යන්න විස්තරාත්මක්ව සාකච්ඡා කිරීම සහ සිදු කරනු ලබන අතර ළමා අපයෝජන පිළිබඳ පුවත් වාර්තාකරණය පිළිබඳව අධ්‍යයනය සිදු කරනු ලබයි. ලංකාවේ වර්තමානය වන විට පුවත්පත් 42 ක් පමණ ඇති අතර, ඒවායින් පුවත්පත් කිහිපයක ළමා අපයෝජන වාර්තාකරණයන් සිදු කර ඇති සිද්ධි කිහිපයක් ඡායාරූප සමග වාර්තාකරණය සිදු කර ඇති ආකාරය මෙම පර්යේෂණය තුළ සවිස්තරාත්මකව කතා බහ කරනු ලැබේ. මෙම පර්යේෂණය තුළ සාහිත්‍ය අධ්‍යයනය සම්මුඛ පරීක්ෂණ ක්‍රම යනාදිය යොදාගත්තද මෙහි වැඩි අවධානයක් යොමු කර ඇත්තේ සිද්ධි අධ්‍යයනය වෙතයි මෙම ගැටලුව වඩාත් ප්‍රායෝගික ගැටලුවක් බැවින් එසේ වැඩි අවධානයක් යොමු කිරීමට සිතුවෙමි. ඒ තුළින් ප්‍රයෝගික තත්ත්වය පිළිබඳව සැබෑ තත්ත්වය අවබෝධ කරගතහැකි බව විශ්වාස කරමි.

එමෙන්ම එම වාර්තාකරණය තුළ අදාළ වින්දිත දරුවාට සිදුවන අයහපත් ප්‍රතිඵල හා යහපත් ප්‍රතිඵල මොනවාද? යන්නත් එමෙන්ම ඒ තුළින් යම් අයහපත් ප්‍රතිඵලයක් ඇති වන්නේනම් ඒවා මගහැර ගන්නේ කෙසේද? එසේම ඒවා වැළැක්වීමට රාජ්‍ය අංශය ලෙස මැදිහත් වන්නේ කෙසේද කුමන ආයතනද යනාදී කරුණු රැසක් මෙම පර්යේෂණය මගින් ආවරණය කෙරේ.

**ප්‍රමුඛ පද**

ළමා අපයෝජන, මුද්‍රිත මාධ්‍යය, ඡායාරූපකලාව, වාර්තාකරණය වින්දිත

## අධ්‍යයනයේ අරමුණු

### ප්‍රධාන අරමුණ

ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ ළමා අපයෝජන වාර්තාකරණයේ දී මාධ්‍ය සදාචාරයන්ට අනුකූල ඡායාරූප යොදාගන්නේ කෙසේද? යන්න සොයාබැලීම

### උප අරමුණු

- ළමා අපයෝජනයක් යනු කුමක්ද? යන්න හඳුනාගැනීම
- මුද්‍රිත මාධ්‍යයයන් හරහා ළමා අපයෝජන වාර්තාකරණය තුළින් ළමා අපයෝජන සිදුවන ප්‍රවණතාවයේ වර්ධනය වීමක් සිදුවන්නේද? යන්න සොයාබැලීම.
- ළමා අපයෝජන වාර්තාකරණයේ දී ඡායාරූප යොදාගැනීම හා පවතින නෛතික සීමාවන් කවරේද? යන්න හඳුනාගැනීම.
- ළමා අපයෝජන වාර්තාකරණයේදී ඡායාරූප අනිසි ලෙස යොදාගැනීම නිසා අපයෝජනයට පත් වින්දිත දරුවන් නැවත වරක් අපයෝජනයට පත් වන්නේද? යන්න විමසා බැලීම.
- එමෙන්ම මුද්‍රිත මාධ්‍යයන් හරහා ළමා අපයෝජන වාර්තාකරණයේ දී වින්දිත දරුවන් නැවත වරක් අපයෝජනයට පත් නොවන අයුරින් වාර්තා කිරීමට ඡායාරූප භාවිතා කළ හැක්කේ කෙසේද? යන්න සොයා බලා ඒ පිළිබඳව නව යෝජනා ඉදිරිපත් කිරීම.

### සාහිත්‍ය විමර්ෂණය

"ළමා අපයෝජනය" යනු ඉතා සංවේදී විෂයකි. මෙම ළමා අපයෝජන වර්තමානයේදී පමණක් සිදුවන්නක් නොවේ. මෙකී අපයෝජන බුද්ධ කාලීන භාරතයේ පවා සිදුවිය. උදාහරණ වශයෙන් සුනීතගේ හා සෝපාකගේ කතා ප්‍රවෘත්තීන්ද ගෙනහැර දැක්විය හැකිය. කෙසේ නමුත් වත්මන් සමාජ වපසරිය තුළ ළමා අපයෝජන පිළිබඳව වැඩි කතාබහක් ඇතිව ඇත. විශේෂයෙන් ළමයා නැමති මිනිසාගේ ආරම්භක අවධිය නවීන විද්‍යාව අනුව ඉතා සුපරීක්ෂාකාරීව සංවර්ධනය කළ යුතුව ඇති බව පෙනී යයි. ළමා සංවර්ධනය, අධ්‍යාපන මනෝවිද්‍යාව ආදී අංශයන් මෙලොව ජීවත්වන සෑම ළමයෙකුටම එක හා සමාන ලෙස බලපායි. එම අංශ ළමා අපයෝජන පිළිබඳ නීති සැකසීම සඳහාද පදනම් වී ඇත. කෙසේ වෙතත් ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ළමා අපයෝජනය යනු කුමක්ද? පිළිබඳව පොදුවේ පිළිගත හැකි නිර්වචනයක් 1999 වර්ෂයේදී ඉදිරිපත් කර ඇත. ඒ පහත අයුරිනි.

> "Child abuse or maltreatment constitutes all forms of physical and/or emotional ill treatment, sexual abuse, neglect or negligent treatment or commercial or other exploitation, resulting in actual or potential harm to the child's health, survival, development or dignity in the context of a relationship of responsibility, trust or power"
>
> ලෝක සෞඛ්‍ය සංවිධානය,1999

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉදිරිපත් කර තිබෙන මෙම නිර්වචනය මගින් "ළමා අපයෝජනය" පිළිබඳව පුළුල් විග්‍රහයක් දක්වා ඇති බව පිළිගත් මතය වේ. එමගින් දක්වන්නේ,

> "කායිකව හෝ මානසිකව ළමයාට සිදුකරන්නා වූ සියලුම ආකාරයේ නොමනා ක්‍රියා, ලිංගික අපයෝජනය, නොසලකා හැරීම හෝ නොසැලකිලිමත් ලෙස සැලකීම හෝ වාණිජමය හෝ වෙනත් ආකාරයේ සූරාකෑම හේතුවෙන් ළමයාගේ සෞඛ්‍යය, පැවැත්ම, සංවර්ධනය හෝ වගකීම, විශ්වාසය හෝ බලය යන සම්බන්ධතා විෂයෙහි ගරුත්වයට හානි පැමිණවීම හෝ එසේ විය හැකි ලෙස ක්‍රියාකිරීම, ළමා අපයෝජනය වශයෙනි. "
>
> ලෝක සෞඛ්‍ය සංවිධානය

එමෙන්ම 2011.05.10 දිනැති 2011 අංක 17 දරණ පාසල් ළමා ආරක්ෂක කමිටු පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය මගින් ළමා අපයෝජනය යන්න පහත පරිදි නිර්වචනය කර ඇත.

> "ළමයෙකුගේ සංවර්ධනයට බාධාවන අයුරින් කායිකව, මානසිකව හෝ ලිංගික හිංසනයකට පීඩනයකට ලක්කිරීමට මෙන්ම තම නෛතික වගකීම් පැහැර හැරීමෙන් හෝ නොසැලකිලිමත්කමින් ළමයෙකුට එකී හිංසනයකට හෝ පීඩනයකට ගොදුරු වුවහොත් එය ළමා අපයෝජනයකි."
>
> 2011 අංක 17 දරණ පාසල් ළමා ආරක්ෂක කමිටු පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛය

මෙම සියලු අර්ථකථන මගින් ගම්‍යවන ප්‍රමුඛතම කාරණයක් වන්නේ ළමා අපයෝජන මගින් රටේ අනාගතය වන දරුවන් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වන බවයි. මෙම අපයෝජන නිසා ළමයාට ශාරීරිකව මෙන්ම මානසිකව සිදුවන හානිය ද සුළුපටු නොවේ. (ශාන්විගන්, 2013, පිටු; 17) එම නිසා දරුවන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂාකර ගැනීමට ප්‍රමුඛව කටයුතු කළ යුතුය.

Encyclopaedia Encarta අනුව Child Abuse යන්න පුළුල් ලෙසින් අර්ථකථනය කර ඇත. ඊට අනුව, ළමා අපයෝජනය හිතාමතා හෙවත් අභිප්‍රායෙන්ම කරනු ලබන ක්‍රියාවන් හේතු කරගෙන ළමුන්ට භෞතිකව හෝ හැඟීම් සඳහා සිදුකරන හානියකි.

ළමා අපයෝජනය සම්බන්ධයෙන් වන නීතිමය අර්ථනිරූපණ අනුව අපරාධ නීතිය හෝ වෙනත් ව්‍යවස්ථාපිත නීති මගින් අර්ථ දක්වා ඇති ළමයින්ට එරෙහිව සිදුවන කිසියම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් ළමා අපයෝජනය ලෙසින් හැඳින්වීමට පුළුවන. නීති ක්ෂේත්‍රය පදනම් කරගනිමින් ළමා අපයෝජනය සම්බන්ධව ඉදිරිපත්ව ඇති මෙම අර්ථ නිරූපණය මෑත කාලීනව පවතින ජනප්‍රිය විෂයානුබද්ධ විග්‍රහයක් ලෙසින් සැළකිය හැකිවේ. එහිදී බොහෝ දුරට නීතිමය කාරණා මගින් අර්ථ දක්වා ඇති කරුණු පදනම් කර ගනිමින් ළමා අපයෝජනයේ ස්වභාවය පැහැදිලි කිරීමට උත්සාහ ගෙන ඇත. ළමා අපයෝජනය පිළිබඳ මෑත කාලීනව ඉදිරිපත් කර ඇති මෙම නීතිමය විග්‍රහය ප්‍රායෝගික හා ව්‍යවහාරිකව වැදගත් වන්නක් ලෙසද පිළිගැනෙන්නේ ළමයින්ට එරෙහිව සිදුවන කිසියම් ක්‍රියාවක් අපරාධයක් හෝ නීති විරෝධී ක්‍රියාවක්ද යන්න නිශ්චය කර ගැනීමට හා එබඳු ක්‍රියාවක් අපරාධයක් වන්නේ නම් ඒ සම්බන්ධව නීතිමය ප්‍රතිචාර දැක්වීමටද ළමා අපයෝජනය පිළිබඳ මෙම නීතිමය විග්‍රහය හැමවිටම පදනම කර ගැනීම තුළින් එහි ඇති කාලීන වැදගත්කම ගම්‍ය වේ. අපයෝජනයේ මූලික ප්‍රභේද 4 ක් හඳුනාගත හැකිය.

1) ශාරීරික අපයෝජනය
2) මානසික අපයෝජනය
3) ලිංගික අපයෝජනය
4) නොසලකා හැරීම

යම්කිසි ක්‍රියාවකින් ළමයාට තුවාලයක් හෝ වේදනාවක්, දුර්වලවීමක්, ආබාධිත තත්වයට පත්වීමක් හෝ මරණයට පත්වීමක් සිදුවන්නේ නම් එම ක්‍රියාව ශාරීරික හෙවත් කායික අපයෝජනයක් ලෙස සැලකෙයි. යම්කිසි ක්‍රියාවක් හෝ ප්‍රකාශනයක් නිසා ළමයෙකුට කිසියම් මානසික පීඩනයක් හෝ කම්පනයක් ඇති වේ නම් එය මානසික අපයෝජනයක් ලෙස සැලකෙන අතර, ළමයෙකුට සිදුවන බරපතලම අපයෝජනය ලෙස සැලකෙන්නේ ලිංගික අපයෝජනයයි. ළමා ලිංගික අපයෝජනය ස්පර්ශයෙන්, ශරීරය සමඟ සම්බන්ධවීමෙන් හෝ එසේ නොවීමෙන්ද සිදුවිය හැකිය. වර්තමානයේදී මෙම ළමා ලිංගික අපයෝජනවල සීඝ්‍ර වැඩිවීමක්ද දක්නට ලැබේ.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හිටපු සභාපතිනි නතාෂා බාලෙන්ද්‍ර මහත්මිය සඳහන් කලේ මේ සඳහා මාධ්‍ය ප්‍රධානීන්ගේ මූලික අරමුණ වන්නේ ජනප්‍රියතාවය ලබා ගැනීමට බවයි. එවන් සිදුවීමක් වූ විගස එය මුලින්ම වාර්තා කරන මාධ්‍ය අතරට පැමිණීම ඔවුන්ගේ මූලික අභිප්‍රාය වන අතර එමෙන්ම එම සිදුවීමට අදාළ සියලු සිද්ධීන් වාර්තා චිත්‍රපටයක් මෙන් වාර්තා කිරීමෙන්ද අදාළ ඡායාරූප සහ වීඩියෝපට ඉතා ඉක්මණින් තම මාධ්‍යය හරහා ප්‍රචාරය කිරීම තුළින් ද මෙම කාර්යය සඵලදායි මට්ටමකට ලඟා කර ගැනීමට මෙම මාධ්‍ය කටයුතු කරන බව ඇය තවදුරටත් පැවසුවාය. එමෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ හිටපු සභාපතිනි අනෝමා දිසානායක මහත්මිය සඳහන් කරන ලද්දේ වර්තමානයේ මුද්‍රිත මාධ්‍ය ළමා අපයෝජන වාර්තා කිරීමේදී සංයමයකින් තොරව ඡායාරූප පළකරමින් වාර්තා කරන බවත් එය හුදෙක් තම ආයතනයේ ප්‍රසිද්ධිය උදෙසා සිදු කරන ලද්දක් බවයි.

අජිත් රෝහණ මහතාද මේ හා සමාන මතයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කලේ වර්තමාන මුද්‍රිත මාධ්‍යය මෙන්ම අනෙකුත් ජනමාධ්‍යයන් ද මේ වන විට ළමා අපයෝජන දඩමීමා කරගනිමින් තමන්ගේ ප්‍රේක්ෂක දර්ශකයන්ගේ ඉහලට ඒම සඳහා දැඩි වෑයමකින් කටයුතු කරන බවත් එම වෑයම තුළ අපහසුතාවයට පත් වන්නේ අප රටේ අනාගත පරපුර වන බවයි. ආචාර්ය වසන්තා සුබසිංහ මහත්මිය පෙන්වා දෙනු ලබන්නේ ද වර්තමානයේ මුද්‍රිත මාධ්‍යයන් ළමා අපයෝජන වලට අනවශ්‍ය පුළුල් ප්‍රචාරයක් ලබා දෙන බවයි. මේ තුළින් ප්‍රබල ලෙස ළමා අයිතිවාසිකම් කඩවීමක් සිදු වන අතර දැඩි ලෙස මාධ්‍ය සදාචාරය ද උල්ලංඝනය වන බව ඇය පෙන්වා දෙයි. වෛද්‍ය හිරන්ති විජේමාන්න මහත්මිය පෙන්වා දෙනු ලබන්නේ ද වර්තමානයේදී මාධ්‍යයන් අනවශ්‍ය පුළුල් ප්‍රචාරයක් ලබා දෙමින් මෙම සිදු

කරගෙන යනු ලබන ක්‍රියාදාමය අතිශය පහත් ක්‍රියාවක් ලෙසත් මෙසේ ක්‍රියා කිරීමෙන් සිදුවන්නේ රටේ දරු පරපුරේ අනාගතය තවත් අගාධයට හෙළීමක් බවයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය තුළ ප්‍රධාන වශයෙන් යොදාගනු ලැබුවේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ සිද්ධි අධ්‍යයන ක්‍රමවේදයන් 2 යි එහිදී මෙම පර්යේෂණය වඩාත් ප්‍රායෝගික පරික්ෂණයන් නිසා සිද්ධි අධ්‍යයන ක්‍රමවෙදයට වැඩි අවධානයක් යොමු කර ඇත. ඒ අනුව පහත සිදුවීම් කිහිපය අධ්‍යයනය කිරීම වැදගත් වේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව




(1984 වර්ෂයේ අප්‍රෙල් මාසයේ 28 දින දිණමින පුවත්පතේ පළවූ ප්‍රවෘත්තියකි)

පන්තියෙ පලවෙනිය වුනේ සමන් කුමාර
මොනිටර් කම දැරුවෙත් පොඩි සමන් කුමාර
මුලු පාසල බැබලුව සිඳු සමන් කුමාර
අද පාසැල් නාවෙ ඇයිද සමන් කුමාර,

ඇන්ටන් ජෝන්ස් මහතාගේ මේ ගීතය ඔබත් සමහරවිට අසා ඇති. මුලු ලංකාවම කම්පාවට පත් කරමින් සිදුවූ මේ මිනීමැරුම සිදුවන්නේ මතුගම ප්‍රදේශයේදී. ලංකා ඉතිහාසයේ කප්පම් මුදලක් ලබාගැනීම සඳහා දරුවෙක් පැහැරගෙන ගොස් ඝාතනය කල මුල්ම අවස්ථාවක් හැටියටත් මේ සිදුවීම ඉතිහාසගත වනවා.

ඒ 1984 වර්ෂයයි. සිංහල අලුත් අවුරුදු නිවාඩුවට පෙර පාසල් පවත්වනු ලබන අවසන් දවසේ පාසල වෙත යන අතරතුර සමන් කුමාරව පැහැරගනු ලබනවා. ඒ අන් කිසිවෙකු නොව පවුලේ සමීපම හිතවතෙකුව සිටි ධර්මසිරි නැමැත්තෙක් විසින්. ඒ වන විට මුදල් ගණුදෙනුවක් හේතුවෙන් ඔහු සමන් කුමාරගේ පවුල සමග හිත් අමනාපයකින් යුතුවයි හිඳ තිබෙන්නේ. මේ අපරාධයට ධර්මසිරි නැමැත්තාගේ මස්සිනා කෙනෙක් වන ප්‍රේමරත්න නැමැත්තෙකුද හවුල්ව තිබෙනවා. මොවුන් දෙදෙනා එක්ව දරුවාගේ දෙමවුපියන්ගෙන් ලක්ෂ එකහමාරක කප්පම් මුදලක් ලබා ගැනීමටයි තැත් කරන්නේ. කෙසේ වෙතත් මේ කප්පම් මුදල ගැනීමට උත්සාහ කරන අතරතුරම සමන් කුමාර දරුවා මොවුන් විසින් ගෙල සිරකරනු ලැබීමෙන් මරණයට පත්වනවා. නීතියේ ඇසට වැළි ගසමින් කප්පම් මුදල ලබා ගැනීමටත් සැඟවී සිටීමටත් උත්සාහ කළ ද අවසානයේ මොවුන් දෙදෙනාම නීතියට කොටු කරගැනීමට පොලිසිය සමත් වනවා.

අපරාධකරුවන් එල්ලුම් ගසට නියම වුවත් ඒ වනවිට ඒ දඬුවම ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මොවුන් සිර දඬුවමකට ලක්වෙනවා. කෙසේ වෙතත් සිරගත දිවිය තුළ ඉතාම යහපත් කල්ක්‍රියාවෙන් දිවිගෙවූ දෙදෙනෙක් හැටියටයි මේ අපරාධකරුවන් දෙදෙනා ගැන සඳහන් වන්නේ.

ඉහත ඡායාරූපයේ දැක්වෙන්නේ ලංකා ඉතිහාසයේ සිදුවූ දරුණු ඛේදවාචකයක් වන සමන් කුමාරගේ මරණය එවකට මුද්‍රිත මාධ්‍යය හරහා එවකට වාර්තාකර තිබූ අයුරුයි. මෙහිදී පෙනියන කරුණක් වන්නේ එවකට මුද්‍රිත මාධ්‍යය වල හැසිරීම වර්තමානය හා අතිශය සමාන බවත් පෙන්නුම් කරන බව මෙහිදී සමන් කුමාරගේ ඡායාරූපය සහිත මෙම පුවත දුටු විගස ඒ බව පෙනීයයි. එමෙන්ම එවකට ළමා අපයෝජනයන් පිළිබඳව එතරම් අවබෝධයක් නොතිබූ යුගයක් විය. එම යුගයේ එය යම් අපරාධයකට පමණක් සීමා වුවද එම කාලයේදී පවා සමන් කුමාරගේ රූපය මාධ්‍යය හරහා පළකර තිබීමෙන් පැහැදිලිව පෙනීයන කරුණක් වන්නේ එම කාලයේදී ද මුද්‍රිත මාධ්‍යයට මෙම කාරණය එලෙසින්ම ඉටුකරන බවය. ඉහත ඡායාරූයේ සමන් කුමාරගේ විශාලනය කරන ලද ඡායාරූපයක් යොදාගෙන තිබීමෙන් පැහැදිලි වන්නේ ඔහුව ඡායාරූපය යොදාගැනීම හරහා නැවත වරක් අපයෝජනයට ලක්වීම නොවේද? එමෙන්ම මෙම පුවත්පත සමන් කුමාරගේ මරණයට අදාළ තවත් ඡායාරූප කිහිපයක් ඉදිරිපත් කොට තිබේ. එමෙන්ම එහි එම සිදුවීමට අදාළ විස්තරය විස්තරාත්මක අනුශීර්ෂ සහිතව සිද්ධිය ද දක්වා ඇත. එහි සමන් කුමාරගේ නම් ගම් විස්තර සියල්ල ද ඇතුලුව පැහැදිලිව විස්තර කර තිබෙන අතර වර්තමානයට වඩා ඇති එක් වෙනසක් වන්නේ එදා ඡායාරූපය යොදා තිබෙන්නේ කලු සහ සුදු වර්ණයෙගන් වීම පමණකි. ඒ අනුව මෙම ඡායාරූපය සහ මෙම පුවත එවකට සටහන් කරන ලද මාධ්‍යවේදියාට ළමා අපයෝජනයන් යනු කුමක්ද යන්න පිළිබඳව නිවැරදි අවබෝධයක් තිබී නොමැත. එසේ නොමැතිකම් එම යුගයේ ඒ සම්බන්ධයෙන් කිසිම අවධානයක් නොමැති බව පෙන්වා දිය හැකිය. මෙම පුවත්පතේ සමන් කුමාර නම් ශිෂ්‍යයාගේ මරණය සම්බන්ධයෙන් එලි නොකල යුතු කරුණු රාශියක් හෙලි කරමින් එම පුවත ප්‍රචාරණය කරන්නට අතීත මාධ්‍යවේදීන් දරනු ලබන දැඩි උත්සාහය සැලකිල්ලට ගත යුතුය. වර්තමානයේ එම සිදුවීම සිදුවුනානම් සියලු මාධ්‍යය වලින් ඒ හරහා පුළුල් මාධ්‍යය ප්‍රචාරයන් දෙනු ලබන බවද අපට වැටහී යන කරුණකි. මෙම කාරණයෙහි මුල බීජයන් වර්තමානය කරා දිව එමේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ද මෙම තත්වය දකින්නට ලැබීම ද අරුමයක් නොවේ.




වර්තමානයේ ඉතා මෑතකදී සිදුවුන තවත් ශෝකජනක සිදුවීමක් ලෙස සේයා සඳෙව්මිණි දැරියගේ සිදුවීම පෙන්වා දියහැකි වන අතර සේයා සඳෙව්මිණි දැරියගේ ඝාතනය සිදුවූ විගස ලංකාවේ ප්‍රමුඛතම මුද්‍රිත මාධ්‍යය සියල්ල පාහේ මෙම සිදුවීම ඉතාමත් ඉක්මණින් වාර්තාකරණය සිදු කරන ලදි. එම අවස්ථාව මාධ්‍යය විසින් යොදාගනු ලැබුවේ බොරදියේ මාලු බාන අවස්ථාවක් ලෙසිනුය. විවිධ මුද්‍රිත මාධ්‍යයන් බොහෝමයක් සේයා සඳෙව්මිණිගේ නිසල දේහය සොයා ගත් සැනින් එම ස්ථානයට ගොස් එම දේහය තිබූ ආකාරය ඡායාරූප ගත කොට එම ඡායාරූප ද පුවත්පත් වල පළ කරන ලදී. එසේ පුවත්පත් වල පළකලේ ඔවුන්ට ඒ තුලින් ප්‍රසිද්ධියක් ලබා ගැනීමේ කුට උපක්‍රමයක් නිසා බව මෙම කාරණය පිළිබඳව අධ්‍යනය කරන්නෙකුට පැහැදිලිව පෙනියන කරුණකි.




එමෙන්ම සේයා දියණියගේ අපයෝජන සිද්ධිය සිදුවීම මසක් පමණ ගතවන තුරු එම සිදුවීම පිළිබඳ ඡායාරූප පළ කරමින් පුවත් පත් දිගින් දිගටම ප්‍රවෘත්ති පළ කරන්නට විය. මෙසේ පුවත් පළ කිරීම නිසා සේයා දැරියගේ දෙමාපියන් පවා දැඩි අපහසුතාවයට පත් විය. එමෙන්ම කොණ්ඩයා ලෙස හැදින්වූ අපයෝජකයා ලෙස නම් කළ තැනැත්තා ද ජාන පරීක්ෂණ වලින් පසුව නිර්දෝෂී යැයි අධිකරණය විසින් තීරණය කරන ලදී. එමෙන්ම මුලින්ම එම ළමා අපයෝජනයට ප්‍රධාන සැකකරුවකු ලෙස අත්අඩංගුවට ගත් පාසල් ශිෂ්‍යයාගේ ඡායාරූප පළ කරමින් පුවත්පත් මාර්ගයෙන් රැගෙන ගිය අනවශ්‍ය ප්‍රචාරය නිසා එම දරුවාගේ අනාගතය අඳුරු කර දැමීමට පුවත්පත් වලට හැකියාව ලැබිණි.

එම සිසුවාට සමාජයෙන් දැඩි පීඩනයක් එල්ල විය. ඔහුට තම යහළුවන්ට පවා මුහුණ දීමට පවා හැකියාවක් නොමැතිවිය. එසේම එම ශිෂ්‍යයා පමණක් නොව ඔහුගේ ඥාතීන් පවා අපහසුතාවයට පත්විය. ඔහු සතුව තිබූ ලැප්ටොප් පරිගණකයේ අසභ්‍ය වීඩියෝපට තිබූ බවට ඔහුට චෝදනා එල්ලවිය. එම චෝදනා හරහා එම දරුවා දැඩි මානසික අපයෝජනයකට ලක්වීමට විය. ඉහත ඡායාරූප දෙස විමසිලිමත්ව බැලීමෙන් පෙනී යන පැහැදිලි කරුණක් වන්නේ සේයා දියණියගේ නිරුවත් දේහය වනාන්තරය තුළ තිබෙන ඡායාරූප පවා පුවත්පත් වල පළකොට තිබීම දක්නට ලැබෙන බවයි. එමෙන්ම මුලින්ම සේයාගේ මව සහ පියාද මෙම සිද්ධිය සම්බන්ධයෙන් සැකයට භාජනය විය. එම අවස්ථාවේදී එම දෙදෙනාගේ ඡායාරූප ද මාධ්‍ය හරහා පළකරමින් ඔවුන් දෙදෙනාවද අපහසුතාවයට පත්කිරීමට මුද්‍රිත මාධ්‍යය සමත් විය. මෙම සේයාගේ ප්‍රවෘත්තිය මෙසේ පුවත්පත් මගින් පළ කිරීම මගින් මෙම සිද්ධිය ජාත්‍යන්තරය දක්වා යාමට තරම් ප්‍රබල විය. අද වන විට මෙම දියණිය ජීවතුන් අතර නොමැති අතර, ඇයට මියගියත් නිදහසේ සිටින්නට ඉඩ නොදෙන අන්දමින් මුද්‍රිත මාධ්‍ය ක්‍රියාකළ බව මෙම ඡායාරූප හරහා මුළු මහත් ලෝකයටම පසක් වේ.

යාපනයේ පුන්ගුඩුතිව් ප්‍රදේශයේ සිදුවූ විද්‍යා දැරිය දූෂණය කිරීමේ සිද්ධිය ද පුවත් පත් මගින් විශාල ප්‍රචාරයක් දෙනු ලැබූ සිද්ධියක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහිදී පුන්ගුඩුතිව් මහ විද්‍යාලයේ අධ්‍යාපනය හදාරමින් සිටි එදින පෙ ව 7.30 ට පමණ නිවසින් පිටත් වූ ඇය වෙනදාට වඩා නිවසට පැමිණීමට ප්‍රමාද වූ හෙයින් ඒ පිළිබඳව ඇයගේ පවුලේ ඥාතීන් විසින් අදාළ ප්‍රදේශයේ පොලිසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව ඇයගේ නිරුවත් සිරුර එම ප්‍රදේශයේ පාලු ස්ථානයක තිබී ඇගේ සොහොයුරාට හමුවිය. එය හමුවන විට රාත්‍රී 7.30 පමණ වූ අතර අත පය බැඳ තිබූ අතර මෙම ආරංචිය දැනුන විගස මුලින්ම එතනට පැමිණියේ පුවත්පත්වල වාර්තාකරුවන්ය. ඔවුන් තරඟයට මෙන් විද්‍යාගේ නිසල දේහය ඡායාරූපගත කරන්නට වූයේ තම පුවත්පතේ මුල් පිටුවේම මෙම ප්‍රවෘත්තිය සඳහන් කර මුලින්ම එම ප්‍රවෘත්තිය පළ කිරීමේ කීර්තිනාමය ලබා ගැනීමටය. විද්‍යාගේ සිදුවීම ද රටතුළ මහත් ආන්දෝලනයක් ඇති කළ සිදුවීමක් බවට පත්වන්නේ ද එහි ඡායාරූප මාධ්‍ය හරහා කරලියට පැමිණීම නිසාය. මේ කාරණය හේතු කොටගෙන විද්‍යාගේ පවුලේ ඥාතීන්ට පවා මහත් අපහසුතාවයන්ට පත්වීමට සිදුවිය. විද්‍යා දැරිය දූෂණය කර මරා දමා ඇති ආකාරය, ඇයගේ සිරුර වනයේ තිබූ අයුරු බොහෝ පුවත්පත් වල පළ කර තිබුණේය. එසේම පුවත්පත් කිහිපයක් එම ඡායාරූප බොඳකර දක්වා තිබුණ ද සමහර පුවත්පත් එම ඡායාරූප බොඳකරවත් පළ කර තිබුණේ නොමැති බව පෙන්වා දිය යුතුය. මෙවන් අවස්ථාවකදී මාධ්‍ය සදාචාරය පවා අමතක කර මාධ්‍ය එම පුවත පළ කිරීම මෙම ඡායාරූප අධ්‍යයනය කිරීමෙන් පෙනී යයි. මෙම සිද්ධිය සත්‍යය වශයෙන් වැඩියෙන්ම වාර්තාකරණය සිදු කරන ලද්දේ සිංහල මාධ්‍ය පුවත්පත් වලින් බව පෙනියයි. දමිළ මාධ්‍ය පුවත්පත් වල මෙම සිදුවීම පිළිබඳව වාර්තාකර තිබුණ ද එය යම්තාක් දුරට සංයමයෙන් ඉදිරිපත් කරන ලද්දක් විය. විද්‍යාගේ සිදුවීම උතුරේ ජනතාව තුළ යම් කැලඹීමක් ඇති කළද එය සමනය කිරීමට බොහෝ දමිළ මාධ්‍ය උත්සහ කිරීමක් දක්නට ලැබුණු අතර සිංහල පුවත්පත් නිරන්තරයෙන් උත්සහ කළේ එම සිදුවීමට සේයාගේ සිදුවීමට මෙන්ම අනවශ්‍ය ප්‍රචාරයක් ලබාදීමට සහ එසේ ප්‍රචාරය කිරීම තුළින් තම පුවත්පතේ අලෙවිය වර්ධනය කරගැනීමට බව එම සිදුවීම සිදුවූ කාලයේ පුවත්පත් වල හැසිරීම අධ්‍යයනය කරන පර්යේෂකයෙකුට දැකගත හැකිය.



(ද නේෂන් පුවත්පත 2016.05.09)

ඉහත දැක්වෙන්නේ "ද නේෂන් " පුවත්පත තවත් එක් ළමා අපයෝජන සිදුවීමක් වාර්තා කර ඇති ආකාරයයි. මෙහිදී දැකිය හැකි වන්නේ එම සිදුවීම සිදු වූ ආකාරය පිළිබඳව සියලු විස්තරය මෙහි දක්නට ලැබීමත් අදාළ ළදරුවාගේ ඡායාරූපය ද එම පුවත්පතේ විශාලනය කොට දක්වා තිබීමයි. එසේ දක්වා තිබීමෙන් අපහසුතාවයට පත්වන්නේ එම ළදරුවාගේ දෙමාපියන් සහ ඥාතීන් බව මෙම පුවත

පළ කරන පුද්ගලයන්ට අමතකව ගොස් ඇති බව පැහැදිලි කරුණකි. එමෙන් ම ඡායාරූප පළ කිරීමෙන් පමණක් තෘප්තිමත් නොවන මෙම වාර්තාකාරිණිය අදාළ කාර්යය සිදුවූ ආකාරය ඉතාමත් පැහැදිලිව ඉදිරිපත් කරනු ලබයි. මෙහිදී ඇය මේ සිදුකරන ක්‍රියාවෙහි බරපතලකම පිළිබඳව මොහොතක්වත් නොසිතන්නට ඇත. වර්තමානයේ බොහෝ පුවත්පත් වාර්තාකරුවන් මෙසේ අනවශ්‍ය ලෙස ඡායාරූප පල කරමින් ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමක් දක්නට ලැබෙන අතර මෙසේ අනවශ්‍ය ප්‍රචාරණයක් ලබා දෙන්නේ ඇයි ද ? යන කරුණට පිළිතුරක් ඔවුන් විසින් නිශ්චිතව ලබා නොදෙන්නේ එය ඔවුනට අවාසි සහගත වන බැවින් යැයි මගේ හැඟීමයි. මෙම සිදුවීම වාර්තාකරණයේදී දක්නට ලැබෙන එක් කාරණයක් වන්නේ අදාළ අපයෝජන වින්දිත දරුවාගේ ඡායාරූපය පල කර තිබුණ ද එය සොයාගන්නා අවස්ථාවේ තිබුණ ආකාරයේ ඡායාරූප පළ නොකර තිබීමයි. යම් යම් තරමක යහපත් ප්‍රවණතාවයක් ලෙස පෙන්වා දිය හැකි වුව ද සියලු විස්තර සහිතව සියලු කරුණු ඉදිරිපත් කර තිබීම නිසා කලින් කථා කල අගය පහල බැස ඇති බව ද පෙන්වා දිය හැකිය. මෙම ඡායාරූපයේ සිටින දරුවාගේ දෙමාපියන්ට වර්තමානයේ මෙම චායාරූපය දුටුවහොත් ඇතිවන හැඟීම කුමක්ද යන්න පිළිබඳව අමුතුවෙන් විස්තර කිරීමක් අත්‍යවශය නොවන බව මෙම කාරණා විමසීමේදී පෙනියයි. ඡායාරූපයක් යනු අසීමිත ලෙස හැඟීම් ප්‍රකාශනයට යොදාගත හැකි දෙයකි. එසේම කාලය මොහොතකට නතර කිරීමේ තාක්ෂණය ඇත්තේ ඡායාරූපයේ පමණී. මේ කරුණු මෙසේ වුවද මෙහිදි නම් ඡායාරූපය යොදාගෙන තිබෙන්නේ එතරම් ම යහපත් අරමුණකට නොවන බව පසක් වේ. මේ කාරණයත් සමඟ අපට පසක් වන්නේ මෙසේ ඡායාරූප යොදා ගැනීමත් සමඟ පළකළ මෙම ප්‍රවෘත්තිය නිසා එම දරුවාව නැවත නැවතත් අපයෝජනයට ලක් වීමකි.


# කුඩම්මා උණුවතුරෙන් පුච්චලා

අසේල කුරුළුවංශ

මස්කෙළිය ස්ටැස්පි වතුයායේ හත්හැවිරිදි දරුවකුගේ මුහුණ හා දෙඅත් එම දරුවාගේ කුඩම්මා විසින් උණුවතුර දමා පිළිස්සීම හේතුවෙන් බරපතල තුවාල ලත් දරුවා මස්කෙළිය රෝහලට ඊයේ (05) පස්වරුවේ ඇතුළත්කර තිබේ. එම දරුවා පෙරේද (04) රාත්‍රියේ සිට අධික වේදනාවෙන් කෑගසනු ඇසී ප්‍රදේශවාසීන් මස්කෙළිය පොලීසියට ඒබව දැනුම්දී ඇත. පසුව පොලීසිය එහි ගොස් බරපතළ තත්ත්වයේ පසුවන දරුවා වහා රෝහල්ගත කිරීමට පියවර ගෙන තිබේ.

එම දරුවාගේ මව හා පියා දික්කසාද වීමෙන් පසු පියා වෙනත් කසාදයක් සිදුකරගෙන තිබෙන අතර කුඩම්මා දරුවාට නිතර වධහිංසා සිදුකරන බව පොලිස් පරීක්ෂණ මගින් අනාවරණයවී ඇත. බරපතළ ලෙස අත් හා මුහුණ පිළිස්සුණු දරුවා රෝහල වෙත ඇතුළත් කිරීමට හෝ දරුවාගේ සුළුමව හෝ මිත්තණිය පියවරගෙන නොමැති බව පොලීසිය පවසයි. මෙසේ බරපතළ තුවාල ලැබ රෝහල්ගත කරඇත්තේ පරමරාජ් යුවරාජ් නැමැති දරුවෙකු වන අතර සිද්ධිය සම්බන්ධයෙන් දරුවාගේ සුළු මව හා මිත්තණිය අත්අඩංගුවට ගැනීමට මස්කෙළිය පොලීසිය පරීක්ෂණ පවත්වයි.

(2016 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 06 දින දිණමිණ පුවත්පතේ පළවූ ප්‍රවෘත්තියකි)

මෙම ප්‍රවෘත්තිය ඉතාම මෑතක වාර්තා වූ පුවතකි. මෙම පුවත ලංකාවේ සුවිශේෂී නාමයක් දිනාගත් රජයේ පුවත්පතක් ළමා අපයෝජන පිළිබඳව පුවතක් පළ කරන අයුරු හොඳින් ම නිරීක්ෂණය කළ හැකි අතර ළමා අයිතිවාසිකම් සුරැකීමට සිටින රජයේ ආයතනයකින් ම මෙසේ ළමා අයිතිවාසිකම් කඩ කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ළමා ආරක්ෂාවට ලැබී ඇති ස්ථානය පිළිබඳව ඔබට දළ අවබෝධයක් ලබාගැනීමට හැකිවනු ඇත. මෙහිදී ළමයාගේ ඡායාරූපයක් විශාලනය කොට පළ කිරීම තුළින් පෙනි යන්නේ රජයේ මුද්‍රිත මාධ්‍ය වෙනසක් නොමැතිව රටේ දරු පරපුරේ අනාගතය පිළිබඳව අවධානයක් යොමු නොකරන බවයි. එසේ වුවද මෙහි මෙම දරුවාගේ නම් ගම් විස්තර සඳහන් කොට ඇති අතර එය දරුවාගේ ආරක්ෂාවට තර්ජනයක් විය, හැකි බව ද පෙන්වා දේ. කෙසේ වුව ද මෙම සිද්ධිය සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මේ වන විට පරීක්ෂණ ආරම්භ කොට ඇති අතර, ඒ අනුව අපරාධකරුවන් නීතියේ රැහැනට හසුවුවත් මෙසේ ඡායාරූපය සමග පුවත් පළ කිරීම නිසා එම දරුවා නැවත සමාජගත කිරීමට ඉතාමත් අපහසු බව පෙන්වා දිය හැකියි. එය අයහපත් ලක්ෂණයක් ලෙස අපට දැකිය හැකිය එමෙන්ම මෙසේ මෙම ප්‍රවෘත්තිය පළ කිරීම නිසා දරුවාගේ සිතෙහි ඇතිවන හැඟීම් කෙසේ නම් විස්තර කරන්නද? ඔහුට කෙතරම් අසරණ භාවයක් දැනෙන්නට ඇත්ද? තම කුඩම්මා විසින් සිදුකරන ලද උණුවතුර ප්‍රහාරයෙන් ඇතිවූ පිලිස්සුම් තුවාලවලට වඩා වේදනාවක් මෙම දරුවාට දැනෙන්නට ඇත. ඔහු තම යහලුවන්ට මුහුණ දෙන්නේ කෙසේද? මෙම සිදුවීම දරුවා තුළ කෙතරම් මානසික පසුබෑමකට ලක්වන්නට ඇත්දැයි අපට ප්‍රකාශ කළ නොහැකිය. එය දන්නේ එම

දරුවා පමණි. කෙසේ වෙතත් ළමා අපයෝජන වාර්තාකරණයේදී මෙවන් ආකාරයේ වාර්තා කිරීම් වලින් වැලකී සිටීම යහපත් බව පෙනේ.


# හැන්ද රත්කර දස හැවිරිදි දරුවා පිළිස්සූ තරුණයා අත්අඩංගුවට

මඩකලපුව - ජමාර්සාන්

කාත්තාන්කුඩි පොලිස් වසමේ තාලමුනේ දස හැවිරිදි දරුවකු රත්කරන ලද හැන්දකින් පිළිස්සූ සිද්ධියක් වාර්තාවේ. මෙම දරුවාගේ මව හා පියා විදේශගතව සිටින අතර ඔහු ආච්චිගේ නිවසේ ජීවත් වී තිබේ. මෙම නිවසේ ජීවත්වන ආච්චිගේ පුතකු වන 22 හැවිරිදි තරුණයකු විසින් හැන්දක් ගින්නට දමා රත්කිරීමෙන් පසු මෙම සිසුවාගේ ශරීරයේ තැනින් තැන පිළිස්සීම සිදුකර තිබේ.

මෙම ස්ථානයට පැමිණි කාත්තාන්කුඩි පොලිස් නිලධාරීන් පිළිස්සුම් තුවාල ලබා සිටි දරුවා මඩකලපුව ශික්ෂණ රෝහලට ඇතුළත් කර තිබේ. මෙම සිද්ධියට සම්බන්ධව සැකකාර තරුණයා අත්අඩංගුවට ගෙන ඇත.

කාත්තාන්කුඩි පොලිසිය වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

(2016 වර්ෂයේ ජූනි මාසයේ 25 දින දිවයින පුවත්පතේ පළවූ ප්‍රවෘත්තියකි

මෙම පුවත ද ශාරීරික ළමා අපයෝජනයක් පිළිබඳව වාර්තාකරණ ප්‍රවෘත්තියකි. නමුත් මෙම ප්‍රවෘත්තිය වාර්තාකරණ ආකාරය පිළිබඳව අප යම් සැලකිල්ලක් දැක්විය යුත්තේ ඉහත උදාහරණ 05 ට වඩා වෙනස් ආකාරයකින්, නිවැරදි ආකාරයකින්, අපයෝජනය වූ දරුවාට ද හානියක් නොවන අයුරින් මාධ්‍ය සදාචාරයට අනුකූලතාවයක් දක්වමින් ඉදිරිපත් කරන ලද ප්‍රවෘත්තියක් වීම නිසායි. මෙම වාර්තාකරණයෙහි ඡායාරූපයක් යොදාගෙන තිබුණ ද අපයෝජනයට ලක්වූ දරුවා කවුරුන් ද යන්න නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වන සේ එම ඡායාරූපය යොදාගෙන ඇති අතර, දරුවාගේ මුහුණ නොපෙනෙන පරිදි එම ඡායාරූපය ගෙන ඇති මෙම මාධ්‍යවේදියාට අප ප්‍රසංසා කළ යුත්තේ වර්තමානයේ පුවත්පත් ක්ෂෙත්‍රයේ මෙවන් දැනුම් තේරුම් ඇති මාධ්‍ය වේදීන් සිටින්නේ ඉතාම අතලොස්සක් වීම නිසාය. එමෙන් ම ඔහුට රටේ ළමා පරපුර පිළිබඳව යම් ආකාරයක හැඟීමක් ඇති බව පෙනී යයි. මෙහිදී දරුවාට නැවත අපයෝජනයකට ලක් නොවීමට මෙම මාධ්‍යවේදියා වග බලාගෙන ඇති අතර, අදාළ ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමේදී ද දරුවාගේ නම, ගම හෝ දෙමාපියන් පිළිබඳව විස්තර සඳහන් වන්නේ නැති අතර අනවශ්‍ය තොරතුරු ඇතුළත් නොකර අවශ්‍ය කාරණය පමණක් ඉදිරිපත් කොට එම පුවත් සමාජ ගත කොට තිබේ. මෙසේ ළමා අපයෝජන පුවත් ඉදිරිපත් කිරීමට හැකි නම් වර්තමාන ළමා පරපුර ළමා අපයෝජන වලට ලක්වීම අවම කරගත හැකි සේම රටේ දරු පරපුරට යහපත් අනාගතයක් නිර්මාණය කළ හැකි බව ද පෙන්වා දිය හැකිය.


● පොදු සමාවෙන් නිදහස්ව පැමිණි

# ස්ත්‍රී දූෂක පියා රැයක් පහන්වන තුරු තරුණ දියණිය දූෂණය කරයි

● බිරියගේ මව-නැගණිය හා මෙම දියණියම අවුරුදු තුනේදීත් දූෂණය කරලා

(2016 වර්ෂයේ අප්‍රේල් මස 25 දින ලංකාදීප පුවත්පතේ පළවූ ප්‍රවෘත්තියකි)

ඉහත ප්‍රවෘත්තිය ද ළමා ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් පළවූ ප්‍රවෘත්තියකි. මෙම ප්‍රවෘත්තිය ද ඉදිරිපත් කර තිබෙන ආකාරය විමසා බලන විට පෙනී යන්නේ ඡායාරූප යොදා නොගෙන වුවත් සාර්ථක ලෙස කළ හැකි ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමයි. මෙහිදී එම සිද්ධියට බඳුන් වූ දරුවාගේ කිසිම

ඡායාරූපයක් පළ කර නොමැත. ඔමෙන් ම නම් ගම් විස්තර කිසිවක් ඉදිරිපත් කර නොමැත. එමෙන්ම මෙම වාර්තාකරණය තුළ සිදුවීමට අදාළ කිසිම පාර්ශවයක් අපහසුතාවයට පත් වන්නේ නොමැති අතර, කිසිවෙකුගේ අයිතිවාසිකම් කඩවන්නේ ද නැත. එසේම මෙම සිදුවීමට අදාළ සැකකරුගේ ඡායාරූපයක් වත් මෙම වාර්තාකරණය තුළ ඇතුළත්කර නොමැත. සියලු දෙනාටම සාධාරණත්වය ඉටු වූ ප්‍රවෘත්ති වාර්තාකරණයක් ලෙස ද මෙය පෙන්වා දිය හැකිය. එමෙන්ම මාධ්‍ය සදාචාරය ආරක්ෂා වූ ප්‍රවෘත්ති වාර්තාකරණයක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. මෙවැනි ආකාරයට ප්‍රවෘත්ති ඉදිරිපත් කළ හැකි නම් වර්තමානයේ සිදුවන ළමා අපයෝජන බොහොමයක් අවම වනු ඇත. මෙවැනි ආකාරයේ වූ ළමා අපයෝජන සිදුවීම් වාර්තාකරණය ඉතාමත් යහපත් අන්දමේ වාර්තාකරණයක් ලෙස පෙන්වා දිය හැකිය. සියලු මුද්‍රිත මාධ්‍ය මේ ආකාරයට ළමා අපයෝජන වාර්තාකිරීමට අදිටන් කර ගත යුතුය.

විශේෂයෙන් රට තුළ සිදුවන ළමා ලිංගික අපයෝජන වර්තමානය තුළ දී ඇඩි ව්‍යසනයක් බවට පත්ව ඇත. භයානකම කාරණය වන්නේ මෙලෙස ලිංගික අපයෝජනයට ලක්වන දරුවන් නැවත සමාජගත කිරීමේදී ඇඩි ගැටලු සහගත තත්වයකට පත්වීමයි. එමෙන්ම එම ළමුන් වැඩිහිටියන් බවට පත් වූ පසු ද, ඔවුන් අපයෝජකයන් බවට පත්වීමේ ප්‍රවණතාවයක් ද වර්තමානය වන විට මතුව ඇති බව පර්යේෂණ වලින් හෙළිවී ඇත. වර්තමානය වන විට සමාජගතවී ඇති මතය වන්නේ වර්තමාන මුද්‍රිත මාධ්‍ය හරහා ළමා අපයෝජන වාර්තාකිරීමේදී ඡායාරූප යොදාගැනිම නිසා පුවත්පත ළමා ලිංගික අපයෝජනවලට රුකුල් සපයන සන්දිස්ථානයක් බවට පත්ව ඇති බවයි. මුද්‍රිත මාධ්‍ය හරහා ළමා අපයෝජන වාර්තාකිරීමේදී ඡායාරූප යොදාගැනීම වෙනුවට ළමා ලිංගික අපයෝජන වාර්තා කිරීම සඳහා ඡායාරූප යොදා නොගෙන වෙනත් විකල්ප ක්‍රම යොදා ගැනීමෙන් ප්‍රවෘත්ති වාර්තාකරණය ධනාත්මකව භාවිත කිරීම පිළිබඳව සමාජය තුළ පවතින්නේ අල්ප දැනුමකි. "මුද්‍රිත මාධ්‍ය මගින් ළමා අපයෝජන වාර්තාකරණයේදි ඡායාරූප භාවිතයේ ස්වභාවය" නම් මෙම පර්යේෂණය තුළ දී මා විසින් එළඹි නිගමන පහත පරිදි සම්පිණ්ඩනය කර දක්වනු ලැබේ.

**නිගමන හා යෝජනා**

- **සමාජයේ වෙසෙන ජනතාවගෙන් බහුතරයකට "ළමයා" යනු කවරෙක්ද? පිළිබඳව අවබෝධයක් ඇත.** එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ පළමු වන වගන්තිය මගින් ළමයා යනු, වයස අවුරුදු 18ට අඩු තැනැත්තෙකු වශයෙන් අර්ථ දක්වා තිබුණි. නියැදියෙන් 77%ක් එය නිවැරදිව හඳුනාගෙන තිබුණි.
- **සමාජයේ බහුතරයකට ළමා අපයෝජන වර්ග ගැන දැනීමක් නැත.**
- **සමාජයේ වෙසෙන ජනතාවගෙන් බහුතරයක් ළමා අපචාර හා ළමා අපයෝජන අතර වෙනස පිළිබඳ දැනුවත්ය.** ළමයින් අතර සිදුවන වැරදි හැසිරීම් ළමා අපචාර වන අතර, වැඩිහිටියන් විසින් ළමයින්ට එරෙහිව කරනු ලබන වැරදි ළමා අපයෝජන වේ. නියැදියෙන් 80%ක් මෙම වෙනස හඳුනාගෙන තිබුණි.
- **ළමයින් ඕනෑම ස්ථානයකදී ලිංගික අපයෝජනයකට ලක්විය හැකිය.** නියැදියෙන් 98%ක්ම එය තහවුරු කර තිබුණි.
- **බහුතරයක් ලිංගික අපයෝජනවලට ලක්වන්නේ ගැහැණු ළමුන්ය.**
- **වර්තමානය වන විට ළමා ලිංගික අපයෝජන වල ප්‍රමාණය ඉහළ ගොස් ඇත. එමෙන්ම ළමා අපයෝජන වාර්තාකරණයේ වැඩිවීමක්ද දක්නට ඇත. මෙය සංඛ්‍යා දත්ත අනුව ගම්‍ය වේ.**
- **ළමා අපයෝජන දැනුම්දීම සඳහා ඇති ක්ෂණික දුරකථන අංකය වන 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය ගැන තවදුරටත් ප්‍රජාව දැනුවත් කළ යුතුය.**
- **ළමා ලිංගික අපයෝජකයින්ට එරෙහිව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නීතිය ප්‍රමාණවත් නොවේ.** නියැදියෙන් 73%ක්ම මෙම මතයට එකඟ විය. එමෙන්ම මේ පිළිබඳව සම්පත්දායකයන් යම් යම් පරස්පර අදහස් එල කරන ලදි. ඇතැමුන්ගේ අදහස වූයේ ලංකාව තුළ ළමා ලිංගික අපයෝජනයන්ට එරෙහිව දැනට පවතින නීතියවත් නිසි පරිදි ක්‍රියාත්මක නොවන බවයි.
- **රටතුළ ක්‍රියාත්මක සංස්කෘතික සීමාවන් ළමා ලිංගික අපයෝජන වල වර්ධනයට හේතු වේ.** නියැදියෙන් 78%ක්ම මීට එකඟ වූ අතර, සියලු සම්පත්දායකයන්ගේ මතයද එයම විය.
- **ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය හා ළමා ලිංගික අපයෝජන වැඩිවීම අතර සම්බන්ධතාවයක් ඇත.** ළමුන්ගේ ලිංගිකත්වය හුවා දක්වන ඡායාරූප, විඩියෝ වැනි ප්‍රකාශන ජනමාධ්‍ය තුළ පළකිරීම වර්තමානය වන විට සිදුවෙමින් පවතී. එය සිදු නොවිය යුත්තකි.
- **ළමා ලිංගික අපයෝජන අවම කිරීම සඳහා ළමුන් සම්බන්ධව කටයුතු කරන සියලු ආයතන වල සහභාගීත්වයෙන් හා එකඟතාවයෙන් ළමා අපයෝජන වාර්තා කිරීම සම්බන්ධයෙන් ජාතික**

**ප්‍රතිපත්තියක් සැකසිය යුතුය.** එය රාජ්‍ය ප්‍රතිපත්තියද විය යුතු අතර සියල්ලටම පෙර "ළමයා" යන සංකල්පයේ සිට එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය.

**සමාලෝචනය**

වර්තමානයේ ළමා අපයෝජන වාර්තා කිරීම පිළිබඳ බොහෝ කරුණු මා විසින් "මුද්‍රිත මාධ්‍ය මගින් ළමා අපයෝජන වාර්තාකරණයේදී ඡායාරූප භාවිතයේ ස්වභාවය" නැමති මෙම පර්යේෂණය තුළින් ඉදිරිපත් කරන ලදී. එම කරුණු කාරණා විමසා බැලිමේදී පැහැදිලිව පෙනී යන කරුණක් වන්නේ වර්තමාන මුද්‍රිත මාධ්‍ය ළමා අපයෝජන වාර්තා කිරීමේදී බොහෝ විට එම සිදුවීමට අදාළ ඡායාරූප යොදාගනු ලබන අතර එම ඡායාරූප යොදාගැනීම තුළ ළමා අපයෝජන සිදුවීම් වල වර්ධනයට මෙම වාර්තාකරණය ප්‍රධාන හේතුවක් වන බවයි. මෙම තත්වය ඇතිවීමේ ප්‍රධාන හේතුව ලෙස පෙනී යන කරුණු වන්නේ ළමා අපයෝජන සම්බන්ධයෙන් සමාජය තුළ ඇති නොදැනීම, ළමා අපයෝජන වාර්තාකිරීමට අදාළ මාධ්‍ය සතු, නීති රීති සම්බන්ධයෙන් ඇති නොදැනුවත්කම, ඡායාරූප යොදාගැනීමෙන් ඇතිවන බලපෑම පිළිබඳව අවබෝධයක් නොවීම, ළමා අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව අවබෝධයක් නොමැති වීම පෙන්වා දිය හැකිය.

මෙම තත්වය අවම කිරීම සඳහා මෙම ඉහත මා විසින් දක්වන ලද කරුණු කාරණා පිළිබඳව නිවැරදි දැනුමක් මහ ජනතාවට මෙන්ම මුද්‍රිත මාධ්‍ය වල වාර්තාකරණ කාර්යයෙහි යෙදෙන ජනමාධ්‍යවේදීන්ට සහ ළමයින් සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන වල නිලධාරීන්ව වෙත ලබා දිය යුතු අතර ළමා අපයෝජන වාර්තාකරණය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් විය යුතුය. ඒ සඳහා පහත ආයතන එකතු විය යුතුය.

- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
- අධිකරණ අමාත්‍යාංශය
- ජනමාධ්‍ය අමාත්‍යාංශය

ඒ තුළින් රටේ අනාගත දරු පරපුර වෙනුවෙන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් තොර වූ යහපත් සමාජ පසුබිමක් බිහිවනු නොඅනුමානය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


1. අල්විස්, ලලනි: 2013, ළමා අපචාර පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්, සමාජ විද්‍යාපති උපාධි නිබන්ධනය, කැලණිය විශ්වවිද්‍යාලය.
2. කරුණානායක, කේ.: 1998, අපරාධ බාල අපරාධ හා පුනරුත්ථාපනය, පුබුදු මුද්‍රණ ශිල්පියෝ, මාකෝල.
3. කුමාර, එස්: 2002, ළමා අයිතිවාසිකම්, කර්තෘ ප්‍රකාශන, මොරටුව.
4. කුමාර, ඩී: 2001, ළමා ලිංගික අපයෝජන වල ස්වරූපය, කර්තෘ ප්‍රකාශන, කඩුවෙල.
5. කුරේ, නිරංජන්: 2011, අත්‍යවශ්‍ය ලිංගික දැනුම, මානව අයිතිවාසිකම්, සෑම් ප්‍රකාශකයෝ, කොළඹ 04.
6. කුලතිලක, බණ්ඩාර: 2006, ළමයා හා අපයෝජන, කර්තෘ ප්‍රකාශන, මහරගම.
7. වර්ණකුලසූරිය, නිසිත:1992, චලන චිත්‍රයේ කතාව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ

# Research on children subjected to harassments in Schools (Based on the complaints reported to the National Child Protection Authority 1929 Child Helpline in 2017)

**Senaka Sudusinghe**

senakapsy@gmail.com

*Abstract*

This research focused on physical punishment experienced by children in schools and attempted to explore the punishment given to school children by their teachers.

Central Record Room of the Child Protection Authority states that they receive complaints of corporal punishment in schools through 1929 Child Help Line. The complaints received to the 1929 Child Help Line in 2017 considered for the study. In this study it was attempted to draw the attention of the school authorities to engage in other alternative methods to discipline the children rather than practicing corporal punishment in schools and to study the public opinion on this issue.

The research is a qualitative research. Interviewing method used as a qualitative research method. The teachers who were accused by the complaints made to the National Child Protection Authority in 2017 had been interviewed. 20 complaints out of 340 had been selected by provincial level for this study. The consent of the teachers was obtained prior to telephone interviews were conducted. In the interviews, attitudes of the teachers on practicing physical punishments to children were examined.

Complaints reported through 1929 Child Help Line used as primary data source. Articles, Circulars and legal Provisions issued on corporal punishment used as secondary data. Purposive sampling method was used to select the sample.

The study focused to analyze the nature of complaints, types of punishments, reasons and attitudes of teachers toward corporal punishment through District and Divisional level. The research makes an effort to find sociological aspect of why children are subjected to harassments.

**Keywords**

Child, Child Abuse, Corporal Punishment, Children Subjected to Harassement, Social Attitudes

## Introduction

The research covers the broader subject of "Imposing punishments on children at school." Principal and teachers are primarily responsible for the care and security of children at school. However, due to various reasons and personalities, school children are subjected to different kinds of punishment.

The study attempts to look into the punishments imposed by teachers on children at school, Teachers punished children for different activities and behaviors depicted by the children.

Children spend most of their afternoon in school and the responsibility of child care and security falls on school authorities, the principal and the teachers. However, the complaints related to children being punished at schools imply that the protection right of children is problematic. Further, according to the legal context of Sri Lanka, cruelty to children is a punishable offence. It has been emphasized by the constitution of Sri Lanka.

**"No person shall be subjected to torture or to cruel, inhuman or degrading treatment or punishment"**

- *(Article 11 of the Constitution of Democratic Socialist Republic of Sri Lanka 1978)*

Furthermore, Article 19 of the United Nations Convention on the Rights of the Child emphasizes that children have a right to be protected from abuse and neglect.

There is a conflict in terms of the legal and cultural backgrounds in Sri Lanka when it comes to practicing punishments on children at school. In some cases, the focus is more on the cultural values as opposed to legal repercussions. Societal attitudes also have a major role to play when it comes to imposing punishment in children.

The responsibility of protecting school children from various forms punishments regardless of their age, class, creed, colour, party, class or status is immense. Emphasizing that responsibility and building the background in the school to protect the rights of children without having to subject to punishment in school is a necessity of the era.

**Objectives of the Study**

- To examine the causes why school children are subjected to punishments
- To find out different kind of punishments being given to school children
- To study teachers' attitudes towards children being punished by teachers.

**Methodology of the Study**

This study was based on the qualitative research method. Interviews were conducted to collect data for the research. Teachers who have been accused of punishing students based on the complaints reported at NCPA 1929 child hotline service were interviewed. Before conducting the interviews the consent has been taken.

Complaints that were reported through 1929 Hotline service in NCPA were used as primary data. Articles, Circulars and legal provisions that were issued for corporal punishment have been used as secondary data.

All 340 complaints reported to the NCPA 1929 hot line in 2017 imposing punishment for children in school were used as the basic study. 20 provincial cases out of listed complaints have been used for further study. The research was done in order to find out the different causes of punishments, reasons for them and sociological factors.

**Results of the study**

The total numbers of complaints were 340. It was analyzed to find the different causes .Total number of telephone calls were 283 and written letters send by 41 people. There were 72 anonymous complaints and 284 complainants revealed their identities. As a percentage, 80% stated their names when they lodged complaints and 20% remained anonymous.

Corporal punishment victims had been analyzed according to their age. 89 children were punished between the age group 6 - 10. It was observed that there are 96 victims in the age group 11-15 and 44 children were punished in the 16-18 age group.

*Chart 1: Complaints reported to NCPA and referral of necessary unit for intervention related to corporal punishments*

| Referral Unit | Police Special Investigation Unit | Law Enforcement Unit | Psychosocial Unit | Legal Unit |
|---|---|---|---|---|
| Number of Complaints | 111 | 213 | 15 | 8 |

Most of the complaints have been directed to Law Enforcement unit. Breakdown of complaints according to district is as follows.

*Chart 2: Reported cases by District Level.*

| District | No of Complains |
|---|---|
| Ampara | 6 |
| Batticaloa | 9 |
| Anuradhapura | 13 |
| Badulla | 8 |
| Colombo | 66 |
| Galle | 19 |
| Gampaha | 38 |
| Hambantota | 12 |
| Jaffna | 9 |
| Kaluthara | 20 |
| Kandy | 17 |
| Kegalle | 6 |
| Kilinochchi | 5 |
| Kurunagala | 32 |
| Mannar | 1 |

| District | No of Complains |
|---|---|
| Matale | 8 |
| Monaragala | 8 |
| Mulathivu | 5 |
| Nuwaraeliya | 6 |
| Polonnaruwa | 6 |
| Puttlam | 14 |
| Rathnapura | 15 |
| Trincomalee | 6 |
| Vavunia | 2 |

Most number of cases of corporal punishment in schools was reported from Colombo district and it is 66 cases. 38 cases and 32 cases were reported from Gampaha and Kurunegala districts respectively. Complaints received according to the Divisional secretariat divisions are as follows.

Chart 3: Complaints received according to the Divisional Secretariat

| **Divisional Secretariat** | **Number of Complaints** |
|---|---|
| Uhana | 1 |
| Kalmune | 3 |
| Mahaoya | 1 |
| Anuradapura | 1 |
| Nuwara Gampalatha East | 1 |
| Palagala | 3 |
| Madawchchiya | 1 |
| Padawiya | 2 |
| Nochchiyagama | 2 |
| NuwaragamPalatha Central | 1 |
| Haldumulla | 1 |
| Mahiyangana | 2 |
| Passara | 1 |
| Meegahakiula | 1 |
| Koralepattu | 1 |
| Chenkaladi | 3 |
| Eraurpattu | 2 |
| Nuwaragam Palatha East | 1 |
| Homagama | 4 |
| Maharagama | 4 |
| Kolonnawa | 1 |
| Sri Jayawardanapura | 7 |
| Rajagiriya | 1 |
| Negombo | 1 |
| Moratuwa | 2 |
| Kaduwela | 3 |
| Thibirigasyaya | 6 |
| Seethawaka | 1 |
| Kesbewa | 1 |
| Seethawaka | 1 |
| Dam Sreet | 3 |
| Rathmalana | 1 |
| Benthota | 1 |
| Hikkaduwa | 1 |

Above information reveals that most number of cases of corporal punishment in schools reported from Sri Jayawardenapura Kotte divisional secretariat and it is 07 cases. 06 cases were reported

from Thimbirigasyaya Division and 04 cases each were reported from Homagama and Maharagama Divisional Secretariats.

The attitudes of punishing students in school were collected from the teachers, through phone conversations. According to the evaluation of the details 6 among the 10 teachers accepted that they punished the students in school, which is 60 in percentage.4 among the 10 teachers rejected the accusation, which is 40 in percentage. 3 among the 4 who rejected the accusation said that they are falsely accused and one among them accepted that he/she had punished the student. Also it states that 6 teachers had penalized the students. Among these 10, one is a principal, 6 are male teachers and 3 are female teachers.

According to the statements these are the reasons to punish the students;

1) Behaving against the disciplinary rules - Number of teachers who punished children-03
2) Lack of knowledge on laws against corporal punishment - Number of teachers who punished children -03
3) Since the students were uncontrollable - Number of teachers who punished children - 01
4) Punished students for being disobedient - Number of teachers who punished children - 01

Those who participated in the research are aware of the circular which was issued by the Ministry of education with regard to the penalization of students. Amidst these teachers, two stated that they knew about the circular from the early stages. The other 8 were not aware of the issued circular until 2017. It is very evident that they were less concerned about the above issued circular. Through this evaluation it is very clear that the attitude of the teachers have affected the penalization of the students.

So far the interventions for 105 reported complaints have been completed and interventions for 235 complaints are still in progress.

**Discussions/Summary**

According to the data analysis of research done on corporal punishment in schools, based on the complaints received through 1929 Child Help Line of NCPA in 2017, 284 personals has made complaints with their identity (80% of the total complaints) and 72 had been made (20% of the total complaints) anonymously. So it is evident that people had protested corporal punishment in schools and also taken legal actions against them. But 20% of them had not revealed their identity due to legal, social and attitudinal reasons.

- It is noted that children between the ages 11-15 had received corporal punishment in the school premises and it is 42%of the total incidents.
- 66 children of Colombo district had received corporal punishment inside their schools.
- So it can be noted that children of western province had received corporal punishments in the school premises.
- Number of children received corporal punishments inside their schools according to the Divisional Secretaries of Colombo district is - Kotte 07, Thimbirigasyaya 06, Homagama 04, Maharagama 04, when exploring the attitude of the teachers who had practiced

corporal punishment in schools and it was noted that 60% of them had admitted their mistakes and at present they are well aware of the content of all the circulars issued by the Ministry of Education against corporal punishment in schools. But it is hard to believe that teachers are unaware of the circulars issued in 2005, 2011 and 2006. So it can be concluded that practicing corporal punishment in schools is due to their personal attitudes and feelings.

- So this research reveals that personality of the teachers and their authoritative power influenced their practice of corporal punishment in schools. This had been confirmed by the French philosopher Paul Michel Foucault.

## Recommendations

- Raising awareness to change public opinion on corporal punishment in schools
- Establish the neccessity of taking legal and disciplinary actions against teachers those who practice corporal punishment in schools
- Awareness programs and creative activities needed to be organized by the Ministry of Education and other relevant officials to discipline school children without giving corporal punishment in schools.
- Introducing positive measures to maintain discipline in the school without corporal punishment.
- Follow up whether the guidelines issued by the Ministry of Education against corporal punishment in schools is being implemented
- Empower the public against corporal punishment in schools.
- Draw the attention of the government, develop policies, conduct awareness programs and organize workshops for attitudinal change of the people against corporal punishment in schools.
- Empower and coordinate the state, non-state and voluntary organizations to build a child friendly environment at schools.

## Bibliography


1. අපොන්සෝ ඒ හර්බට්, සිල්වා ද හරේන්ද්‍ර, 1998, ඔබේ දරුවා හා ඔබේ පවුල, අපොන්සෝ ද සිල්වා හා ඇලෝසියස්.
2. කුමාරඑස්, 2002, ළමා අයිතිවාසිකම්, කතෘ ප්‍රකාශන, මොරටුව.
3. කුරේ නිරංජන්, 2011, අත්‍යවශ්‍ය ලිංගික දැනුම, මානව අයිතිවාසිකම්, සෑම් ප්‍රකාශකයෝ, කොළඹ 04.
4. කුරේ නිරංජන්, 2001, ශ්‍රී ලංකාවේ සිදුවන ළමා අපයෝජන, පීස් ප්‍රකාශන, කොළඹ 04.
5. කුලතිලකබණ්ඩාර, 2006, ළමයා හා අපයෝජන, කතෘ ප්‍රකාශන, මහරගම.
6. ගුණසේකරඋපාලි, 1997, ගුරුවරුන් පර්යේෂකයින් ලෙස, සුහෙර ප්‍රකාශකයෝ, නුගේගොඩ.
7. ගුණසේකර ධනපාල, 2002, ළමයි උගන්නේ ජීවිතයෙනි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, මුල්ලේරියාව.
8. තිලකරත්නදි.ම, 2007, අපේ ළමයි, විශේෂිත දරුවන් සංවර්ධනයට අත්වැලක්, සමයවර්ධන ප්‍රකාශනයේ, කොළඹ 10.
9. ද සිල්වා හරේන්ද්‍ර, 2000, පාසල් තුළ ළමා ආරක්ෂාව ළමා අයිතිවාසිකම් හා ළමා සහභාගීත්වය පිළිබඳ අත්පොත, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර.
10. ද සිල්වා හරේන්ද්‍ර, 2001, දරුවන් සමඟ වීඩියෝ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සඳහා උපදෙස්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර.

11. පතිරණ බුද්ධිප්‍රභා, 2008, අපයෝජනයට ලක් වූ දරුවන් සුවපත් කිරීමට අතදෙමු. Save the Children, කොළඹ 10.
12. ප්‍රේමසිරි එස්, 2006, ළමා අපයෝජන පිටුදකිමු, සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ 10.
13. මාරසිංහ චාරිකා, 1995, ළමා අපයෝජන පිළිබඳ අත්පොත, පොලිස් දෙපාර්තමේන්තුව, කොළඹ 01.
14. මාරසිංහචාරිකා, 2012, ළමා හා කාන්තා දරු ආරක්ෂණය පිළිබඳ නීති නාමාවලිය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල.
15. වික්‍රමරත්න පුබුදිනී, 2009, ශ්‍රී ලංකාවේ ළමා උරුම හිමිකම්, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, ශ්‍රී ලංකාව.
16. විජේසේන රොහාන්, 2009, කුලවැද්දීම, ළමුන්ගේ භාරකාරත්වය සහ ළදරු ජීවිත විනාශකිරීම සම්බන්ධ නීතිය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර.
17. The South Asian Report, on the Child-Friendliness of Government, 2013, Save the children.
18. De Silva, Harendra, 2000, Child Abuse, National Child Protection Authority, Sri Lanka.
19. Reporting on Child Abuse, 2012, National Child Protection Authority, Sri Lanka.
20. Unicef, 2003, United Nations Convention on the Rights of the Child (UNCRC), Colombo.
21. Wedlock K and Kannangara N: 2002, National Child Protection Authority, Sri Lanka. Colombo, 2002.
22. ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහය (සංශෝධන)පනත: 1995, අංක 22, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ 05.
23. ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත: 1998, අංක 50, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු, කොළඹ 05.
24. ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහය (සංශෝධන)පනත: 2006, අංක 16, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්ව, කොළඹ 04.
25. ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ අපරාධ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණය කඩිනම් කිරීම හා ළමා අපයෝජිත වින්දිතයින් ද්විතීයික වින්දිතභාවයට ලක්වීම වැළැක්වීමේ ජාතික ව්‍යාපෘතිය, 2013, අධිකරණ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය.
26. ශ්‍රී ලංකාවේ ළමයින්ගේ යහපැවැත්ම පිළිබඳ සංවේදීතාව ගොඩනැංවීම- නීතිය ක්‍රියාත්මක කරන නිලධරයන් සඳහා පුහුණු අත්පොත, 2014 ප්‍රථම මුද්‍රණය, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
27. ළමා අපයෝජන සිදුවීමක් පිළිබඳව අපරාධ පරීක්ෂණයක පැවැත්වීමේදී පොලිස්නිලධාරීන් පිළිපැදියයුතු මූලධර්ම සහ ගත යුතු පියවර, 2017 ප්‍රථම මුද්‍රණය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය.

# මානව ප්‍රතිශක්තිකරණ ඌනතා වෛරසය (HIV) ආසාදිත, දෙමාපියන්ගේ පවුල් වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන සමාජීය හේතු පිළිබඳ විග්‍රහයක්

එම්.කාංචනා සුබසිංහ
subasinghamk@gmail.com

## හැඳින්වීම

"අව්‍යාජත්වයේ සුන්දරත්වයේ විශ්වමය සංකේතය ළමයාය" "මානව ශිෂ්ටාචාරයේ තීරණාත්මක සාධකය ළමයාය" "විශ්වයේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය ළමයාය" මෙවන් සාහිත්‍ය නිර්මාණයන්ට පාත්‍ර වූ ළමයා නීතියට අනුව අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු බව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 01 වගන්තිය තුළ අර්ථ දක්වා ඇත. තව දුරටත් එහි සඳහන්ව ඇත්තේ ළමයෙකු හට එම ප්‍රඥප්තියේ ඇතුළත් සියලු අයිතිවාසිකම් හිමිවිය යුතු බවයි. සමස්තයක් ලෙස වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙක් ළමයෙකු වුවද, විවිධ අණ පණත්වලට අනුව වයස් සීමාවේ වෙනස්කම් දක්නට ලැබේ.

මානව ප්‍රතිශක්තීකරණ ඌනතා වෛරසය (එච්.අයි.වී) වර්තමාන සමාජයේ දැඩි ලෙස ජාතික හා ජාත්‍යන්තර තලයේ අවධානයට ලක්ව ඇති කරුණක් බවට පත්ව ඇත. නිරාවරණය වීමකින් පසුව වෙනත් තැනැත්තෙකුට සක්‍රියව බෝවීම සඳහා වැඩි ප්‍රවණතාවයක් ඇත්තේ යම් දේහ තරලවල පමණි. නිසි පරිදි ඖෂධ නොගැනීම තුළින් ශරීරයේ ප්‍රතිශක්තීකරණ පද්ධතියට හානි පමුණුවන අතර මරණයට පවා පත්වීමේ හැකියාව ඇති නිසා මේ පිළිබඳ වැඩි අවධානයට ලක්වීම සිදුව ඇති බව විද්වතුන්ගේ අදහස වී ඇත.

එච්.අයි.වී. ආසාදිත දරුවෙකු පාසැලෙක් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන සමාජීය හේතු පිළිබඳ විග්‍රහ කිරීමේදී ළමයා, ළමා අයිතිවාසිකම්, ළමයෙකු සතුව ඇති අධ්‍යාපන අයිතිය, එච්.අයි.වී. හා ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ඒ සඳහා ඇති තත්ත්වය පිළිබඳව හඳුනා ගැනීම අවශ්‍යය. ඒ අනුව,

" ළමයා" පිළිබඳ හඳුන්වා දීමේදී, සාමාන්‍ය නීතිමය තත්ත්වය එසේ වුවද, 1939 අංක 48 දරණ ළමා හා යෞවනයින් පිළිබඳ ආඥාපනත, 1954 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ හානිකර ප්‍රකාශන පනත, 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවකයන් පිළිබඳ පනත, තුළ ළමයෙකු යන්න අවුරුදු 14 සීමාව දක්වා ඇත. අවුරුදු 14-16 දක්වා තැනැත්තා යෞවනයා ලෙස හඳුන්වා ඇත. මීට අමතරව 1956 අංක 47 දරණ කාන්තාවන් යෞවනයින් හා ළමයින් සේවයේ යෙදමේ පනත හා 1964 අංක 43, 1973 අංක 29, 1984 අංක 32 හා 2006 අංක 24 දරණ සංශෝධන තුළ ළමයා යන සීමාව අවුරුදු 14 ට අඩු ලෙසත්, යෞවනයා යන්න අවුරුදු 14-18ත් තැනැත්තෙකු ලෙස පෙන්වා දී ඇත. තවද, 1841 අංක 04 දරණ අයාල ආඥා පනත තුළ ගැහැනු ළමයා අවුරුදු 16 ට අඩු තැනැත්තෙක් අර්ථ ගැන්වේ. මීට අමතරව 1883 අංක 2 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ හා එහි සංශෝධන 1995 අංක 22, 1998 අංක 29, 2002 අංක 12 හා 2006 අංක 16 දරණ සංශෝධිත පනත් තුළ සාපරාධී වගකීම් දැරීම සඳහා අවම වයස අවුරුදු 8ක් ලෙසද, අවුරුදු 8-12 ත් අතර ළමයෙක් යමක් තේරුම් ගැනීමට තරම් පැසුණු බුද්ධියක් නොමැති නම් එම වගකීමෙන් නිදහස් වේ යන්න සඳහන් වේ. මීට අමතරව, කම්කරු ආඥා පනත අනුව අවුරුදු 14ට අඩු තැනැත්තෙක් සේවයේ යෙදවීම තහනම් කොට ඇති අතර, අනිවාර්ය අධ්‍යාපන පනත තුළ අවුරුදු 13ක් අනිවාර්ය අධ්‍යාපනයේ නිරත වීම අත්‍යවශ්‍ය බව දක්වා ඇති අතර, එම වයස අවරුදු 16 වේ. විවාහ ආඥා පනත තුළ විවාහ වීමේ වයස අවුරුදු 18 ලෙස දක්වා ඇත.

ඒ අනුව මානව ප්‍රතිශක්තීකරණ ඌනතා වෛරසය ආසාදිත දෙමාපියන්ගේ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන අයිතිය පිළිබඳ පුළුල් විෂය ධාරාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී,

එක්සත් ජාතීන්ගේ විශ්ව ළමා ප්‍රඥප්තියේ 28, වගන්තියේ සඳහන් අධ්‍යාපන අයිතිය පිළිබඳ සලකා බැලීම වැදගත් වේ. ,

"අධ්‍යාපනය ලැබීමට සියලු ළමයින්ට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත්, එය නොමිලේ ළමා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීමයි." යනුවෙන් සඳහන් වේ.

තව දුරටත්, එක්සත් ජාතීන්ගේ විශ්ව ළමා ප්‍රඥප්තියේ 29 වගන්තියේ අධ්‍යාපන පරමාර්ථ තුළ සඳහන් කරුණු පිළිබඳ සැලකීමේදී,

"අධ්‍යාපනයේ පරමාර්ථ වනුයේ ළමයාගේ පෞරුෂත්වය, දැනුම,කුසලතා හා මානසික ශාරීරික හැකියාවන් පරිපූර්ණ ලෙස වර්ධනය කිරීමයි. වගකීමෙන් සාමකාමීව නිදහස් සමාජයක ජීවත් වීම ද අනෙක් පුද්ගලයාගේ අයිතිවාසිකම් වටහා ගෙන පරිසරයට ගරු කරමින් ජීවත් වීම ද අධ්‍යාපනය තුළින් ළමයින් සූදානම් කළ යුතුය." යනුවෙන් සඳහන් කොට ඇත.

එච්.අයි වී ආසාදිත ළමයෙකු වුවද ඔහුට හෝ ඇයට වෙනස් කොට සැලකිය නොහැකි අතර, පාසැලෙන් බහිෂ්කරණය වීමේ අයිතියක් නොමැත. එසේ වුවහොත් ළමයාගේ අයිතිවාසිකම් කඩ වීමකි.

තවද, එච්.අයි.වී. පිළිබඳව හා ඒ සඳහා ලෝකයේ ඇති ප්‍රවණතාවය පිළිබඳව අවධානය යොමු කිරීම ද මෙහිදී සිදුකරන ලදී.

සී.අයි.ඒ.ලෝක තොරතුරු සංග්‍රහය (අන්තර් ජාල දත්ත යාවත්කාලින කිරීම 2018 ජනවාරි 01 දින) විමර්ශනය කිරීමේදී ලොව පුරා එච්.අයි. වී. ආසාදිතයන් බිලියන 20කට ජනගහනයක් ජීවත් වන බව වාර්තා වේ. ලෝකයේ අන් රටවල් අතර සංසන්දනය කිරීමේදී දකුණු අප්‍රිකාවේ 7100,000ක් ද, නයිජීරියාව 3200,000ක්ද, ඉන්දියාව තුළ 2100,000ක්ද, මොසැම්බික් 1800,000ක්ද, කෙන්යා හි 1600,000ක්ද, ටැන්සානියාව 1400,000ක්ද, උගන්ඩාව 14000,000ක්ද, සිම්බාබ්වේ 1300,000ක්ද, සැම්බියාව 1200,000ක්ද, මුලාවි 1000,000ක්ද, බ්‍රසීලය 830,000ක් ආදී ලෙස වැඩි වශයෙන් මෙය ආසාධිත පුද්ගලයන් ජීවත් වන රටවල්11 අතර සිටී. මීට අමතරව ඉතියෝපියාව 710,000ක්ද, ඉන්දුනීසියාව 620,000ක්ද, තායිලන්තය 130,000.ක්ද, හයිටි රාජ්‍ය 150,000ක්ද, පකිස්ථානය 130,000ක්ද, මැලේසියාව 97000ක්ද, ඉරානය 66000ක්ද, පිලිපීනය 56000ක්ද, සවුදි අරාබිය 8200ක් ආදී වශයෙන් රටවල් 229ක් තුළ එච්.අයි. වී. ආසාදිතයින් වාර්තා වන ප්‍රමාණය හා ශ්‍රේණිගත කිරීම් පිළිබද සී.අයි.ඒ.ලෝක තොරතුරු සංග්‍රහය තුළ දක්වා ඇත. මේ අතරින් 2018 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තුළ එච්.අයි.වී. ආසාදිතයන් 4000ක් වාර්තා වී ඇති බවත් එය ලෝකය හා සැසඳීමේදී ශ්‍රේණිගත කිරීම් තුළ 108 ස්ථානයේ පසුවන බවත් සී.අයි.ඒ. ලෝක තොරතුරු සංග්‍රහයේ වැඩිදුරටත් සදහන් වේ.

තව දුරටත් මෙම තත්ත්වය පිළිබද ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබද විමසීමේදී, එච්.අයි.වී. ආසාදිත ළමුන් 80ක් සිටින බවත්, එයින් 24 දෙනෙකු මේ වන විට නිසි ප්‍රතිකාර සඳහා යොමු වී ඇති බව වාර්තා වේ. (ජාතික ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකයේ අධ්‍යක්ෂ සිසිර ලියනගේ මහතා 2017 ජූනි 24 අන්තර්ජාල වෙබ් අඩවි) මීට අමතරව විවිධ පුවත්පත් හා විමර්ශන පරිශීලනයේදී පාසැල තුළින් නෙරපූ ළමුන් පිළිබඳ පුවත් අසන්නට ලැබේ. කුලියාපිටියේ ආසාදිත යැයි සැක කළ දරුවා පිළිබඳ (ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 1929 ළමා උපකාරක දුරකථන සේවය හා විවිධ මාධ්‍ය), ගනේමුල්ල ප්‍රදේශයේ දැරිය සම්බන්ධ පුවත් (1929 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 1929 ළමා උපකාරක දුරකථන සේවය හා විවිධ මාධ්‍ය) දක්නට ලැබේ. මෙම සිද්ධීන් ජාතික ජාත්‍යන්තර තලයට ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් හා මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ අවධානය යොමු වූ අවස්ථාවන් ලෙස නීති ඉතිහාසයට එක් වූවා සේම අලුතින් ප්‍රතිපත්ති පවා සංශෝධනය වීමට බලපෑ සාධක විය.

එහෙත්, මෙසේ ළමුන් පාසැලින් බහිෂ්කරණය සිදුකිරීමට හේතු මොනවාද? එම හේතු අධ්‍යයනය කොට ගැටලු හඳුනාගනිමින් ඒ සඳහා පිළියම් සෙවිය යුතු කාලය එළඹී ඇත. එය දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමේදී අවධානය යොමු කළ යුතු වැදගත් පැතිකඩක් බව අවබෝධ විය. වර්තමානයේ කෙතෙක් එච්.අයි.වී. ආසාදිතයින් සම්බන්ධ පර්යේෂණ සිදුවුවත්, එවන් පවුල් වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපෑ හේතු හා ඒ සඳහා පිළියම් යෝජනා ඉතා විරලය. එම ඌණ පූර්ණය සම්පූර්ණ කරනු වස් මා විසින් එච්.අයි. වී. ආසාදිත පවුල්වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීමට බලපානු ලබන සමාජීය හේතු පිළිබඳ විග්‍රහය ඉදිරිපත් කරනු ලබන අතර, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ළමා හිමිකම් හා ළමා ආරක්ෂාව සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ අධ්‍යයන අවශ්‍යතාවය ද සම්පූර්ණ කරනු පිණිස ද, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කුරුණෑගල දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරී ලෙස විෂයානුබද්ධ පර්යේෂණයක් ද ලෙස මෙම අධ්‍යයනය සිදුකරන ලදී.

එච්.අයි.වී ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන සමාජ විද්‍යාත්මක හේතු පිළිබඳ විග්‍රහ කිරීමේදී මෙහි වැදගත්කම මේ අයුරින් පෙන්වා දිය හැකිය.

එච්.අයි.වී. ආසාදිතයින් පිළිබඳ ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ විවිධ පොත්පත්, පර්යේෂණ දක්නට ඇතත්, ළමයා සම්බන්ධයෙන් වෙනම ම සඳහන් කරන ලද සාහිත්‍ය විමර්ශනයන් විරලය. එච්.අයි.වී. ආසාදිතයින් සම්බන්ධ රචනා කරන ලද පොත් පත් තුළ ආසාදිත ළමයින් සම්බන්ධයෙන් ද අවධානය යොමු කොට ඇති බව එම පොත් පත් පරිශීලනයේදී අවබෝධ විය.

1995 පීස් නම් රාජ්‍ය නොවන සංවිධානය විසින් එළි දක්වන ලද **The Sexual Exploitation In Sri Lanka** කෘතියේ 20 වන පරිච්ඡේදයේ **Dangers of AIDS/STD** තුළ සඳහන්ව ඇත්තේ ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සමඟ ළමයින් ගණිකා වෘත්තියේ යෙදවීමේ වැඩි ප්‍රවණතාවයක් ඇති බවය. විදේශ සංචාරකයින් මෙරට පැමිණ ලිංගික කටයුතු සඳහා යොදවා ගැනීමට පහසුම කාණ්ඩය ළමයින් බවත්, ඔවුන් ඒ සඳහා පොළඹවා ගැනීමේ අපචාරී ක්‍රියාවක් බවත් සඳහන් වේ. මේ අතරින් ළමා පිරිමි ගණිකා වෘත්තිය සඳහා ශ්‍රී ලංකාවේ වැඩි ඉඩකඩක් ඇති බවත් ඒ තුලින් ළමයින්ට එච්.අයි.වී. ඒඩ්ස් ආසාදනය වීම සිදුවීම රටක් වශයෙන් විශාල ගැටලුවකට පත්ව ඇති බව ඇතුළත්ය. වෙරළාසන්න අඩු ආදායම් ලාභී දරුවන් එච්.අයි.වී. සඳහා වැඩි වශයෙන් ගොදුරු වන බව සඳහන් වේ. බොහෝ විට විදේශිකයන් විසින් ළමුන්ගේ දෙමාපියන්ට විවිධ ආර්ථික වාසි ලබා දී ළමයින් ගණිකා වෘත්තිය සඳහා යොදවා ගන්නා බව ද කෘතියේ ඇතුළත්ය. ළමුන් කිසිඳු පරීක්ෂා කිරීමකට ලක් නොවන අතර එච්.අයි.වී. ආසාදිතයින් බව හඳුනාගන්නේ වසර ගණනාවක් ගිය පසු බවත්, මේ තුළින් ළමයින්ගේ අධ්‍යාපනය විශාල බිඳ වැටීමකට ලක් වන බවත් සඳහන් වේ.

පීස් ආයතනය මගින්ම ප්‍රකාශයට පත්කොට ඇති "ඒඩ්ස් යනු මරණයයි" ග්‍රන්ථය පරිශීලනය කිරීමේදී සඳහන්ව ඇත්තේ, ඒඩ්ස් වැළැක්වීමට හෝ යම් අයෙකු එයින් ආරක්ෂා කිරීමට එන්නතක් දැනට නොමැති බවත්, එන්නතක් සොයා ගැනීමට පර්යේෂකටන් පර්යේෂණවල නිරත වන බවත්ය. එවැනි එන්නතක් සොයාගැනීමට වසර 10ක් පමණ ගත වනු ඇති බවට අනාවැකි පළ කර ඇති බවත්ය. එම නිසා මේ වන විට ඒඩ්ස් සඳහා සුවයක් නොමැති බවත් ඒ සඳහා වෙන් වූ පරීක්ෂණ පවා තවම නොමැති බවත් රෝගයේ ඇතැම් ආසාදන සඳහා ප්‍රතිකාර ඇති බවත් සඳහන් කොට ඇති අතර, ග්‍රන්ථය පුරාවටම එච්.අයි.වී. හා ඒඩ්ස් පිළිබඳව දැනගත යුතු කරුණු රැසක් අන්තර්ගත කොට ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ එච්.අයි.වී. ආසාදිත යැයි සැක කරමින් පාසැලට ඇතුළත් කර නොගත් දරුවකු සම්බන්ධව ගොනුකරන ලද නඩු වාර්තාව (**2016-03-14** දින) පරිශීලනය කිරීමේදී ලෝකයේ සියලු ළමුන්ට අධ්‍යාපනය සඳහා සම අවස්ථාවන් හිමිවිය යුතු බව සහතික කළ යුතු බව සඳහන් වේ. තවද, එච්.අයි.වී. සමග ජීවත්වන්නන්ගේ ගෞරවය සහතික කිරීම සිදුකළ යුතු බව හා වෙනස්කොට සැලකීම නොකළ යුතු බව දක්වා ඇත. දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වන බව හා මේ පිළිබඳ තව තවත් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය තුළ පැහැදිලි කරයි.

එච්.අයි.වී. ආසාදිතයින් පාසැලෙන් බහිෂ්කරණය වීම පිළිබඳ සාහිත්‍ය විමර්ශනය සිදුකිරීමේදී වඩාත් උපයෝගී කරගත් වාර්තාවක් ලෙස **National STD Policy** ජාතික ඒඩ්ස් ප්‍රතිපත්තිය පෙන්වා දිය හැක. මෙය ශ්‍රී ලංකා රජය මානව හිමිකම් තහවුරු කරනු වස් සම්පාදිත ප්‍රතිපත්තියකි. එච්.අයි.වී. සමග ජීවත්වන්නන්ට මුහුණ දීමට සිදුවන සමාජ වෙනස් කොට සැලකීම් හා අපකීර්තිය නවතාලනු පිණිස හා ඒ සම්බන්ධ අනෙකුත් සේවාවන් බලාත්මක කිරීම අරමුණු කර ගනිමින් මෙම ප්‍රතිපත්තිය සකස් කරන ලද්දක් බව එහි සඳහන් වේ. ජාතික ඒඩ්ස් ප්‍රතිපත්තිය තුළ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ, පුද්ගලයින්ගේ ජීවත් වීමේ නිදහස හා සුරක්ෂිතතාවය, මානවයාගේ ආත්ම ගෞරවය කෙලෙසීම් හෝ සමාජයෙන් දඬුවම් ලබා දීම, සැමට එක සමාන සාධාරණ නීතිය, වෙනස් කොට සැලකීම, අත්තනෝමතික බාධාවන් එල්ලවීම, පවුල් ජීවිතයට පෞද්ගලිකත්වයට ඇති නිදහසට ඇති අයිතිය, කැමති තැනක ගමනාගමනයට ඇති අයිතිය, නිදහසේ වැඩ කිරීමට ඇති අයිතිය, ආහාර ඇඳුම් පැළඳුම්, නිවාස, යහපත් දිවි පැවැත්මට ඇති අයිතිය, එච්.අයි.වී./ඒඩ්ස් පිළිබඳ තොරතුරු දැන ගැනීම හා සුරක්ෂිත ලිංගික සම්බන්ධතාවයක් සඳහා තොරතුරු දැනගැනීමට ඇති අයිතිය, කායික මානසික යහපැවැත්මට ඇති අයිතිය, ප්‍රජාව සමඟ සංස්කෘතික අවස්ථාවන්ට සහභාගි වීමට ඇති අයිතිය හා බෙදා හදා ගැනීමට ඇති අයිතිය, ආරක්ෂිත සෞඛ්‍ය ප්‍රවර්ධනයකට හා ලිංගික සම්ප්‍රේෂණයන් පාලනය කර ගැනීමට ඇති අයිතිය ආදිය පිළිබඳ මූලික අවධානය ලබා දී ඇති බව තහවුරු වේ. මේ තුළින් එච්.අයි.වී. ආසාධිතයෙකු සඳහා සැම ආකාරයේ අයිතිවාසිකමක්ම තහවුරු කිරීමට උත්සහ දරා ඇති බව නිරීක්ෂණය වේ.

2016.03.05 ඩේලි මිරර් පුවත්පතේ සුරනි පිලපිටිය නම් මාධ්‍යවේදිනිය විසින් රචිත **Chaos in Kurunegala over child's admission to a school** යන විශේෂාංගයේ එච්.අයි.වී. ආසාදිත දරුවා පාසැලෙන් බහිෂ්කරණය වීමට බලපා ඇති සමාජ කරුණු රැසක් පිළිබඳව විග්‍රහයක් කොට ඇත. නිලධාරීන්ගේ මැදිහත්කරණයන්, ළමයෙකුට ඇති අයිතීන් හා මානව අයිතීන් සුරක්ෂිත කළ යුතු ආකාරය පිළිබඳ විචාරාත්මක ලෙස සඳහන් කොට ඇත.

යම් යම් සිද්ධීන් පදනම් කර ගනිමින් විවිධ විද්වතුන් විසින් මේ පිළිබඳව සාකච්ඡාවන් සිදුකර තිබුණ ද එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම පිළිබඳ පර්යේෂණ මට්ටමේ අධ්‍යයන් විරල බැවින් මෙය වඩාත් වැදගත් අධ්‍යයනයක් බවද අවබෝධ වූ කරුණකි.

පර්යේෂණයේ අරමුණු ලෙස පෙන්වා දීමේදී;

- එච්.අයි. වී ආසාදිත දෙමාපියන්ගේ පවුල්වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන සමාජීය හේතු පිළිබඳ සොයා බැලීම.
- එච්.අයි.වී ආසාදිත පවුල්වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන හේතු පිළිබඳ එච්.අයි.වී. සමග ජීවත්වන පවුල් 10ක් ඇසුරෙන් විමසා බැලීම.
- එච්.අයි.වී ආසාදිත පවුල්වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන හේතු පිළිබඳ පාසැල් බලධාරීන් 03 දෙනෙකුගෙන් විමසා බැලීම.
- එච්.අයි. වී ආසාදිත පවුල්වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන හේතු පිළිබඳ මේ සම්බන්ධ කටයුතු කරනු ලබන වෛද්‍යවරුන් 3 දෙනෙකුගෙන් විමසා බැලීම.
- එච්.අයි.වී ආසාදිත පවුල්වල දරුවන් පාසැල තුළින් බහිෂ්කරණය වීමට බලපානු ලබන හේතු පිළිබඳ එච්.අයි.වී. ආසාදිතයන්ගේ සංගමයේ සභාපතිගෙන් විමසා බැලීම.
- විවිධ අධ්‍යාපන මට්ටම්, විවිධ රැකියා, විවිධ සමාජ මට්ටම් නියෝජනය කරන දෙමාපියන් 4 දෙනෙකුගෙන් විමසා බැලීම

මෙහිදී අරමුණු වන අතර, ඒ තුළින් එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැල් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන හේතු පිළිබඳව විග්‍රහ කිරීම සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ නියෝජනය වන පරිදි එච්.අයි.වී. ආසාදිතයන් සමඟ ජීවත් වන්නන්ගේ සංගමයේ ලියාපදිංචි පවුල් තුළ අනිවාර්ය අධ්‍යාපන වයසේ සිටින දරුවන්ගේ අත්දැකීම් අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගෙන ඇත.

වර්තමානය වන විට එච්.අයි.වී. ආසාදිතයින් ශ්‍රී ලංකාව තුළ 4000ක් පමණ ඇතැයි අනුමාන කරන අතර, දුන් 2700ක් පමණ ප්‍රතිකාර සඳහා යොමු වී ඇත. ඒ අතරින් 600ක් පමණ එච්.අයි.වී. ආසාදිතයන්ගේ සංගමයේ ලියාපදිංචි වී ඇති අතර, ආසාදිත දරුවන් 40ක් ද ආසාදිත පවුල්වල සාමාජිකයින් ලෙස පාසැල් යන වයසේ ළමුන් 226 ක් සංගමයේ ලියාපදිංචි වී ඇති බව අදාළ සංගමය සඳහන් කරයි. මේ තුළ ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ආසාදිතයන් ලියාපදිංචි වී ඇති අතර, එච්.අයි.වී. සමඟ ජීවත් වන්නන්ගේ සංගමයේ ලියාපදිංචි පවුල් තුළ දරුවන්ගේ අත්දැකීම් අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගෙන ඇත.

මීට අමතරව, වෛද්‍යවරුන්, පාසැල් බලධාරීන්, එච්.අයි.වී. ආසාදිතයන්ගේ සංගමයේ සභාපති හා දෙමාපියන් සහභාගී කර ගැනීම සිදුකරන ලදී.

### දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ නියදිය ලෙස එච්.අයි.වී. ආසාදිතයින්ගේ සංගමයේ ලියාපදිංචි, පාසැල් යන වයසේ දරුවන් සිටින පර්යේෂණය සඳහා කැමැත්තෙන් තොරතුරු ලබා දෙන පවුල් 10ක් ඇසුරෙන් සිද්ධි අධ්‍යයනය සිදුකර ඇත. ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකයේ සේවය කරනු ලබන වෛද්‍යවරුන් 3 දෙනෙකු, අධ්‍යාපන බලධාරීන් ලෙස අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු, විදුහල්පතිවරයෙකු හා ගුරුවරයෙකු, එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා දෙමාපියන්ගෙන් සිදුව ඇති බලපෑම පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා විවිධ රැකියාවන්, විවිධ සමාජ හා අධ්‍යාපන මට්ටම් නියෝජනය කරන පාසැල් යන වයසේ දරුවන් සිටින දෙමාපියන් හා එච්.අයි.වී. ආසාදිතයින් සමඟ ජීවත්වන්නන්ගේ සංගමයේ සභාපති සම්බන්ධ කර සිදුකරන ලදී.

### සිද්ධි අධ්‍යයන

එච්.අයි.වී. ආසාදිතයින්ගේ සංගමයේ ලියාපදිංචි, පාසැල් යන වයසේ දරුවන් සිටින පර්යේෂණය සඳහා කැමැත්තෙන් තොරතුරු ලබා දෙන පවුල් 10ක් පිළිබඳ සිද්ධි අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත.

### සම්මුඛ සාකච්ඡා

කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා ලෙස කුරුණෑගල ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකකයේ වෛද්‍යවරියන් තිදෙනාම සමඟ ද, පාසැල් බලධාරීන් වන, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන විදුහල්පති ,පාසැල් ගුරුවරයෙකු ද, දෙමාපියන් ලෙස විවිධ අධ්‍යාපන මට්ටම්, විවිධ රැකියා හා විවිධ සමාජ මට්ටම්

නියෝජනය වන අයුරින් කේවල සම්මුඛ සාකච්ඡාද, එච්.අයි.වී. ආසාධිත සංගමයේ සභාපති ද කේවල සම්මුඛ සාකච්ඡාවක් සඳහා භාජනය කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන සමාජීය හේතු පිළිබඳව විග්‍රහයන් සිදුකිරීමේදී සෞඛ්‍යමය හේතු, නීතිමය, සමාජ විද්‍යාත්මක,සමාජ සංස්කෘතික සාධක පිළිබඳව විග්‍රහ කර දැක්විය හැකිය. සෞඛ්‍ය හා නීතිමය කරුණු පිළිබඳව අවධානය යොමු කිරීමේදී අධ්‍යාපන පරිපාලන චක්‍රලේඛ වන 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන පණත, ඇතුළු අධ්‍යාපන පරිපාලන චක්‍ර ලේඛ, පිළිබඳ අවබෝධය, ළගම පාසැල, හොඳම පාසැල් පිළිබඳ සංකල්පය, සෞඛ්‍ය ප්‍රතිපත්ති, නඩු තීන්දු වගකිව යුතු රාජ්‍ය නිලධාරීන් හා බලධාරීන් ඍජු තීරණ නොගැනීම ආදී කරුණු ද, සමාජ විද්‍යාත්මක, මනෝ විද්‍යාත්මක හා සමාජ සංස්කෘතික හේතූන් යටතේ එච්.අයි.වී. ආසාදිත ළමයා පාසැලේ ඉගෙනීම පාසැලට අගෞරවයක් වීම, ළමයා හෝ එම පවුල ආශ්‍රය කිරීමෙන් සමාජමය අගෞරවයක් වේය සිතීම හේතුවෙන් වෙන්කොට සැළකීම, එච්.අයි.වී. දරුවෙකු වෙනුවෙන් හඬ නැගීම තුලින් එම පුද්ගලයා සමාජයෙන් කොන් වීම, බිඳුණු පවුල් පරිසරය (දික්කසාදය, වෙන්වීම,දෙවන විවාහය) මව/ පියාගේ අනියම් සම්බන්ධතාවයකින් උපන් දරුවෙකු වීම, පූර්ව විවාහ සම්බන්ධතා හෝ අවිවාහක මාතෘත්වය පිළිබඳ ඇති අව තක්සේරුව ලිංගික අධ්‍යාපනය පිළිබඳ ළමුන් සමඟ වැඩිහිටියන් විවෘතව කථා කිරීම සුදුසු නැති බව සිතීම ආදී කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සිදුකරන ලදී.

ඒ අනුව, එච්.අයි.වී. ආසාදනය වන ක්‍රම පිළිබඳ දැනුවත් භාවය අඩුකම හා නව ප්‍රවණතා පිළිබඳ නොදැනුවත් භාවය හේතුවෙන් ළමයින් පාසැලෙන් බහිෂ්කරණය වීමට හේතු වේය යන කරුණ විශ්ලේෂණය කිරීම සඳහා නියදිය වශයෙන් පාසැල් බලධාරීන් 5 දෙනෙකු, වෛද්‍යවරුන් තුන්දෙනෙකු දෙමාපියන් පස්දෙනෙකු,හා එච්.අයි.වී. සමඟ ජීවත් වන්නන්ගේ සංගමයේ සභාපති සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. පාසැල් බලධාරීන් පස් දෙනෙකුගෙන් හතර දෙනෙකුම සඳහන් කරන්නේ සමස්ථ සමාජයම එච්.අයි.වී.ආසාදනය වන ක්‍රම පිළිබඳව අවබෝධයක් නොමැති කම හේතුකොට ගෙන අදාළ ළමුන් පාසැලෙන් බහිෂ්කරණයට දැඩි හේතුවක් වන බවයි. වෛද්‍යවරුන් තුන්දෙනාම සාකච්ඡාව තුළදී දක්වා සිටින්නේ මෙම කාරණාවේ සත්‍යතාවයක් ඇති බවයි. එනම්, ඔවුන්ගෙන් ප්‍රතිකාර සඳහා යොමු වන බොහෝ පිරිස් ද එය ආසාදනය වන ක්‍රම පිළිබඳව අවබෝධයක් නොමැතිව සිටින බව අවබෝධ වූ බවයි. මෙය පාසැල් පද්ධතිය තුළට ද දැඩිසේ බලපෑම් සිදුකර ඇති කරුණක් වන බවද වෛද්‍යවරුන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවේදී අනාවරණය විය. එච්.අයි.වී. ආසාදිත දරුවා පාසැලෙන් ඉවත් කරන ලෙස බලපෑම් සිදුකරනු ලබන්නේ, අදාළ දරුවා තම දරුවන් සමඟ ආහාර ගැනීමට සෙල්ලම් කිරීමට හෝ වෙනත් සමාජීය සම්බන්ධතාවයක් සඳහා ඉඩ ලබා නොදීම හා අදාළ ළමයා පමණක් නොව පවුල ද පාසැල සමඟ ඇති සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කරමින් උද්ඝෝෂණය පවත්වන්නේ එච්.අයි.වී ආසාදනය වන ආකාරය පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිකම නිසා බව,තෝරාගත් විවිධ වයස් මට්ටම්, විවිධ අධ්‍යාපන මට්ටම් හා සමාජ මට්ටම් නියෝජනය කරමින් පාසැලට පැමිණෙන දරුවන්ගේ දෙමාපියන් පස් දෙනෙකුගෙන් හතර දෙනෙකු සමඟ සාකච්ඡා කිරීමේදී පැහැදිලි වූ කරුණකි.

මීට අමතරව පාසැල් බලධාරීන් වන කලාප අධ්‍යක්ෂකවරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, පාසැල් විදුහල්පතිවරුන්, අංශ භාර ගුරුවරුන් හා පන්ති භාර ගුරුවරුන්, ආදි ශිෂ්‍ය සංගම් ආදීන්ගෙන් ළමුන් විශාල වෙන් කොට සැලකීමකට පාසැල තුළදී ලක්වීම සිදුවේ. විශේෂයෙන්ම පන්ති භාර ගුරුවරුන් එච්.අයි. වී. ආසාදිත දරුවා පැසැලෙන් ඉවත් වන තුරු පන්තියේ ඉගැන්වීම් කටයුතු සඳහා නොපැමිණීම, ඉහත පාසැල් බලධාරීන්ගේ ද අනුදැනුම මත අදාළ ළමයා සඳහා පන්තියේ තනිව මේසයක් වෙන් කොට තැබීම, එම දරුවාගේ වතුර බෝතලය එල්ලා තැබීමට වෙනම ස්ථානයක් වෙන් කොට තැබීම, අනෙක් ළමුන් සමඟ සෙල්ලම් කිරීමට අවස්ථාව නොදීම, ආහාර ගැනීමට අවස්ථාව නොදීම, ළමයා ළමා නිවාස ගත කිරීමට අධ්‍යක්ෂවරුන් නිර්දේශ කිරීම, වෙනත් පාසැලක් ලබා දීමට අනුමැතිය ලබා නොදීම, ආදී කටයුතු සිදුකිරීම සිදු වන්නේ එච්.අයි.වී.ආසාදනය වන ආකාරයන් මෙන්ම, නවීන ආරක්ෂණ ක්‍රම, මෙන්ම, එච්.අයි.වී. ආසාදනයේ නව ප්‍රවණතාව පිළිබදව අවබෝධයන් නොමැති නිසා බව මැනවින් අවබෝධ වන කරුණකි. මීට අමතරව, එච්.අයි.වී ආසාදිතයන් සමඟ ජීවත්වන්නන්ගේ සංගමයේ සභාපති සමඟ කරුණු විමසීමේදී, ඇය කියා සිටින්නේද සමස්ත ප්‍රජාව තුළ ආසාදනය වන ක්‍රමන් පිළිබඳ ද අවබෝධයක් නොමැති බවයි. එවන් දරුවන් වෙනුවෙන් සිදුකරන සමාජ සත්කාරයක් ලෙස, තමා ආසාදිතයෙකු බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමින්, වෛද්‍යවරයෙකු සමඟ සිප වැළඳ ගැනීමෙන්, පොදුවේ ජලය පානය කිරීම පෙන්වමින් දැනුවත් කිරීම් සිදුකිරීමට සිදුව ඇත්තේ ප්‍රජාවට මෙය ප්‍රායෝගිකව ඒත්තු ගැන්වීමට බවත්, ආසාදනය වන ක්‍රම පිළිබඳව අවබෝධය සමාජය තුළ ඉතා අවම බැවින්, ළමුන් පාසැල තුලින් බහිෂ්කරණයට හේතු වී ඇති බවය. ඒ අනුව විග්‍රහ කිරීමේදී එච්.අයි.වී.

ආසාදිත දරුවෙකු පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා සමස්ත ප්‍රබල හේතුවක් වී ඇති බව පෙන්වා දිය හැක.

තවද, එච්.අයි.වී. ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා නීතිමය කරුණු පිළිබඳ දැනුවත් භාවයේ අඩු කම හේතුවනවා ද යන්න විශ්ලේශණය කිරීමේදී එච්.අයි.වී. ආසාදිත දරුවෙකුට හිමි අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් හා දැනුවත් භාවයක් නොමැති කම හා නීතිමය පසුබිම, දඬුවම් ආදිය පිළිබඳ අවබෝධයක් නොමැති කම හේතුවෙන් ළමුන් පාසැලෙන් බහිෂ්කරණය කිරීමේ වටපිටාවක් නිලධාරීන් විසින් නිර්මාණය කරනු ලබන අතර, ආසාදිත පවුල් වල සාමාජිකයින් ඒ පිළිබඳව නොදැනුවත් භාවය හේතුවෙන් ළමයාගේ අයිතිවාසිකම් අභියෝග කිරීමක්ද සිදු නොවන බව අවබෝධ වන කරුණකි. පාසැල් බලධාරීන් අනිවාර්ය අධ්‍යාපන අයිතිය පිළිබඳව, ළමයා අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයක් ඇතත්, සෞඛ්‍ය ප්‍රතිපත්ති, නඩු තීන්දු, පිළිබඳ අවබෝධය අවම වේ. පාසැලේ දෙමාපියන් තුළ සමස්ථයක් ලෙස දැනුවත් භාවය අවම වීම හේතුවෙන් ඔවුන් එච්.අයි.වී. ආසාදිත ළමයාට විරුද්ධව නැගී සිටීමට සංවිධාන ගත වේ. තීරණ ගැනීමේ මට්ටමේ සිටින, රාජ්‍ය බලධාරීන් ළමයා වෙනුවෙන් ඍජු තීරණ නොගැනීම හේතුවෙන් ළමයින් පාසැලෙන් බහිෂ්කරණය වීමට බලපා ඇති කරුණක් බව නිරීක්ෂණය වූ කරුණකි. මෙම කරුණ වඩාත් සනාථ කර ගැනීම සඳහා පාසැල් බලධාරීන් 5 දෙනෙකු, වෛද්‍යවරුන් තුන් දෙනෙකු, දෙමාපියන් 5 දෙනෙකු, හා ආසාදිත පවුල් පිළිබඳ සිදුකරන ලද සිද්ධි අධ්‍යයනයන් 10ක් සම්මුඛ සාකච්චාවන්ට භාජනය කිරීමේදී ප්‍රජාව අනිවාර්ය අධ්‍යාපන පණත පිළිබඳව අවබෝධයක් නොමැති බවය. ළමයා සතු අයිතිවාසිකම් පිළිබඳව, සෞඛ්‍ය ප්‍රතිපත්තීන් පිළිබඳව අවබෝධයක් ළමයාගේ අනිවාර්ය අධ්‍යාපනය පිළිබඳව ඇති නඩු තීන්දු පිළිබඳ අවබෝධයක් නොමැතිකම ළමයා පාසැල තුළින් බහිෂ්කරණයට බලපා ඇති ප්‍රබල හේතුවක් වන බවයි. ඒ අනුව, එච්.අයි.වී. ආසාදිත ළමයෙකු පාසැල තුළින් බහිෂ්කරණය වීම සඳහා ළමයින් සම්බන්ධ ඇති නීතිමය කරුණු පිළිබඳව අවබෝධය අඩු බව බලපා ඇති බව සනාථ වේ.

තවද, එච්.අයි.වී. ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය විම සඳහා සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක හේතු බලපාන බව විශ්ලේශණය කිරීමේදී එච්.අයි.වී. ආසාදිත දරුවෙකු පාසැලේ අධ්‍යාපනය ලැබීම පාසැලට අගෞරවයක් බව සිතීම හා නොසිතීම පිළිබඳව පාසැල් බලධාරීන්, වෛද්‍යවරුන්, දෙමාපියන් පස් දෙනෙකු, හා ආසාදිත පවුල් 10ක් සම්මුඛ සාකච්ඡාවට භාජනය කිරීමේදී පාසැල් බලධාරීන්ද, දෙමාපියන්ද, ආසාදිත පවුල් 10 කියා සිටින්නේ මෙවන් ළමයෙකු පාසැල තුළ තබා ගැනීම පාසැලේ ගෞරවයට විශාල කැළැලක් වන බවත්, පාසැලෙන් බොහෝ ළමුන් ප්‍රමාණයක් ඉවත්වීම සිදුවන බවත්, නව වසරේ ළමුන් පාසැලට භාර නොදීමටද හේතුවක් වනු ඇති බවයි.

එහෙත් එක් විදුහල්පතිවරයෙක් එම අදහස ප්‍රතික්ෂේප කරන ලදී. ඔහුගේ මතය වන්නේ ළමා අයිතීන් සුරක්ෂිත කිරීමේ පැතිකඩින් ගත් විට එය ගෞරවයක් බවයි. යථාර්ථය අවබෝධ කර ගනිමින් ළමයාට පාසැලේ සම අයිතීන් භුක්ති විඳිමින් අධ්‍යාපනයට අවස්ථාව සලසා දීම, බොහෝ අභියෝග ජයගත් අවස්ථාවක් වන බවත්, එය සමාජ ගෞරවයක් වන බවත්ය. දෙමාපියන් පස් දෙනාගෙන් හතර දෙනෙක් ම සඳහන් කරන්නේ තම දරුවා අධ්‍යාපනය ලබන පාසැලේ එච්.අයි.වී. ආසාදිත දරුවෙකු අධ්‍යාපනය ලැබීම සමාජ අගෞරවයක් බවයි. එයින් එක් දෙමාපියෙකු එම අදහස ප්‍රතික්ෂේප කර ඇත. ඔහුගේ මතය වන්නේ ළමයා කිසිදු කාරණාවකට වගකිව යුත්තෙක් නොවන බවයි. එබැවින් පාසැල තුල ළමයා තව තවත් සුරක්ෂිත කර යුතු බවය. එහෙත් එච්.අයි.වී. ආසාදිත පවුල් වල සාමාජිකයින් සෑම අවස්ථාවකදීම සිතන්නේ තමන් සමාජය තුළින් සෑම විටම ප්‍රතික්ෂේප වන බව හා තම දරුවෙකු පාසැලේ රඳවා ගැනීම පාසැලට අගෞරවයක් ලෙස දෙමාපියන්, පාසැල් බලධාරීන් සිතන බවය. ඒ අනුව මෙම කරුණ සමාජ, සංස්කෘතික කාරණාවක් ලෙස ද සමාජය තුළ ප්‍රතික්ෂේප වීමක් සිදුවන බව පෙන්වා දිය හැක.

අදාළ සමීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳ සාකච්ඡා කිරීමේදී අදාළ ළමයා එච්.අයි.වී. ආසාදිත බව පාසැලට නිරාවරණය වූ ආකාරය පිළිබඳ විග්‍රහ කිරීම සිදුකරන ලදී. සිද්ධි අධ්‍යයන සිදුකරන ලද පවුල් 10 අතරින් 04 දෙනෙකුගේම තත්ත්වය පාසැල වෙත නිරාවරණය වී ඇත්තේ ගමේ සේවය කරනු ලබන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා නිවස වෙත පැමිණීම හා ඔවුන්ගේ මැදිහත්කරණය හේතුවෙන් බවය. තවත් පවුල් 03ක් ප්‍රකාශ කොට සිටියේ තම දරුවා එච්.අයි.වී. ආසාදිත බව පාසැල වෙත නිරාවරණය වූයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් බවයි. එනම්, සමාජ ජාලා වෙබ් අඩවි තුළින් බවයි. අදාල සමීක්ෂණයට භාජනය වූ පවුල් 10න් පවුල් දෙකක් ප්‍රකාශ කර සිටියේ පාසැල වෙත නිරාවරණය වූයේ පවුලේ සාමාජිකයින්ගෙන් වන බවයි. මීට අමතරව පවුලක් දක්වා සිටියේ පාසැලට නිරාවරණය වූයේ එච්.අයි.වී. සමඟ ජීවත්වන්නන්ගේ සංගමයේ සාමාජිකයින් නිරන්තරයෙන් නිවසට පැමිණීම, ඔවුන් උදව් උපකාර කිරීම, ආදී කරුණු හේතුවෙන් බවය.

ඒ අනුව රාජ්‍ය නිලධාරීන් හා වගකිව යුතු පුද්ගලයින් විසින් මෙහි රහස්‍ය භාවය සුරකීම සිදු නොකිරීම හා වගකීමෙන් කටයුතු නොකිරීම හේතුවෙන් පාසැල තුළට අනාවරණය වී ළමයාගේ අනිවාර්ය අධ්‍යාපන අයිතිය උල්ලංගණය වීමට හේතුවක් වී ඇති බව නිගමනය වන කරුණකි.

එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා පාසැලේ සමවයස් කණ්ඩායම් වෙතින් / පාසැලේ දෙමාපියන් වෙතින් හා පාසැල් බලධාරීන් වෙතින් සිදු වු බලපෑම පිළිබඳ විශ්ලේශණය කිරීමේදී එච්.අයි.වී. ආසාදිත දරුවා පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා සමවයස් කණ්ඩායම් වල බලපෑමක් සිදු වී ඇති ද යන්න විමසීමේදී සිද්ධි අධ්‍යයන සඳහා යොදා ගනු ලැබූ පවුල් 10 අතරින් සියලු දෙනා කියා සිටියේ පවුල් 10 දරුවන්ට සම වයස් කණ්ඩායම් වල දරුවන්ගෙන් පන්ති කාමරයේ අනෙක් ළමුන්ගෙන් විශාල වශයෙන් වෙනස්කම් වලට භාජනය වීම හේතු වූ බවය. අනෙක් දරුවන් මෙම දරුවන් සමග කථා නොකිරීම, එක්ව ආහාර නොගැනීම, ආදිය හේතු වී ඇත. මීට අමතරව, පවුල් 10 සඳහාම එච්.අයි.වී. ආසාදිත දරුවා පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා පාසැලේ අනෙක් දරුවන්ගේ දෙමාපියන්ගෙන් බලපෑමක් සිදු වී ඇති බව අනාවරණය විය. තවද, පවුල් 08ක් සඳහා පාසැල් බලධාරීන්ගේ බලපෑම් වූ බවය. ඇතැම් ගුරුවරුන් මෙම දරුවා පන්ති කාමරයෙන් ඉවත් වන තුරු අනෙක් ළමුන්ටද ඉගැන්වීම් සිදුකිරීමට පන්ති කාමරයට නොපැමිණි බවයි. ගුරුවරයා විසින් ම සිතා මතා ළමයා වෙන් කොට තැබූ බවත්, අනෙක් ළමුන්ට ආහාරපාන පවා ගැනීම ප්‍රතික්ෂේප කිරීමට ගුරුවරුන්ද උපදෙස් ලබා දී ඇති අවස්ථා තිබූ බවයි. වෙනත් පාසැලකට ඇතුලත් කර ගැනීමට කලාප කාර්යාලයෙන් අනුමැතියක් පවා ලබා ගැනීමට නොහැකි වූ බවත්, ළමයා ළමා නිවාස ගත කිරීමටත් පාසැල් බලධාරීන් උත්සහ ගත් අවස්ථාවන් සිද්ධි අධ්‍යයනය තුළින් අනාවරණය විය. ඒ අනුව අවබෝධ වන්නේ එච්.අයි.වී. ආසාදිත දරුවෙකු පාසැලෙන් බහිෂ්කරණය සඳහා සමවයස් මිතුරු කණ්ඩායම් වලින් ළමයාට සිදුවන බලපෑම් හා වෙනස් කොට සැලකීම් මෙන්ම පාසැලේ අනෙක් දෙමාපියන්ගේ බලපෑම් ද පාසැල් බලධාරීන්ගේ ද ක්‍රියාකලාපයන් හේතු වී ඇති බව නිගමනය විය.

**සමාලෝචනය**

එච්.අයි.වී.ආසාදිත දරුවන් පාසලෙන් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන හේතු පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් සිදුකිරීමේදී මතු වූ ගැටළු හා සීමාවන් ද පෙන්වා දිය හැකිය. එනම්, මෙම සමීක්ෂණය සඳහා එච්.අයි.වී. ආසාදිත පවුල් 10 තෝරා ගනු ලැබුවේ එච්.අයි.වී. සමග ජීවත්වන්නන්ගේ සංගමයේ ලියාපදිංචි වූවන්ය. ඔවුන් දිවයින පුරා විහිදී ගිය ප්‍රදේශ වල ජීවත් වන්නන් බැවින් නිරන්තර හමුවී සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ප්‍රායෝගිකව අපහසු විය. ඇතැම් අවස්ථාවන් වලදී ඔවුන් දුරකථනය ඔස්සේ ද සම්බන්ධ කර ගැනීමට සිදුවිය. එහිදී සෑම අවස්ථාවකදීම සජීවී සම්මුඛ සාකච්ඡාව සිදුකිරීම ප්‍රායෝගිකව අපහසු විය.

මීට අමතරව මා මෙම තොරතුරු ගනු ලබන්නේ පර්යේෂණ අවශ්‍යතාවයක් ලෙස බවට පූර්ව දැනුවත් කිරීමක් සිදු කළ ද, ඔවුන් මා වෙතින් යම් ආර්ථික වාසි හෝ වරප්‍රසාදයන් සම්බන්ධ ඉල්ලීම් දිනා ගැනීමට උත්සහ දැරීමක් හා ඊට මැදිහත් වන ලෙස නිතර ඉල්ලා සිටීම සිදුවිය. මීට අමතරව, ඔවුන්ගේ ජීවිත කථාව ප්‍රකාශ කිරීමේදී අතිශය සංවේදී අවස්ථාවන්වලට මුහුණ දීම, බොහෝ වේලාවක් ඇඩීම සිදුවීම ද සිදුවූ ගැටළුකාරී තත්ත්වයන් විය.

ඒ සමගම අදාළ අධ්‍යයනය සිදුකිරීමේදී සීමාකම් සඳහා මුහුණ දීමට ද සිදුවිය. කිසිදු තොරතුරක් ලබා ගැනීම සඳහා කිසිදු බලපෑමක් සිදු නොකිරීම, එච්.අයි.වී. ආසාදිතයින් සිදුකරන කරන ලද ප්‍රකාශයන්හි සත්‍ය ,අසත්‍ය විභාගකිරීමකින් තොරව අධ්‍යයනය සඳහා උපයෝගී කර ගැනීම, එච්.අයි.වී. ආසාදිතයින් විසින් සඳහන් කරන නීති විරෝධී කාරණා එසේ සිදුකිරීම නීතියෙන් වරදක් ලෙස නිවරදි කිරිමට අවස්ථාවක් නොලැබීම. මෙහිදී පෙන්වා දිය හැක.

එහෙත්, එච්.අයි.වී. ආසාදිත පවුල්වල දරුවන් පාසැල තුලින් බහිෂ්කරණය වීම සඳහා බලපානු ලබන සමාජ විද්‍යාත්මක හේතු පිළිබඳ විග්‍රහ කිරීමේදී පහත කරුණු නිගමනය විය.

- එච්.අයි.වී.ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නන් හා රාජ්‍ය නිලධාරීන් ඍජු තීරණ නොගැනීම හේතුවක් වන බව.
- එච්.අයි.වී.ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා සම වයස් කණ්ඩායම්වල බලපෑම හේතුවක් වන බව.
- එච්.අයි.වී.ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා පාසැල් බලධාරීන්ගේ ක්‍රියාවන් හේතුවක් වන බව.

- එච්.අයි.වී. ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා මාධ්‍ය බලපෑම හේතුවක් වන බව.
- එච්.අයි.වී. ආසාදිත පවුල් වල දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සඳහා එච්.අයි.වී. ආසාධනය වන ක්‍රම හා එහි නව ප්‍රවණතා පිළිබඳව අවබෝධයක් නොමැතිවීම හේතු වන බව.
- එච්.අයි.වී. ආසාදිතයින් නීතිය පිළිබඳ දැනුමක් නොමැති බව.
- එච්.අයි.වී. ආසාදිතයින් ආසාදන රෝග පිළිබඳ දැනුමක් නොමැති බව.
- බලධාරීන් හා ප්‍රජාව ළමා හා එච්.අයි.වී. ආසාදන පිළිබඳ නීතිය පිළිබඳ දැනුම අවම බව. ආසාදිත පවුල් වල සාමාජිකයින් නීතිමය තත්ත්වය, ළමා අයිතීන් , පිළිබඳ පවුලේ සාමාජිකයින් දැනුවත් කිරීම.
- එබැවින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් ලෙස ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේදී පහත යෝජනා අධ්‍යයනය තුළින් පෙන්වා දිය හැක.
- එච්.අයි.වී. ආසාදිත දරුවන්ගේ අධ්‍යාපනය අයිතිය වෙනුවෙන් හඬක් නැගීමට බලගැන්වීම.
- නීතිය ඍජු ලෙස ක්‍රියාත්මක නොකරන හා ආචාර ධර්මවලට පටහැනිව ක්‍රියාකරන රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම.
- එවන් ක්‍රියාත්මක නොවීම් සම්බන්ධයෙන් දැනුම් දීම සඳහා ස්ථාපිත ආයතන පිළිබඳ දැනුවත් කිරීම. (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, 1929 ළමා උපකාරක දුරකථන සේවාව.....)
- ළමා ආරක්ෂක නිළධාරීන් පාසැල් දැනුවත් කිරීම් සිදුකිරීම. එහිදී එච්.අයි.වී. ආසාදිත ළමුන් සඳහා ඇති සම අයිතීන් පිළිබඳ දැනුවත් කිරීම.
- එච්.අයි.වී. ආසාධිත දරුවෙකු සම්බන්ධව පාසැල් බලධාරීන් ක්‍රියා කළ යුතු ආකාරය නීතිමය පසුබිම ඇතුළත් චක්‍රලේඛ මගින් දැනුවත් කිරීම.
- ළමා ආරක්ෂාව හා සමාජ සේවා හා රාජ්‍ය හා රාජ්‍ය නොවන නිළධාරීන් මෙන්ම, විවිධ මට්ටමේ ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගැටළු සහගත අන්දමින් මේ පිළිබඳව වාර්තා කිරීම් සිදුකරන වන මාධ්‍ය වාරණය කිරීම.
- ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දීප ව්‍යාප්ත වැඩසටහනක් පාසැල් "ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම" තුළ පාසැල් දරුවන්ගේ ආකල්ප සංවර්ධන වැඩසටහන් සඳහා වැඩි අවස්ථා ලබා දීම.

වර්තමානය වන විට එච්.අයි.වී. ආසාදිත දරුවන් පාසැලෙන් බහිෂ්කරණය වීම සම්බන්ධයෙන් විවිධ පාර්ශව අවධියෙන් සිටීම එම දරුවන් ලද එක්තරා අයුරක ජයග්‍රහණයක් ලෙස පෙන්වාදිය හැක. මෙහි ප්‍රධාන සංදිස්ථානයක් වනුයේ 2016.03.14 දින නිකුත් කරන ලද නියෝගයකි. එහි සඳහන්ව ඇත්තේ එච්.අයි.වී ආසාදිත දරුවෙකු වුවත්, එම දරුවාගේ පාසැල් අධ්‍යාපනය අයිතියක් කොට සලකා පාසැලක් ලබා දීම අනිවාර්ය බවය.

මීට අමතරව සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව වැනි ආයතන සමඟ ඒකාබද්ධව පාසැල් දරුවන් හා දෙමාපියන් වෙනුවෙන් ද, පාසැල් බලධාරීන් වෙනුවෙන් ද විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් නීතිමය තත්ත්වය හා ආසාදනය වන ක්‍රම පිළිබඳව අවබෝධයක් ලබා දීමට කටයුතු කරමින් පවතියි. එවැනි ළමුන්ට හෝ පවුල් වලට වෙනස් කොට සැලකීම සුදුසු නොවන බවත් විශේෂයෙන් ළමයා වරදකරුවෙකු නොවී දඬුවම් විඳීමට සිදුවීම අසාධාරණ බවත් පැහැදිලි කිරීම ළමා ආරක්ෂාව සම්බන්ධ වැඩසටහන් තුළ ප්‍රධාන මාතෘකාවක් කොට ගෙන දැනුවත් කිරීම් සිදුකරනු ලබයි. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් පවත්වනු ලබන විවිධ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ද මෙම මාතෘකාව පදනම් කර ගැනීම සිදුකරනු ලබන්නේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය හා වෙන්කොට සැලකීම අයිතිවාසිකම් තහවුරු කිරීමටය.

දරුවන් සියලු ආකාරයේ අපයෝජනවලින් ආරක්ෂා කරමින් සුන්දර ළමා වියක් හිමිකර දීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අපගේ වගකීමකි. එබැවින්, ළමයා කාගේද නොව කාගේ වුවද දරුවෙකු ලෙස සිතා අපගේ සමාජ වගකීම ඉටුකිරීමට වගකීමෙන් බැඳී සිටිමු.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


- පරිසරය හා සැමතැන වෙසෙන ළමුන් සුරැකීම සංවිධානය, 1994, ඒඩ්ස් මාරාන්තිකයි, ශ්‍රී ලංකා,
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,(2017), රහසක් නැත සත්‍ය කරුණු දැන ගනිමු,මිත්‍යාව දුරලමු, ලිංගිකත්වය ගැන දැන ගමු,
- සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව, (2016), ජාතික ඒඩ්ස් මර්ධන වැඩසටහන, වාණිජමය ලිංගික කටයුතු පිළිබඳ නීති සහ HIV/IDS වැළැක්වීම,

- 2016.03.14 දින එච්.අයි.වී. ආසාදිත දරුවෙකු පාසැලෙන් බහිෂ්කරනය නොකිරීම සම්බන්ධ නඩු වාර්තාව.
- **HIV & the right to education: Time to end the stigma, Daily mirror, April 4, 2018,**
- **Gary Pwormser, HIV AND AIDS a very short interdiction: 1998**
- **Sureshini pilapitiya, Chaos in Kurunegala over child's admission to a school, Daily mirror. 2016-03-05,**
- **Bennam science publication,Soluble factors mediating innate immune Pesponses to HIV infection, ,2008**
- **Daviad H spach Thomas hooten, The HIV manual: a guide to diagnosis and treatment, , 1996.**
- **By Susan Sontag AIDS and its Metaphors, 1989, www.hytimes.com**
- **Carol Rifka Brunt, Tell the Wolves I'm Home, 2012, www.penguinrandomhouse.com**
- **Eileen Stillwaggon, AIDS and the Ecology of Poverty, 2005, www.onlinelibrary.wiley.com**
- **http://www.google.com/search?q=hiv&client=firefobx-b&dcr=0&sourse=imms&bks& sa=x&ved=oabukew 2018.01.2612.30p.m to 3p.m**
- **Lawrence Schimel, Volando Cometas, April 2013. www.casadellibro.com**
- **Susan Hunter,AIDS in Asia : A continent in Peril,2004, www.goodreaders.com**

# ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වීඩියෝ සාක්ෂි ක්‍රියාවලිය තුළ මානව හා භෞතික සම්පත් භාවිතා වන ආකාරය පිළිබඳ අධ්‍යයනය

**කුමුදුමාලි මද්දුමගේ**

kumudumalie7@gmail.com

***සංක්ෂිප්තය***

මෙම සාක්ෂි ලබාගැනීමේ නෛතික ප්‍රතිපාදන සැලසී ඇත්තේ සාක්ෂි ආඥා පණතේ 1999 අංක 32 දරණ සාක්ෂි විශේෂ විධාන පණතෙහි 163 අ මගිනි. මෙම පණත මගින් ළමා සාක්ෂිකරුවෙකුගේ සම්මුඛ සාකච්ඡාවක් වීඩියෝ වාර්තාවක් නඩු කටයුත්තකදි සාක්ෂි ලෙස දීමට ප්‍රතිපාදන හඳුන්වා ඇත. එහිදී මෙකී වීඩියෝ පටිගත කරන ලද සම්මුඛ සාකච්ඡාව අදාල වනුයේ දණ්ඩ නීති සංග්‍රහයේ ළමා අපචාර හා සම්බන්ධ වන වැරදි වලට පමණකි. ළමා අපචාර හා සම්බන්ධ වරදක් යන්නෙන් දණ්ඩ නීති සංග්‍රහයේ වරදවල් දහයකට පමණක් මෙම සාක්ෂි ගැනීම සිදුකල හැකිය. 286අ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364, 365, 365අ හෝ 365ආ වගන්ති යටතේ වේ. ළමයා යන්නෙන් අවු 18 ට අඩු තැනැත්තෙක් ඉන් අදහස් වේ. අධිකරණ නියෝගයකට හා පොලිස් පණිවුඩ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් මෙම සාක්ෂි ගැනීම සිදුකරනු ලබයි.

**ප්‍රමුඛ පද**

වීඩියෝ සාක්ෂි, මානව සම්පත්, භෞතික සම්පත්, සාක්ෂි විධිවිධාන පණත, ළමා වින්දිතයා, ජූරිය, ළමා සාක්ෂිකරු, විනිසුරුවරයා, ද්‍රව්‍යමය සාක්ෂි, සම්මුඛ සාකච්ඡාව, විත්තියේ නීතිඥවරයා, සාක්ෂිකරු, අපරාධ නඩු විධාන සංග්‍රහ පනත

**හැඳින්වීම.**

වීඩියෝ සාක්ෂි පටිගත කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ආරම්භ කරන ලද්දේ 2001 වර්ෂයේ දීය. 1999 අංක 32 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, අපයෝජනයකට ගොදුරු වී ඇති දරුවෙකුගේ සාක්ෂිය වීඩියෝ පටිගත කිරීමටත් එය අධිකරණය වෙත ඉදිරිපත් කිරීමටත් ඉඩ සැලසේ. ඒ අනුව වීඩියෝ පටයට දරුවා දී ඇති සාක්ෂිය නැවත දීමක් අවශ්‍ය නොවේ. යෝග්‍ය පරිදි ළමයාගේ සාක්ෂිය පිළිබඳව ප්‍රශ්න කිරීමේ හි ඉඩ ප්‍රස්ථාව අධිකරණය භාරයේ රඳවා ඇත. හරස් ප්‍රශ්න ඇසීම සඳහා දරුවා අධිකරණයේ සිටිය යුතු වුවද වීඩියෝ පටයේ ප්‍රමාණවත් ලෙස ආවරණය කර ඇති සියලු කරුණු හරස් ප්‍රශ්න ඇසීමක් නොමැතිව අධිකරණයේ අභිමතය පරිදි අධිකරණයට පිළිගත හැකිය.

හැකි තරම් ඉක්මනින් ලැබුනු පැමිණිල්ලක් වීඩියෝ පටිගත කිරීම ළමයාට තම අත්දැකීම සම්බන්ධයෙන් වේදනාවෙන් නිදහස් වීමේ හැකියාව පවතී. තවදුරටත් තමා ලැබූ කටුක අත්දැකීම විස්තර සහිතව මතක තබාගෙන සිටිය යුතු නැත. තම කතාව පටිගත කර ඇති බැවින් ළමයාට නිදහසේ සුවපත් වීමට ද ඉඩ ලැබෙනු ඇත. තවද තමාට ලැබෙන සියලුම සාක්ෂි සත්‍ය හා නිවැරදි වීම විනිශ්චකරුට ඉතා වැදගත්ය. මෙහිදි විනිශ්චකරුට උපකාර කිරීම සඳහා මෙම සාක්ෂි අංඩගු වීඩියෝ පටය වැදගත් වේ.

ළමා වින්දිතයන්ගේ නඩු කටයුත්තක් සම්පූර්ණ කිරීමට අවුරුද්දකට වැඩි කාලයක් ගත වේ. මෙම ප්‍රමාදය ළමුන් කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. ඉතා ඉක්මන් පටිගත කිරීමක් තුළින් විනිශ්චකරුට හා ජූරියට පැමිණිල්ල කරන ආකාරයෙන්ම දරුවා මුණගැසෙන හෙයින් සිද්ධිය ගැන අවබෝධයක් ගත හැකිවේ. මෙම සජීවි පටිගත කිරීම මගින් තමා මුහුණදුන් අත්දැකිම දරුවාගේ මුහුණේ ඇතිවන හැඟිම හා කථාව වින්දිතයාගේ හඬින් පටිගත වේ. තවද මෙම සම්මුඛ සාකච්ඡාවක් අදාල වනුයේ වින්දිත ළමයාට පමණක් නොව යම් ළමා අපයෝජනයක් දුටු තවත් ළමයෙකු ගේ සාක්ෂියක් ද වීඩියෝ සම්මුඛ සාකච්ඡාවක් මගින් සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරිමේ ප්‍රතිපාදන නීතියේ පවතිනු ඇත. මෙම ක්‍රමවේදය තුලින් අධිකරණයට ක්‍රියාවලියට අඩුම වාර ගණනක් සහභාගි කරවන බැවින් එම ළමයා ද්විත්වින්දිත භාවයට පත්වීම අවස්ථා බොහෝ දුරට අඩුවේ. නවීනතම ක්‍රමයක් මගින් ශබ්ද හා රූප ආකාරයට මෙම සාක්ෂිය ලබාගැනීමේ ක්‍රියාවලිය සිදුවන බැවින් පසුකාලීනව සාක්ෂි පරස්පරවීම ළමයාට සිදුවන අගතිය වළක්වා ගැනීමට මෙමගින් හැකියාව ලැබේ. එමෙන්ම මෙම වීඩියෝ සාක්ෂිය අධිකරණයේ දෙනු ලබන ඍජු සාක්ෂියක් ලෙසද සැලකේ. ළමා අපරාධ නඩු බොහෝමයකට වින්දිත දරුවන්ගෙන් සාක්ෂි ලබාගැනීම විමර්ශනය කරනු ලබන පොලිස් ස්ථාන වලින් සිදුකරනු ලබයි. සාක්ෂි කරුවෙකුගෙන්

සාක්ෂි විමසීමේදි සාක්ෂි රීතියට අනුව සාක්ෂිය විමසනු ලැබේ. මහාධිකරණයේදී විභාගයට ගැනෙන විට සාක්ෂි ආඥා පණතට අනුව සාක්ෂි විමසීමේ ප්‍රධාන පියවර ත්‍රිත්වයක් වේ.

- ප්‍රධාන සාක්ෂි විමසිම මුලික ප්‍රශ්න ඇසීම 137 1 වගන්තියට අනුව. හරස් ප්‍රශ්න ඇසීම විත්තියේ නීතිඥවරයා විසින් සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිම 137 2 වගන්තිය.
- නැවත ප්‍රශ්න ඇසිම හරස් ප්‍රශ්ණ වලින් පසු සාක්ෂිකරු කැදවන පක්ෂය විසින් සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න නැගීමයි. 137 3 වගන්තියට ඉහත කී පියවර අනුපිළිවෙල සිදුවිය යුතු බව සාක්ෂි ආඥා පණතේ 138(1) වගන්තියේ දැක්වේ.

මුලික සාක්ෂියක් සේ ලේඛන පිළිබඳව සාක්ෂි දීම සාක්ෂි ආඥා පණතේ 144 වන වගන්තියට අනුකූල විය යුතුය. නඩු භාණ්ඩයක් හෙවත් ද්‍රව්‍යමය සාක්ෂි ඉදිරිපත් කරන (Materiyal Evidence) අනු පිළිවෙලට මෙම සාක්ෂි පටය ද හඳුනාගැනීමට සාක්ෂි පටිගත කිරීමේ ක්‍රියාවලියට දායක වු නිළධාරින්ගෙන් සම්මුඛ සාකච්ඡාකරුවන්ගෙන් හා තාක්ෂණික නිලධාරින් හා උපදේශන නිලධාරින් යන අයගෙන් රජයේ (සාක්ෂිකරුවන්ගෙන්) ප්‍රශ්න කරනු ඇත.

**අරමුණ**

**වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ක්‍රියාවලිය තුළ භෞතික හා මානව සම්පත් භාවිතා වන ආකාරය හා එම සම්පත් ප්‍රමාණවත් ද යන වග අධ්‍යයනය කිරීම**

මෙම ක්‍රියාවලියේදි **මානව සම්පත්** ලෙස මෙම සාක්ෂි පටිගත කිරිමට දායක වන තාක්ෂණික නිලධාරින්, සම්මුඛ සාකච්ඡාකරුවන්, උපදේශන නිලධාරින්, විමර්ශන නිධාරින්, යතුරු ලියන පිටපත් සකසන්නා, සෝදුපත් බලන්නා, රජයේ නීතිඥවරු හා විත්තියේ නීතිඥ මහතුන්, විනිශ්චකාරවරුන් හැඳින්විය හැකිය.

එසේම **භෞතික සම්පත්** ලෙස ගුණාත්මක තත්වයේ මැදිරි, සාක්ෂි පටිගත කිරිමට යොදා ගන්නා කැමරා පද්ධතිය CCTV Camera, Recorder , DVD writer Protabal DVD Player. Digital projector, white screen, Sound Equipment (Speaker System) හැඳින්විය හැකිය.

**කාර්යක්ෂම හා ගුණාත්මක තත්වයේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා භෞතික හා මානව සම්පත් යොදාගත හැකි ආකාරය පිළිබඳව අධ්‍යනය කිරිම**

ලැබෙන පටිගත කිරීමේ ඉල්ලිම් වලට කඩිනමින් සාක්ෂි පටිගත කිරිම කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සක්‍රීය මැදිරි සේවයක් අවශ්‍ය වේ. මෙවැනි මැදිරි දෙකක් මේ වන විටත් අක්‍රීය තත්වයේ පවතී. එක් සාක්ෂි පටිගත කිරීමේ මැදිරියක තාක්ෂණික දෝෂයක් මතුවුවහොත් එය සකසා ගන්නා තෙක් විකල්ප මැදිරියක් නොමැති අතර එම මැදිරි ක්‍රියා කිරිමට පුහුණු සේවකයින් බඳවාගෙන නොතිබීම ද විමසිය යුතු කරුණකි. මෙලෙස බඳවාගන්නා නිලධාරින් මෙම විෂය සම්බන්ධයෙන් මනා විෂය දැනුමකින් යුක්ත විය යුතු අතර ඔවුන් මහාධිකරණයේ සාක්ෂිකරුවන් වනු ඇත.

**<u>පර්යේෂණ ක්‍රමවේදය</u>** - මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් පර්යේෂණ ක්‍රමවේද 02 ක් භාවිතා කිරීමට අපේක්ෂිතය.

- සම්මුඛ සාකච්ඡා
- සිද්ධි අධ්‍යයනය ක්‍රමය
- **ගුණාත්මක දත්ත භාවිතා කරනු ලබයි.**
- **ප්‍රාථමික හා ද්විතික දත්ත භාවිතා කරනු ලබයි.**
- **ද්විතීක දත්ත භාවිතා කිරීම සඳහා අණ පණත් ලිපිලේඛන භාවිතා කරයි.**

මෙම පර්යේෂණය මගින් මුලික සාක්ෂියක් ලෙස මහාධිකරණයේ පිළිගැනෙන මෙම වීඩියෝ සාක්ෂි ලබා ගැනීම සඳහා **භෞතික, මානව හා න්‍යායාත්මක සම්පත් වල අවශ්‍යතාවය පිළිබඳව** ගුණාත්මක දත්ත සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ මෙම ක්ෂේත්‍රයේ විවිධ පාර්ශව සමග සම්මුඛ සාකච්ඡා

පවත්වන අතර නාභිගත සම්මුඛ සාකච්ඡා හා කේද්‍රිය සම්මුඛ සාකච්ඡා විවිධ පාර්ශව සමග පැවැත්වීමට අපේක්ෂිතය. මෙහිදී මෙම ක්‍රමය මගින් ඇසට පෙනෙන දේ දැනෙන දේ මෙන්ම ඇහෙන දේ පිළිබඳව මනා අවබෝධයක් ගත හැකි වේ. මෙම සම්මුඛ සාකච්ජා සඳහා **ළමා රෝග විශේෂඥයන්, නීතිය, අධිකරණ වෛද්‍ය විද්‍යාව, මනෝවිද්‍යාව අංශයන් නියෝජනය කරන ප්‍රවීණයන් හා** පුහුණු සම්මුඛ සාකච්ජාකරුවන් සමග **සම්මුඛ සාකච්ජාවට ලක් කරන ලදී.**

**සිද්ධි අධ්‍යයන ක්‍රමය** භාවිතා කිරීමට අපේක්ෂිත අතර 2017 වර්ෂයේදී හා 2018 ජුලි මාසයේ මහාධිකරණයෙහි සාක්ෂි ලබාදීම් අවසන් කල හා ප්‍රක්ෂේපණය කිරීම් අවසන් වු නඩු පිළිබඳව 7 පිළිබඳව අධ්‍යයන කරනු ඇත. මෙම නඩු කටයුතු 7 සඳහා අවශ්‍ය ලේඛන මෙම පර්යේෂන මගින් අනාවරණය වේ.

- අධිකරණ නියෝග
- සාක්ෂි ලබාදීම් අවසන් කල නඩු වාර්තා හා වීඩියෝ සාක්ෂි පදනම්ව ලබා දුන් නඩු තීන්දු වල පුවත්පත් තීරු ලිපි
- මහාධිකරණයේදි ප්‍රක්ෂේපණ කටයුතු සිදු කරනු ලබන රූපසටහන්

## ප්‍රතිඵල හා සාකච්ජාව

මෙම ක්‍රියාවලිය සාර්ථක කරගැනීම උදෙසා ඉහත භෞතික හා මානව සම්පත්වල ගුණාත්මකභාවය කාර්යක්ෂමතාවය වර්ධනය කරලීමට අමතරව වෙනත් අදහස් යෝජනා තිබේනම් ඒවා කවරේද? යන්නට සමරයක් ලෙස ගත් කල මෙම ප්‍රවීණයන් පැවසුවේ,

- සේවක බඳවා ගැනීමට අවශ්‍ය කාඩර් පත්‍රිකා අනුමත කරගැනීම.
- ඒ සම්බන්ධ පසු විපරම් කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පරිපාලනය අංශය විසින් පිරික්සීම.
- භාවිතයට නොගන්නා මැදිරි භාවිතයට ගැනීම.
- නීතිපති දෙපාර්තුමේන්තුවේ රජයේ අධිනීතිඥයින් මෙම සාක්ෂි මෙහෙයවීමේ ක්‍රමවේදය ගැන නිසි පුහුණුවක් ලබාදීම.
- මහාධිකරණ වෙත රජයේ නීතිඥයින් දෙදෙනෙකු වත් අනුයුක්ත කිරීම.
- සාක්ෂි ලබා දීම සඳහා යන දායක වු නිළධාරින්ට සුබසාධන වැඩ පිළිවෙලක් සැකසීම.
- ගාල්ල හා රාගම ඇති මැදිරිය සඳහා සේවකයන් බඳවා ගැනීමේ දී එම ප්‍රදේශය ආවරණය වන පරිදි නිලධාරින් බඳවා ගැනීම යෝග්‍ය බව.
- මහාධිකරණයන්හි සාක්ෂි පෙන්වීම සඳහා තාක්ෂණික තත්වය දියුණු කරන මෙවලම් මහාධිකරණයන් හි ස්ථාපිත කිරීම.
- විත්ති පක්ෂයට මෙම සාක්ෂි ලබාගැනීමේ විධිමත් ක්‍රමවේදයක අවශ්‍යතාවය.
- පුහුණු වීම් ලබා ඇති සහතික පත්ලාභි පුහුණු සාකච්ජාකරුවන් වෙනත් ස්ථානවලට අනුයුක්ත කිරීම් අවම කිරීම් කළ යුතු අතර ඔවුනට යම් සුබසාධන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම.
- ඉතා දුර බැහැර සිට පැමිණෙන වින්දිත දරුවන් සඳහා සුරක්ෂිතව වාහන පහසුකම් සැපයිම.
- සාක්ෂි ගැනීමට පැමිණෙන වින්දිත දරුවන් රදවා තැබීමේ රාත්‍රි සුරැකුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරිම.
- වින්දිත දරුවන් සඳහා විධිමත් සුබසාධන වැඩ පිළිවෙලක් ස්ථාපිත කළ යුතුයි.
- වින්දිත දරුවන් සමග සාක්ෂි මෙහෙයවීම සඳහා පුහුණු සාකච්ඡාකරුවන්ගේ ස්ථිරව බඳවාගැනීම හෝ අනුයුක්ත කරගැනීම.
- සාක්ෂි පටිගත කිරීම් හා සම්බන්ධීකරණ කටයුතුවලට දායක වන නිලධාරීන් සඳහා දිවිරුම් ප්‍රකාශ සකස්කර අධිකරණ වෙත යැවීම.
- වසරකට සාක්ෂි පටිගත කිරීම් සියයක් ඉක්මවා පටිගත කිරීම් සිදුකරන අතර මෙම පටිගත

කිරීම් සියල්ල ගබඩාකර තැබීමේ ඉඩ පහසුකම් ස්ථාපිත කිරීම.

- අවම වශයෙන් වසර 5 ඇතුළත දී වත් මෙම ළමා වින්දිතයන්ගේ විඩියෝ සාක්ෂි ලබාගත් නඩු කටයුතු අවසන් වන්නේ නම් එය වින්දිත දරුවාට හා සෙසු සියලු සාක්ෂි ලබා ගැනීමට හා සංරක්ෂණය කරන ආයතනයන්ටත් වඩා පහසු කරුණක් වේ.
- මෙම වින්දිත දරුවන්ගේ සාක්ෂි පටිගත කිරීම් වලට දායක වූ නිලධාරින් රජයේ නිසැක සාක්ෂිකරුවන් වේ. මහාධිකරණයේ සාක්ෂි දීම සඳහා කඩිනම් දින ලබා දීම් සිදු කිරීම.
- යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයේ ඇති විවිධාකාර ගැටලු අවම කිරීම.

**සමාලෝචනය-**

මෙහි සමාලෝචනය වශයෙන් න්‍යායාත්මක හා ප්‍රායෝගික වැදගත්කම යනුවෙන් කොටස් දෙකකට වෙන් කල හැකිය. **න්‍යායාතමක වැදගත් වන්නේ** මෙම විෂය පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයක් සිදු කර නැති බැවින් මෙම විෂය ක්ෂේත්‍රයට මෙම පර්යේෂණය මඟින් නව දැනුමක් එක්වේ.

**ප්‍රයෝගික වැදගත් වනුයේ** - ප්‍රතිපත්ති සම්පාදකයන්ට, නීති අංශවල කෙටුම්පත් සකසන්නන්ට, හා නීති සකසන්නට, මෙම දැනුම පාදක කරගනිමින් මානව හා භෞතික සුබ සාධන පහසුකම් ගුණාත්මකව සපයමින් ලංකාවේ වින්දිත දරුවන්ගේ යුක්තිය පසිඳලීම සඳහා මෙම ක්‍රියාවලිය විධිමත්ව සකස් කරගැනීමට මැදිහත් වීමයි.

# A comprehensive study on awareness of the public on laws in Sri Lanka of social media news reporting on child related cases

**Sachini Gayanika Weeraman**
sachini.media14@gmail.com

***Abstract:***

Public awareness is the most important fact that can prevent the child abuse of any country. According to 1998 No 50 Act of National Child Protection Authority have the legal authority to aware public related to the child. Social media is improving many ways in a small time period and the public needed to be aware about the facts that been upgrade and what are the laws that they needed to follow when they publish something as the social media news reporting. Public needed to be aware about the legal mechanism of our country so they can use those laws against the people who is using innocent child's life for their welfare. According to the data of the National Child Protection Authority, it indicate that Child abuse is increasing day by day in Sri Lanka. The media also provides significant media coverage of child abuse. Although reporting on cases of child abuse by media is not standardized as a whole. This is clearly a problem. In particular, there is an issue that there is no discipline that should be kept in the news reports on child abuse. Social media news reports in the identity of the children as well as the suspects is a big issue. The purpose of this research is to find out the public awareness of Sri Lankan law of social media news reporting on child related cases. There fore, the aim is to examine effectiveness of the law of the publishing, exhibiting and promoting the child related cases in social media news reporting of Sri Lanka.

**Key words**

Child, Child Abuse, Internet, Awareness, News Reporting.

## Introduction

Today, the internet becomes more popular among the public and the public need to be aware about the new trends to protect themselves and their children's lives. Especially in social media news reporting the child related cases are not standardized as a whole. This is clearly a problem that the public need to be aware of and the Government Authorities have the responsibility of strengthening the present law to make the public aware about the legal mechanism.

There are several sociological and legal definitions for the child. These approaches are primarily based on the relationship between the individual's ages. According to Article 1 of the United Nation Convention on the Rights of the Child (UNCRC) a person under eighteen is called a child. *(https://downloads.unicef.org.uk/wpcontent/uploads/2010/05/UNCRC_united_nations_convention_on_the_rights_of_the_child.pdf)*. In 1991 Sri Lanka also joined hands with the United Nations children's rights charter (UNCRC) to take measures to deal with the short-term and long-term adverse effects of child abuse from childhood and the various violence and brutality of children. *(https://www.unicef.org/srilanka/activities_8925.htm)*

However, there is a rapid increase in numerical abuse or reporting of the number of complaints received by the National Child Protection Authority, the leading government body that operates in Sri Lanka for child protection. In the year 2017, the number of child abuse cases reported to the National Child Protection Authority was 9014 while the highest number of complaints were reported with regard to the Cruelty against children, which is 2144. There have been 501 cases of sexual harassment and 1324 complaints which have been received regarding non-compulsory education. (http://www.childprotection.gov.lk/data_notice/2017%20NCPA%20Data.pdf)

"The challenge for those involved in child welfare and child protection then, is to make greater efforts to understand media influences and to use the media constructively, while a partnership of equals with some sections of the media may be impossible, a more active partnership is essential if the complexities of child abuse and child protection are to be responsibly debated and appropriate goals are to be set. The latest revolution in communications suggests that the media's influence on child abuse and child protection may change but is unlikely to diminish". Goddard and Liddell (1995)

Media plays a major role in preventing child abuse in our country. Media can be categorized into two major categories as print media and electronic media. Newspapers, books, magazines, handouts, etc. can be defined as print media and television, radio, Cinema, Internet, etc. can be defined as electronic media. Especially television, radio and newspapers are the closest possible medium to the public. The closest section of the media from all these media is the "news" reporting.

Today, the internet is also becoming more and more popular with the masses. Of course, this media can play a major role in preventing child abuse in the country. Overall, there are reports of cases of child abuse only through the media. The media institutions are also reporting these incidents. The internet is gradually being blown up in this state of affairs, but there are no significant steps taken to prevent child abuse in our country. (Gunasekara, H.D.E. 2016. *The role of the journalist in the reporting of child abuse (Sinhala))* There are many news websites in Sri Lanka. For example, http://www.adaderana.lk/, http://www.hirunews.lk/, http://newsfirst.lk/english/ are some of the famous news websites. These websites are only responsible for reporting child abuse cases. That is, when sexual abuse occurs, it reports information from beginning to end. However, there will not be a reason for such an inquiry, or there will be no awareness of such things. It is a regrettable fact that it is now rare to publish news, in the event that the identity of the child is revealed.

Public awareness is the most important fact that can prevent child abuse in any country. (https://www.dailynews.lk/2018/05/23/features/151710/child-abuse-and-neglect-preventable)
According to Section 14 (d) of 1998 No 50 Act of the National Child Protection Authority have the legal authority to make the public aware in relation to the child protection and methods of preventing abuse.

Social media is improving in many ways and the public need to be aware about the facts that have been upgraded and the laws that they need to follow when publishing something as the social media news reporting. The public need to be aware about the legal mechanism of our country in order to use those laws against the people who missed using an innocent child's life for their prosperity.

The purpose of this research was to find out the public awareness of Sri Lankan law of social media news reporting on child related cases. To identify the nature of child abuse and the affects from social media news reporting, study the legal background of publishing, exhibiting and promoting the child related cases in social media and investigate the possibility of Social Media to promote the laws to the public and prevent damage towards the victimized children are the key objectives of this research.

Four research methods were used in collecting data for this study. They were literature review, questionnaires, interviews and observations made on the social media websites. In gathering data through questionnaires, 50 individuals between 16 and 60 years were randomly consulted,

representing both genders equally. Individuals representing three social strata as school children, university students, common public constituted this sample.

Combining the data collected through these approaches, attempts were made throughout the study to establish the hypothesis while achieving the main objective and the subordinate objectives. Consequently, the conclusion derived by establishing the hypothesis was that the present law is applicable with the new trends of the social media news reporting and but the Government Mechanism needed to be strong to control media reports related to child abuse cases in Sri Lanka. It was observed with the usage of Social Media News Reporting pages and also with literature review.

According to the Penal Code of Sri Lanka there are special laws that have been mentioned under the obscene publication, exhibition relating to children. These laws have been amended from time to time. The Act was adopted in 1883. There were two amendments carried out as Penal Code (Amendment) Act, No. 22 of 1993, Penal Code (Amendment) Act, No. 16 of 2006. Below is the special section under Section 286 A of the Penal Code to prevent damage towards children when Publishing, Exhibiting and Promoting Child Related Information. In 1995, the Penal code was amended to include that sexual acts involving minors under the age of consent which is 16 to be tried under the offence of statutory rape or, under Article 365 of the Penal code which defines unnatural sex acts and grave abuse. Nonetheless, delays in legal proceedings, lack of witness protection and lack of assistance to victims are discouraging victims and victims' families from reporting such crimes (UNICEF, 1995).
This research can be used as the tool to implement the laws and the policy makers can standardize the present policies of social media news reporting on child abuse in Sri Lanka. Also by creating a public dialogue it can prevent child abuse and the children of our nation will be the benefited from it. Accordingly, conducting research in this topic is of timely need and of timely relevance.

## Objectives

The purpose of this research is to find out the public awareness of Sri Lankan law of social media news reporting on child related cases. Their aim is to examine the effectiveness of the law of publishing, exhibiting and promoting the child related cases in social media news reporting of Sri Lanka.

Objectives are,

- To understand the nature of child abuse and affects from social media news reporting.
- Study the legal background of publishing, exhibiting and promoting the child related cases in social media of Sri Lanka.
- Investigate the possibility of Social Media to promote the law of publishing, exhibiting and promoting the child related cases which can make the public aware and prevent damage towards the victimized children.

## Significance of the Research

Reporting of the Child abuse continues to increase in Sri Lanka although the media provides significant media coverage of child sexual abuse cases which is clearly a big problem. (Year 2014 Total Number of Complaints received by National Child Protection Authority was 10315 and Year 2014 Total Number of Complaints received by National Child Protection Authority

was 10732) (http://www.childprotection.gov.lk/?page_id=2211) Today, the Social media is rapidly expanding in Sri Lanka. (https://gs.statcounter.com/social-media-stats/all/sri-lanka) Information on child abuse is also reported online. This research has been made through observing most famous Social Media News Reporting pages of the Facebook and Twitter. These pages are used by many consumers in the country for advertising, and to obtain other information. But these pages need to be standardised according to the present laws of our Country.

The Sri Lankan Government had the authority of banning all social media activities for more than two weeks in March 2018. *Sri Lanka blocks Facebook, social media, amid riots* (http://www.hurriyetdailynews.com/sri-lanka-blocks-facebook-social-media-amid-riots-128385). According to this article Telecommunications Regulatory Commission of Sri Lanka banned the public with access to Facebook and suspended internet services due to riots which took place in the Central District. The public were accused of using social media to spread anti-Muslim sentiment.

The research involves looking for legal mechanism in Sri Lanka for Social Media News Reporting on children to protect themselves from child sexual abuse, as well as the ability of promoting these laws among the public which can contribute to the protection of children from such abuse.

## Methodology

Quantitative research method have been used in collecting data for this study of "A comprehensive study on awareness of the public about the laws in Sri Lanka of social media news reporting on child related cases." In gathering data through questionnaires, 50 individuals between 16 and 60 years were randomly consulted, representing both genders equally. Individuals representing five social strata as school children, university students, common public constituted this sample.

## Discussion

Questionnaire method is the Qualitative Research method that is commonly used by most researchers. In this study, the questionnaire method was also used. The questionnaire consisted of 09 questions used for 50 people in between the ages of 16 to 60 years.

The First and Second Question is focused on the Gender and the Age Group. The age considered of the questionnaire was between 14 and 65 years, which represented both genders equally with 25 Female and 25 Male persons, who participated to answer these questions. Second question in the Questionnere for was about the recipient's age. Of these, 16 were 16-20 years old, 15 were aged 21-30, and another 10 were between 31-40 years of age. No. of 06 were between the ages of 41-50 and 03 of were between the ages of 51-60 years.
Third question was designed to identify the Nationality of the participants and 48 respondents were Sri Lankans and 01 respondent was an Australian and 01 was an Indian. When selecting the participants for this research, the Nationality was highly considered as this was research topic was to find out the awareness of Sri Lankan public about the Social Media News Reporting.

Forth question was to find out the usage of Social Media. 20 of participants were using Social Media Daily, 03 of the participants were using Social Media Once a Day, 02 of the participants

were using Social Media Once a week, 23 of the participants were using Social Media Not always Catagory, but it depends and 02 of the participants were not using Social Media at all.

Fifth question was about to find out that Social Media News Reporting Could Affect a Child's Life. No. of 36 Participants answered "Yes" and 14 answered "No". Sixth question was about to find out Public awareness of Sri Lankan Law related to publishing, exhibiting and promoting the child related articles. For this question 10 of the Participants said "Yes" and 40 said "No".

Seventh question was about the present Sri Lankan Law which is applicable to prevent Child Abuse Cases related to Social Media News Reporting. For this question 10 participants said "Yes" and 10 said "No". Also 30 Participants were chosen to answer as "other". Most of these "Other" participants commented that the public need to be aware about the present law of News Reporting in Social Media and also the Government needs to strengthen the present law and keep the public aware about it.

Eighth question was to find out public reaction towards Social Media News reporting that violently exhibit the identity of the victimized child. For this question 06 of the participants answered as "Share that post" but 04 of them commented that their intention is to make the public aware about this news and not to cause harm towards the victim. 08 of them answered as "Do nothing and Ignore the Post", 06 of the participants answered as "Report that Post to Facebook", 05 of them "Call 119 or 1929 and inform Police or the Cyber Survelance unit of NCPA to take action immediately" and 08 of them answered as "Other" and commented "They will inform Sri Lankan CERT and Ministry of Mass Media of Sri Lanka". 10 of them ignored to give their answer to above question.

Ninth and the Final Question was to find out the possibility of Social Media News Reporting which can be used as tool to prevent Child abuse in Sri Lanka. 35 of the participants answered as "Yes" and 14 of the participants said "No" and 01 one of the Participant selected to answer as "Other" and commented as "There is a possibility of preventing Child Abuse by using Social Media News Reporting but the public needs to be well-educated about how to use Social Media Correctly".




**Is there a possibility to aware public through Social Media to prevent Child Abuse in Sri Lanka**

### Conclusion and Recommendations

I started this research was implemented with the intention of finding out the fact that there is a possibility of raising the awareness of the public on the laws in Sri Lanka of social media news reporting on child related cases which can prevent damage towards the victimized child.

Especially, in social media news reporting the child related cases are not standardized as a whole. By analyzing the information gathered from the interview sessions with the field experts and the Questionnaire that has been distributed among the public, the Legal Mechanism is needed to upgrade and also make the public aware about the present law which has not been improved within the time frame. Government Authorities have the responsibility of strengthening the present law and make the public about the legal mechanism. Also the Law Enforcement of Sri Lanka needs to be implemented within a time frame.

While acknowledging that the Social media news report's portrayal of child abuse and child protection can have negative consequences for children and their families, but in the same time it is argued that media coverage is vital if public concern for children is to remain on the political agenda, and if child protection services are to remain accountable.

Often, news reports feature child abuse stories prominently and regularly, although there were significant variations, both in style and content between Sinhala, Tamil and English Social Media pages on account of different market segments they cater to. Whilst the press releases of traditional media often sensationalize child abuse, discourse in Social Media news reports use more appropriate articulation. Thus, it is evident that both women and girls are not given their due honour, respect and privacy.

In conclusion, it may be stated that the Consultants have taken a 360 Degree approach to the topic, thereby making the report both comprehensive and highly informative and also by awaring public about the present law can be heavily impact on creating child protective environment in Social Media News reporting.

**References**


- Amarasingha Saman, Shresthra Govinda. 2001. *Perspective of internet use in Sri Lanka*: University of Cornell, USA.
- Amarasuruya, Harini. 2010. *Guardians of Childhood: State, Class and Morality in a Sri Lankan Bureaucracy:* PhD. The University of Edinburgh and Queen Margaret University
- Croteav David, Willum Hoynes. 2003. *Media and Society*: Pine Proge Press, USA
- Curran James. 2002. *Media and Power:* Routledge, London.
- De Silva, Harendra. 2000. *Child Abuse:* National Child Protection Authority, Sri Lanka.
- De Silva DG, Harendra and Hobbs CJ. 2000. *Child Abuse: A Manual for medical Officers in Sri Lanka*: The National Child Protection Authority of Sri Lanka.
- Gunasekara, H.D.E. 2016. *The role of the journalist in the reporting of child abuse (Sinhala)*: Published by author.
- Gunasekara, H.D.E. 2017. *Child molestation and related Sri Lankan law (Sinhala)*: Published by author.
- Gunasekara, H.D.E. 2017. *The Internet's ability to reduce child sexual abuse (Sinhala)*: Published by author.
- Gunasekara, H.D.E. 2017. *Tips for using the Internet (Sinhala):* Published by author.
- Hapuarachchi, Ajantha. 2017. *News and News Reporting:* Godage Publication.
- Rajapaksha, Daya Sri Narendra. 2013. *The Mass Media Regulatory (Sinhala)*: Susara Publication. ISBN 978-955-676-677-6
- National Child Protection Authority. 2012. *Reporting on Child Abuse:* National Child Protection Authority, Sri Lanka.

- National Children's Protection Authority Act: 1998, No. 50, Government Publication Bureau, Colombo 05.
- Sri Lanka Penal Code (Amendment) Act: No. 22, 1993, Government Publication Bureau, Colombo 05.
- Sri Lanka Penal Code (Amendment) Act: No. 29, 1998, Government Publication Bureau, Colombo 05.
- Sri Lanka Penal Code (Amendment) Act: No. 16, 2006, Government Publication Bureau, Colombo 05.
- UNISEF. 2003. *United Nations Convention on the Rights of the Child (UNCRC)*, Colombo.
- Wasike, Ben S. 2013. "Framing News in 140 Characters: How Social Media Editors the News and Interact with Audiences via Twitter" *Global Media Journal – Canadian Edition.* V6. I1 Pp. 5-23
- Weerasundara, Rajiv. "The impact of Social Media in Sri Lanka: issues and challenges in mental health" *Sri Lanka Journal of Psychiatry* Vol 5(1) June 2014

# ශ්‍රී ලංකාවේ ළමා අපයොජන වාර්තාකරණය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

පර්යේෂණ අධිකාරිය : ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

පර්යේෂණ ආයතනය : Businesscontact (PVT) LTD

**ඉදිරිපත් කිරීම : නෙරන්ද නුවන් චන්ද්‍රසේකර**

neranda.nc86@gmail.com

***සංක්ෂිප්තය***

ළමා අපයෝජන වැළැක්වීම, ළමයින් ආරක්ෂා කිරීම සහ අන් ළමුන් අතර සිටිනා එවැනි ලෙස අපයෝජනයට ලක් වූ ළමයින් ආරක්ෂා කිරීම, ඔවුන් හට අවශ්‍ය සත්කාර කිරීම වැනි කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකාණ්ඩුවට උපදෙස් ලබාදීම, ප්‍රතිපත්ති සැකසීම, නීති සැකසීම උදෙසා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 1998 අංක 50 දරන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කරගත් පනත යටතේ පිහිටුවා ගනු ලැබ ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (මෙතැන් සිට NCPA ලෙස හැඳින්වෙයි.) ගත වූ වසර ගණනාව තිස්සේ තම අධීක්ෂණයෙන් හඳුනාගෙන ඇති පරිදි, ලංකාවේ ජනමාධ්‍ය පොදුවේ තම ප්‍රවෘත්ති විකාශ තුළ ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ සිදුවීම් වාර්තා කර ඇත්තේ තම තමන්ගේ ප්‍රේක්ෂක පාඨක / ශ්‍රාවක පිරිස සතුටු කිරීමට හෝ ඔවුන් තම නාලිකාව සමග රඳවා ගැනීමටයි. ඒ අනුව, තම නාලිකාව හෝ පුවත්පත වෙළඳ දැන්වීම්කරුවන්ගේ තෝරාගැනීමක් ලෙස පවතින්නටයි. එහෙත්, ඔවුන්ගේ මේ ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය උක්ත ලෙස අපයෝජනය ට ලක් වූ ළමා වින්දිතයන්ට හා ඔවුන්ගේ පවුල්වල අයට බරපතල ලෙස සිත්තැවුල් ගෙන දෙන වාර්තා කිරීම් වී ඇත. හැමවිටෙකම මේ කියන ලද ලාභ උපරිමකරණය කිරීමේ පිළිවෙළ ජනමාධ්‍යයන්හි ප්‍රවෘත්ති හැඩ කරන ලද අතර, මෙවැනි සිදුවීම්වල වින්දියන්ගේ දුක්ඛිත මානසිකත්වය "සංවේදීකරණය" කිරීමේ චෝදනාවට හැමවිටෙකම ඉහත ජනමාධ්‍ය චෝදනා ලබා ඇත. එබැවින්, "ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන පිළිබඳ ජනමාධ්‍ය වාර්තා කිරීම" ගැන අධ්‍යයනයක් Businesscontact (Pvt) Ltd ඔස්සේ පැවැත්වීමට NCPA විසින් කටයුතු යොදනු ලැබිණි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ, "ළමා අපයෝජන පිළිබඳ ජනමාධ්‍ය වාර්තාකරණයේ ඇති දුර්වලතා හඳුනාගැනීම සහ එවැනි ජනමාධ්‍ය වාර්තාකරණයක් සඳහා සුදුසු ක්‍රමවේද යෝජනා කිරීම" යි. මෙම අධ්‍යයනය දකුණු ආසියානු කලාපයේම සිදුවූ මෙවැනි අධ්‍යයනයන්ගෙන් දෙවැන්න ලෙස සැලකිය හැකි අතර එවැනි පළමුවැන්න වූයේ, රොද්‍රිගු සහ ලියනගේ නමින් ඉදිරිපත් කෙරුණු, "ශ්‍රී ලංකාවේ ළමා අපහරණ සිදුවීම් පිළිබඳව ජනමාධ්‍ය වාර්තාකරණ නිරූපණය සහ ළමා අපයෝජනය සිදුවීම් දෙකක් ඇසුරින් එම ජනමාධ්‍ය ආවරණයෙන් සිදු වූ බලපෑම" - (2016) එම වාර්තාවෙන් උපුටා ගත් කොටස් ද මෙම ඉදිරිපත් කිරීමට ඇතුළත් ය.

අපරාධ ගොඩනැංවීමෙහි ලා සහ අපරාධ පිළිබඳව යුක්තිය පසිඳලීමේ ක්‍රමෝපාය කෙරෙහි වැදගත් කර්තව්‍යයක් ජනමාධ්‍ය මගින් ඉටුවෙයි. වින්දිතයන් පිළිබඳව සහ අපරාධකරුවන්, සමාජ අපගාමිකයන් සහ නීතිය ක්‍රියාත්මක කරවන නිලධාරීන් පිළිබඳව මහජන සංවේදීතාව බරපතල ලෙස තීරණය වන්නේ ඒ ඒ කොටස් පිළිබඳව ජනමාධ්‍යයේ පළවන තොරතුරු ඇසුරෙනි. ගවේෂණයේදී හෙළිවන්නේ, අපරාධ සහ යුක්තිය පසිඳලීම පිළිබඳව බහුතර ජනයාගේ දැනුම සම්පාදනය වන්නේ ජනමාධ්‍ය ඔස්සේ බවයි. පළමු ආණ්ඩුව ලෙස සලකන විධායකය, දෙවන ආණ්ඩුව ලෙස සලකන ව්‍යවස්ථාදායක හැරුණුකොට වැඩිපුරම මහජනයා වෙත බලපෑම ඇති දේ 'හතරවැනි ආණ්ඩුව' ලෙස නම් වී ඇති ජනමාධ්‍ය බවට සැලකෙයි. මේ බව රොද්‍රිගෝ Rodrigo (2016) හී ද දැක්වෙන පරිදි, මහජන මතය හටගන්නේ ජනමාධ්‍ය කෙරෙන් ය යන්නට ද අදාළව වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදී රටවල ජනමාධ්‍ය පාලනය කිරීමට හෝ ආණ්ඩු කිරීමට නීති ඇත්තේ නැත. එබැවින්, ජනමාධ්‍යය කෙරෙන් බලාපොරොත්තු වන්නේ, ඔවුනොවුන් විසින්ම සකසා ගනු ලැබූ ස්වයං නියාමනයක් ඔවුන්ගේ වෘත්තිමය ආයතන සංගම් ඇසුරෙන් සැකසී තිබිය යුතු බවයි. ශ්‍රී ලංකාවේ ඊට නිදසුන් ලෙස දැක්විය හැක්කේ, ප්‍රධාන සංස්කාරකවරුන්ගේ සංසදයයි. තවදුරටත්, ජනමාධ්‍යය අමාත්‍යාංශය 2007 දී යෝජනා කළ ජනමාධ්‍ය නීති සංග්‍රහයෙන් ද යෝජනා වී ඇති ළමයින්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ පෞද්ගලිකත්වය පිළිබඳ කරුණු ඉහත සඳහන් ප්‍රධාන සංස්කාරකවරුන්ගේ සංසදයේ ක්‍රියාකාරීත්වයෙන් ද ආවරණය වී ඇත.

කොටදෙණියාවේ සේයා සඳෙව්මි දැරියගේ ඝාතන සිදුවීම පිළිබඳ වූ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනය සහ ඒ මත පදනම් වූ මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය වාර්තා පිළිබඳව මාස හතරක ලේඛන අධ්‍යයනයක් මෙම අධ්‍යයන වාර්තාව සඳහා පදනම් වී ඇත. තවද, වින්දිතයන් සමගින් කරන ලද සම්මුඛ සාකච්ඡා ඔවුන්ගේ ඥාතීන්, නීති ආධාර කොමිසම, ජනමාධ්‍ය නියෝජිතයන් සහ නීති සහ වෛද්‍ය විශේෂඥයින් සමගින් කරන ලද සම්මුඛ සාකච්ඡාවල කරුණු මතද මෙම අධ්‍යයනය පදනම් වී ඇත.

ළමා අපයෝජන වාර්තාකරණයේදී දකින්නට ලැබෙන ප්‍රධාන දුර්වලතාව ලෙස ගෙනහැර දැක්විය හැක්කේ a. ජනමාධ්‍ය සඳහා නීති නොතිබීම. b. ප්‍රේක්ෂක / පාඨක / ශ්‍රාවක ජනයාගේ සංවේදීතාව කෙරෙන් ලබන ප්‍රමුඛතාව සහ ලාභය යන දේ යි.

**ප්‍රමුඛ පද**
අපයෝජන, වාර්තාකරණය, ජන මාධ්‍ය, මාධ්‍යවේදීන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

---

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් 2017 වසරේ මාර්තු 2 වන දින ඩේලි නිවුස් පුවත්පතේ පළ කළ දැන්වීමක් මගින් ළමා අපයෝජනය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය පිළිබඳ ඇගයීම් වාර්තාවක් සැකසීමට සුදුසු කණ්ඩායම්වලට ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමට ආරාධනා කරන ලදී. මෙසේ කරන ලද්දේ පූර්ව නිගමන මත සීමා මාධ්‍ය විසින් කරන ලද සාවද්‍ය වාර්තාකරණය සහ එවන සාවද්‍ය වාර්තා නිසා විපත පත්වූවාට, ඔහුගේ ඇයගේ පවුලේ සාමාජිකයන්ට ඇති අහිතකර බලපෑම නිසාය.

ළමා අපයෝජනය යන්නට ඕනෑම ආකාරයක ශාරීරික හා/හෝ මානසික හිරිහැරයක්, ලිංගික අපයෝජනයක්, නොසලකා හැරීමක් හෝ ශාරීරික හා/හෝ මානසික හානියක් වන වාණිජ සූරාකෑමක් අයත් වේ. (කොළඹගේ, දසනායක, හා වෛද්‍යරත්න 2005) ශ්‍රී ලංකා බන්ධනාගාර අධිකාරියට අනුව (2015), පුද්ගලයන් 28,391 ක් ළමා අපයෝජන චෝදනාවලට ලක්ව ඇති අතර, ඉන් 27,445 ක් (96.67%) පුරුෂයන් වන අතර, සම්පූර්ණ සංඛ්‍යාවෙන් 15, 872 ක් (57.83%) නැවත වරදකරුවන් බවට පත්වූවන්ය. "TME" ට අනුව (2013 අගෝස්තු 13), ''ශ්‍රී ලංකාව අනතුරුදායක ලෙස ළමා අපයෝජන වසංගතය අත්විඳිමින් සිටී'' මේ තත්ත්වය සමග කටයුතු කරන්නට ශ්‍රී ලංකාව සතු මෙවලම් බලවත් සේ අඩුපාඩු සහිත යැයි UNICEF (2015) පෙන්වා දී ඇත.

1998 පනත් අංක 50 යටතේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවනු ලැබුවේ. ළමා අපයෝජනය දුරු කිරීම පිළිබඳ ප්‍රතිපත්ති හා නීති සැකසීම පිළිබඳ උපදෙස් දීමටත් එවන් අපචාරවලට ගොදුරු වූ ළමුන් රැක ගැනීම හා ප්‍රතිකාර කිරීමත්, සියලුම වර්ගයේ ළමා අපයෝජනවලට එරෙහි කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීමත් යන අරමුණු සහිතව ය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ (NCPA) විවිධ කාර්යයන් අතර, "ළමා අපචාර හා ළමා ආරක්ෂණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම අනුග්‍රහය දීම හා සම්බන්ධීකරණය කිරීම" මූලික වන අතර මෙම පර්යේෂණ පැවරුම ද එම කාර්යයේ ප්‍රතිඵලයකි.

ගරු චන්ද්‍රානී බන්ඩාර, කාන්තා හා ළමා කටයුතු ඇමතිනිය 2030 වන විට ළමයින්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය නිමා කිරීමට අදාළ ජාතික ව්‍යාපාරය දියත් කරන ලදි. එමෙන්ම රජය ළමා ආරක්ෂණ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ සැලැස්ම නිමා කරමින් පවතින අතර ළමා ආරක්ෂාව, රැකබලා ගැනීම හා විකල්ප ළමා ආරක්ෂණය මගින්, ළමා (ආරක්ෂක අධිකාරිය) කෙටුම්පත් අවශ්‍ය සංශෝධන කිරීමට අවශ්‍ය සහාය වන ප්‍රතිපත්ති සම්පාදනය කරමින් ද පවතී. (ඩේලි නිවුස්, 2017 ජුනි 3, පි. 2)

එමගින් බලාපොරොත්තු වන්නේ, ළමා අපයෝජනය ගැන මාධ්‍ය වාර්තාකරණය ගැන අධ්‍යයනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍ය සඳහා ඵලදායී මාර්ගෝපදේශනයක් නිර්මාණය කිරීමට දායක වීමයි.

**අධ්‍යයනයේ අරමුණු :**

- මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ළමා අපයෝජන සිද්ධි වාර්තා කිරීමේ අඩුපාඩු හඳුනා ගැනීම හා එවැනි වාර්තා කිරීම්වලට සුදුසු ක්‍රමවේද යෝජනා කිරීමයි. මීට අමතරව සෙසු අරමුණුද කිහිපයක් වේ.
- ළමා අපයෝජන වාර්තා කිරීමට අදාළ නීති මාර්ගෝපදේශනය (අවධානයට ලක් විය යුතු කරුණු) හඳුනා ගැනීම.
- ළමා අපයෝජන වාර්තාකරණයේදී මාධ්‍ය භාවිත කරන ප්‍රචාරණ විධික්‍රම හඳුනා ගැනීම.
- මාධ්‍ය විසින් ළමා අපයෝජන වාර්තා කිරීමේ දී විපතට පත්වූවාට එමගින් අහිතකර බලපෑම් වී ඇති අවස්ථා හඳුනාගැනීම.
- ළමා අපයෝජනය පිළිබඳ මාධ්‍ය වාර්තා ප්‍රමිතිකරණය කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම.

## අධ්‍යයන ක්‍රමවේදය

මාතෘකාවට අදාළ සංඛ්‍යා ලේඛන රැස්කිරීම හා දත්ත හඳුනා ගැනීම මඟින් තීරණ ගැනීම පහසු කෙරේ. දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය ප්‍රාථමික දත්ත (සම්මුඛ සාකච්ඡා) හා ද්විතීයික දත්ත (ප්‍රකාශිත) රැස්කිරීම යන දෙ ආකාරයටම සිදු වේ. මේ අවස්ථාවේදී "සර්පිලාකාර පර්යේෂණ" මොඩලය (සොන්ඩර්ස් 2007) භාවිතා කරමින් ක්‍රමවේදය සකසාගෙන ඇත.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

මෙම තත්ත්ව පරීක්ෂණයට තෝරා ගනු ලැබූ මාධ්‍ය කෙසේ ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ වාර්තා කිරීම් කර ඇත් ද යන්න ගැඹුරින් සහ සමීපව විමසා බැලූ මෙම මාධ්‍ය උපදේශකයන් හට සොයා ගන්නට ලැබුණු තොරතුරු පහත සටහනෙහි දක්වෙයි. පහත තොරතුරු ස්වයං විස්තරාත්මකය.

### සටහන 01 - ප්‍රචාරණ උපායෝපක්‍රම

| පුවත්පත | ප්‍රකාශකයා | සංසරණය | භාෂාව | නිත්‍ය ප්‍රචාරණ උපායෝපක්‍රමය |
|---|---|---|---|---|
| අද<br>මව්බිම | විජය පුවත්පත්<br>සිලෝන් පුවත්පත් (පෞද්) සමාගම | 110,000<br>50,000 | සිංහල<br>සිංහල | සිංහල ප්‍රචාරක දැන්වීම් සහ රූපවාහිනී වෙළඳ දැන්වීම්, ප්‍රමුඛ වේලාවන්හිදී හෝ සිංහල ප්‍රවෘත්ති ප්‍රකාශය අතරතුර |
| රිවිර | රිවිර මීඩියා කෝපරේෂන් | 265,000 | | නැත. |
| ලංකාදීප | විජය පුවත්පත් සමාගම | 250,000 | සිංහල | වැඩියෙන්ම විකිණෙන සිංහල දිනපතා පුවත්පත, ප්‍රචාරණය අනවශ්‍ය බවයි අදහසය. |
| දිවයින | උපාලි පුවත්පත් සමාගම | 340,000 | සිංහල | පාඩු පිට පවත්වා ගෙන යන බැවින් ප්‍රචාරණයට ප්‍රතිපාදන නොයෙදෙයි |
| ඩේලි මිරර් | විජය පුවත්පත් සමාගම | 76,000 | ඉංග්‍රීසි | වැඩියෙන්ම විකිණෙන ඉංග්‍රීසි දිනපතා පුවත්පත ප්‍රචාරණය අනවශ්‍ය බවයි අදහස |
| සිලෝන් ටුඩේ | සිලෝන් (පෞද්) සමාගම | 25,000 | ඉංග්‍රීසි | ඉංග්‍රීසි ප්‍රචාරක දැන්වීම්, සිරස්තල සමඟ |
| දි අයිලන්ඩ් | උපාලි පුවත්පත් සමාගම | 70,000 | ඉංග්‍රීසි | පාඩුවට පවත්වා ගෙන යන බැවින් ප්‍රචාරණයට ප්‍රතිපාදන නොයෙදෙයි |
| වීරකේසරී | එක්ස්ප්‍රස් පුවත්පත් ලංකා (පෞද්) සමාගම | 140,000 | දෙමළ | දැන්වීම් පමණයි |
| තිනකරන් | ඇසෝසියේටඩ් පුවත්පත් ලංකා සමාගම | 50,000 | දෙමළ | දැන්වීම පමණයි |

සැ.යු. ඉහත තොරතුරු එම ප්‍රකාශකයන් වෙතින් සහ අන්තර්ජාලයෙන් ලබාගත් ඒවායි. දිනය 2017 ජුනි 30

### සටහන 02 - රූපවාහිනිය

| රූපවාහිනිය | සන්නිවේදකයා | භාෂාව | නිත්‍ය ප්‍රචාරක උපයෝපක්‍රම |
|---|---|---|---|
| ස්වර්ණවාහිනී | EAP සන්නිවේදන සමාගම | සිංහල | ප්‍රවෘත්ති සිරස්තල සහ වෙළඳදැන්වීම් |
| හිරු | ආසියා සන්නිවේදන සමාගම | සිංහල | ප්‍රවෘත්ති සිරස්තල සහ වෙළඳ දැන්වීම් |

### සටහන 03 - ගුවන්විදුලිය

| ගුවන්විදුලිය | සන්නිවේදකයා | භාෂාව | නිත්‍ය ප්‍රචාරක උපයෝපක්‍රම |
|---|---|---|---|
| හිරු | ආසියා සන්නිවේදන සමාගම | සිංහල | ප්‍රවෘත්ති සිරස්තල සහ වෙළඳදැන්වීම් |
| සිරස එෆ්. එම් | මහරාජා සන්නිවේදන ආයතනය | සිංහල | ප්‍රවෘත්ති සිරස්තල සහ වෙළඳ දැන්වීම් |

මෙකී තෝරාගත් මාධ්‍යය (මුද්‍රිත,රූපවාහිනී,ගුවන්විදුලිය) ඔවුන්ගේ ප්‍රවෘත්ති සිරස්තලවල හෝ දැන්වීම්වල ළමා අපයෝජනය වෙනස් කොට දක්වූවා යැයි සාධක නොමැති බව අප මාධ්‍ය උපදේශකයන් තහවුරු කොට ඇත.

හානිකර මාධ්‍ය වාර්තා කෙරෙන් වින්දිතයන්ට හා ඔවුන්ගේ පවුල්වල සමීපතමයන් හට ඇතිකරන බලපෑම පිළිබඳව මෙහිදී අවධානය යොමු කරන ලදි. සමස්තයක් ලෙස හානිකර සේයා සදෙව්මි සිදුවීමේ සැකකරුවන් පස්දෙනෙකු සිටියා. ඒ අය නම් වශයෙන් මෙසේයි. දිනේෂ් ප්‍රියශාන්ත හෙවත් කොණ්ඩයා, සුරන්ජිත් ප්‍රදීප් සෙනෙවිරත්න, කැලුම් අත්තනායක, උපුල් නිශාන්ත සහ ඉලංදාරී පේඩිගේ සමන් ජයලත්. මේ අය අතරින් ඉලංදාරී පේඩිගේ සමන් ජයලත් අපරාධයට වැරදිකරු වූ අතර ඔහු හට මරණ දඬුවම නියම වුණා. නිදහස් වූ අය අතරින්, දිනේෂ් ප්‍රියශාන්ත හෙවත් කොණ්ඩයා ගම හැර ගොස් ඇති අතර ඔහු ඉන්නා තැනක් කිසිවෙක් දන්නේ නැහැ. ඒ අතරම කියැවෙන්නේ, මත්ද්‍රව්‍ය චෝදනාවකට හසු කළ සුරන්ජිත් ප්‍රදීප් සෙනෙවිරත්න 17 හැවිරිදි පාසල් ශිෂ්‍යයා සහ ඔහුගේ මව ද ගම හැර ගොස් ඇති බවයි. අපගේ සොයාබැලීම්වලින් තහවුරු වුයේ, කොටදෙණියාව බඩල්ගම වෙත යළි යළිත් ගිය ගමන්වලින් පවා Business contact පිරිස හට ඔහු සොයා ගැනීමට නොහැකි බවයි.

ළමා අපයෝජන ගැන වාර්තා කිරීමේදී ඇති දුර්වලතා කිහිපයක් මෙහිදී හඳුනා ගන්නා ලදි. පැවැති විශ්ලේෂණ සහ සාකච්ඡා කෙරෙන් පැහැදිලි වන දෙයක් නම්, ප්‍රවෘත්ති සංවේදීකරණය කිරීම වෙනුවෙන් සහ ආචාර ධාර්මික නොවන වාර්තාකරණ නිසා පුද්ගලික මාධ්‍යය චෝදනා ලබනවා සහ ප්‍රශ්නාර්ථයකට ලක්ව සිටිනවා යන්නයි. තවද, අඩක් සත්‍යය තොරතුරු තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රචාරය කිරීම, වින්දිතයන්ගේ සහ ඥාතීන්ගේ අනන්‍යතා ආරක්ෂා කළ යුතු තැන්වලදී ඒවා හෙළිදරව් කිරීම වැනි දේ නිසා ද. අදහස් දැක්වීම, අඩමාන අදහස් ප්‍රකාශ කිරීම (හිතලු) සහ කාරණා, විනිශ්චයාත්මක අදහස් පළ කිරීම වැනි දේ නිසා ද, අපරාධය හා සම්බන්ධ අය හා වින්දිතයන් පීඩාවට පත් කිරීමෙන් තොරතුරු ලබා ගැනීම උත්සාහ කිරීම නිසාද මෙසේ සිදුවී ඇත. එපමණක් නොවෙයි. අවසරයකින් තොරව ඡායාරූප ගැනීම, වීඩියෝගත කිරීම, ලේ වැකුණු තොරතුරු අපරාධය පිළිබඳව පළ කිරීම, (උසාවියේ තොරතුරු වාර්තා කරන මුවාවෙන්) තමන් හොයන ස්ථානවල තොරතුරු තම මිතුරු මාධ්‍යවේදීන් වෙතින් අපරාධ ස්ථානවලට නොගොස්ම ලබා ගැනීම සහ අපරාධය ඇති පමණට වඩා පුම්බා දැක්වීම ද ඒ කරුණු අතර වෙයි.

